# කෘෂිකර්ම අමාත්‍යාංශය
# கமத்தொழில் அமைச்சு
# Ministry of Agriculture

## කාර්ය සාධන වාර්තාව
## செயலாற்றுகை அறிக்கை
## PERFORMANCE REPORT
## 2014




“ගොවිජන මන්දිරය”,
80/5, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

"கொவிஜன மந்திரய",
80/5, ரஜமல்வத்தை வீதி,
பத்தரமுல்லை.

“Govijana Mandiraya”,
80/5, Rajamalwatte Avenue,
Battaramulla, Sri Lanka.

# දැක්ම

**"ආහාර සුරක්ෂිතතාවය හා ජාතික සමෘද්ධිය උදෙසා කාර්යක්ෂම, ඵලදායී හා ශක්තිමත් කෘෂිකාර්මික අංශයක් "**

# මෙහෙවර

**"ස්වභාවික සම්පත් තිරසාර කළමණාකරණය තුළින් සමාජීය වශයෙන් පිළිගත් නව්‍ය හා වාණිජමය නැඹුරුවකින් යුතුව, ගෝලීය තරඟකාරී නිෂ්පාදනයන් බිහිකරන ව්‍යවසායකත්ව කෘෂිකර්මාන්තයක් සාක්ෂාත් කරගැනීම"**

# ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ පණිවුඩය

**2014** වර්ෂයේ කාර්ය සාධන වාර්තාව එළි දක්වන මොහොතේ, ප්‍රථමයෙන් රට සවිබල ගන්වන කෘෂිකාර්මික, අර්ථ රටාවකට මාවත විවර කිරීමේ යුග මෙහෙවරට දායකවීමට ලැබීම පිළිබඳව කෘෂිකර්ම අමාත්‍යවරයා ලෙස මම අතිශය සතුටට පත්වෙමි. කෘෂිකර්මයේ මහ ගෙදරවන් රජරට පුරවරයේ උපන් පුද්ගලයෙකු ලෙස රටේ කුසගිනි දුරු කරනට දිරිදෙන ගොවියා සුරකමින්, අතමිට සරු ජීවන රටාවක් හෙළිකර දීම කෘෂිකර්ම අමාත්‍යාංශයේ අරමුණයි.

ගොවියාගේ ගොවිකම අසරණකමක් ලෙස දකින සමාජ ආකල්පය අප විසින් වෙනස් කළ යුතු කාලය දැන් එළඹ තිබේ. මේ මොහොතේදී රටට අවශ්‍ය වන්නේ අතමිට සරු ශක්තිමත් ගොවි පරපුරක් බව අප විසින් වටහා ගත යුතුව ඇත. ඒ සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම කෘෂිකර්ම අමාත්‍යාංශයේ වගකීම බව විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මම දැඩිව විශ්වාස කරමි. ඒ අනුව ගොවි ප්‍රජාව වෙනුවෙන් මාගේ උපරිම දායකත්වය ලබා දීමට මා ඇතුළු කෘෂිකර්ම අමාත්‍යාංශයේ සියලු නිලධාරීන් කැප වී කටයුතු කිරීමට සූදානම්ය.

වගාව සඳහා අවශ්‍ය බිත්තර වී ඇතුළු රෝපණ ද්‍රව්‍ය ලබා දීම, පොහොර නිකුත් කිරීම ඇතුළු කෘෂිකර්මාන්තය හා සබැඳි කුඩා මහත් කටයුතු එකම අමාත්‍යාංශයක් යටතේ සිදු කළ හැකි වීම තුළ ගොවිප්‍රජාව මුහුණපාන ගැටළු පැහැදිලිව හඳුනා ගෙන කඩිනමින් ඒවාට ගතයුතු විසඳුම් ලබා දීමට හැකි වී තිබේ. කෘෂිකර්මාන්තයට අදාළ සියලු වගකීම් එක තැනකට ඒකරාශී වීම තුළ වඩා පහසුවෙන් තීන්දු තීරණ ගැනීමටත් එහි ප්‍රතිඵලයක් ලෙස අවශ්‍ය දේ, අවශ්‍ය මොහොතේදී ඉටුකිරීමට හැකිවීම මෙරට ගොවිජනතාව ලද සුවිශේෂී වරමක් සේම එය ගොවිතැන වෙනුවෙන් මෙහෙවරක් ඉටු කිරීමට මා ලද වරප්‍රසාදයකි.

දේශයේ පණනලවන් ගොවි දැතට දිරියක් වෙමින්, රටේ අස්වනු සරු කිරීමට කළයුතු දේ අනලස්ව සිදු කරමින් කෘෂිකර්මාන්තය තුළ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කිරීම කෘෂිකර්ම අමාත්‍යවරයා ලෙස මාගේ ඒකායන අපේක්ෂාවයි. එම අපේක්ෂාවන් සමඟ ගොවියාගේ සැබෑ උවමනාවන් ඉටු කරමින්, අතමිට සරු කෘෂි ආර්ථිකයක් වෙත මංපෙත් විවර කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන් අත්වැලක් වනු ඇති බව මම දැඩිව විශ්වාස කරමි. සියලු දෙනාගේ උපරිම කැපවීම සහ දායකත්වය සමඟ කෘෂි කර්මාන්තයෙන් රට සරුවන සෞභාග්‍යමත් අනාගතයක් බිහිවේවායි, මම ප්‍රාර්ථනා කරමි.

දුමින්ද දිසානායක
කෘෂිකර්ම අමාත්‍ය

# ගරු කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍යතුමියගේ පණිවුඩය

වර්තමානය වන විට අප මුහුණ දෙන ප්‍රධාන අභියෝගයන් අතර රසායනික පොහොර හා පළිබෝධ නාශක භාවිතය හේතුවෙන් මුහුණ දීමට සිදුව ඇති ව්‍යවසනය තුළින් ජනතාව මුදවා ගැනීම මූලික වන අතර එහි ප්‍රධාන වගකීම කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත පැවරී ඇත.

දිනෙන් දින වර්ධනය වන ජනගහනයට අනුව නිෂ්පාදනය වැඩි කිරීමත්, වරින් වර ඇතිවන කාලගුණික හා දේශගුණික විපර්යාස නිසා ඇතිවන ව්‍යවසනයන්ට මුහුණ දීමට හැකිවන පරිදි නවීන තාක්ෂණය, නව බීජ ප්‍රභේද යොදා ගැනීමත්, නව උපාය මාර්ග අනුගමනය කිරීමටත් කඩිනමින් යොමු විය යුතුව ඇත.

පාංශු සංරක්ෂණය, කාබනික පොහොර භාවිතය, පරිසර හිතකාමී පළිබෝධ නාශක, සුළු අපනයන බෝග වගාව ප්‍රවර්ධනය, ජල කළමනාකරණය, වාරි පද්ධතිය වැඩි දියුණු කිරීම, කෙටිකාලීන බෝග වර්ග හඳුන්වා දීම හා වැඩි අස්වැන්නක් ලබාගැනීම වැනි අංශ කෙරෙහිද මෙම අමාත්‍යාංශය වැඩි අවධානයක් යොමු කර ඇත්තෙමු.

ගෙවතු වගාවේ සිට මහා පරිමාණ ගොවිපළ දක්වා ජනතාව යොමු කරලීම තුළින් පරිභෝජනය කෙරෙහි පමණක් නොව දේශීය නිෂ්පාදන අපනයනය තුළින් විදේශ විනිමය ඉපයීම කෙරෙහිද තරුණ පරපුර කෘෂිකර්මාන්තය කෙරෙහි යොමුකර විරැකියාවට විසඳුමක් ලබාදීම සම්බන්ධයෙන්ද කඩිනම් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අප අමාත්‍යාංශයේ විශේෂ අවධානය යොමු වී ඇත.

මේ සියලු උත්සාහයන් තුළින් ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත රටක් බවට පත්කර ගැනීම උදෙසා කෘෂිකර්ම අමාත්‍යාංශය ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සාර්ථක කරගැනීමෙහිලා අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අනිකුත් සියලුම ආයතන මඟින් දක්වන දායකත්වය බෙහෙවින් අගය කරමි.

**වෛද්‍ය අනෝමා ගමගේ (පාර්ලිමේන්තු මන්ත්‍රී)**
**කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍ය**

# පෙරවදන

ශ්‍රී ලංකාව ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකම් කියනු ලබන රටකි. එම ප්‍රෞඩත්වයට ප්‍රමුඛතම දායකත්වය සපයන ලද්දේ කෘෂිකර්මාන්තයයි. එම අද්විතීය ක්ෂේත්‍රයේ වැදගත් බව තහවුරු කොට සංවර්ධනය කිරීමේ කාර්යභාරය හා වගකීම නව රජය මඟින් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත පවරා ඇත.

කෘෂිකර්මාන්තය මෙරට ජන ජීවිතය හා දැඩි බැඳීමක් පවතින අතර ඒ අනුව කෘෂිකාර්මික අංශය මඟින් මෙරට දළ දේශීය නිෂ්පාදිතයට 10% ක පමණ දායකත්වයක් සපයයි. එමෙන්ම දේශීය සේවා නියුක්තියෙන් 30% කට ආසන්න ප්‍රමාණයක් කෘෂිකර්මාන්තය ආශ්‍රිත රැකියාවන්හි නියුක්තව සිටී.

මෙරට පාලනය කළ සෑම රජයක්ම කෘෂිකර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා සුවිශේෂී අවධානයක් යොමු කරන ලදී. ඒ අනුව විවිධ වූ කෘෂිකාර්මික හා ගොවිජන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද්දේ දේශීය ආහාර සුරක්ෂිතතාවයත්, ජාතික සමෘද්ධියත් උදෙසා පරිපූර්ණ දායකත්වය ලබාදීමේ අරමුණු පෙරදැරිවය.

අනෙකුත් ක්ෂේත්‍රයන්ට සාපේක්ෂව කෘෂි ක්ෂේත්‍රයේ කාලගුණික, දේශගුණික ආදී පාරිසරික බලපෑම් මෙන්ම වෙනත් විවිධාකාර වූ බලපෑම් වලට සෘජුව මුහුණ දීමට සිදුව ඇත. එවැනි තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දෙමින් වර්තමානය වනවිට ඉහළ කෘෂිකාර්මික නිෂ්පාදනයක් වාර්තා කිරීමට හැකිවීම කෘෂිකාර්මික අංශයේ විශිෂ්ට ජයග්‍රහණයකි. එම ජයග්‍රහණය අත්පත් කර ගැනීම සඳහා ඊට දායකත්වය දැක්වූ අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන හා සමාගම් විසින් ඉටු කරන ලද සුවිශේෂී කාර්යභාරය කෘතවේදීව සිහිපත් කරමි.

2014 වර්ෂයට අදාළ කෘෂිකාර්මික ජයග්‍රහණයන් අත්පත් කර ගැනීම සඳහා පූර්ණ දායකත්වය ලබාදුන් එවකට පැවැති අමාත්‍යාංශයන්ට නායකත්වය ලබාදුන් ගරු අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් ඇතුළු එම කාර්ය මණ්ඩල දැක්වූ සහයෝගයද ගෞරවයෙන් සිහිපත් කරන අතර, අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්, අංශ ප්‍රධානීන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන හා සමාගම් වල ප්‍රධානීන් ඇතුළු සියලු නිලධාරින් දැක්වූ දායකත්වයද බෙහෙවින් අගය කරමි.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ කටයුතු සාර්ථකව කරගෙනයාම සඳහා වර්තමානයේ ඊට නායකත්වය ලබාදෙන ගරු අමාත්‍ය දුමින්ද දිසානායක මැතිතුමාගේ හා ගරු නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය අනෝමා ගමගේ මැතිනියගෙන් ලැබෙන මඟපෙන්වීම හා සහය ගෞරවයෙන් සිහිපත් කරමි. 2014 කාර්ය සාධන වාර්තාව සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු හා දත්ත ලබාදෙමින් පූර්ණ සහයෝගය ලබා දුන් අමාත්‍යාංශයේ සියලුම අංශ, දෙපාර්තමේන්තු, ආයතන හා සමාගම් වල ප්‍රධානීන් ඇතුළු සියලු නිලධාරින්ට හා මෙම කාර්ය ඉටුකළ සැලසුම්, මෙහෙයුම් හා ඇගයුම් අංශයටද මාගේ නොමඳ ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමි.

බී. විජයරත්න

ලේකම්

කෘෂිකර්ම අමාත්‍යාංශය

# පටුන


| | | | පිටු අංක |
|---|---|---|---|
| | | ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ පණිවුඩය | 2 |
| | | ගරු කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය | 3 |
| | | පෙරවදන | 4 |
| 01. | | සාමාන්‍ය පරිපාලනය | |
| | 1.1 | කාර්ය මණ්ඩල තොරතුරු | 7-11 |
| | 1.2 | මානව සම්පත් සංවර්ධනය | 12-15 |
| | 1.3 | වත්කම් අත්පත් කරගැනීම්,අළුත්වැඩියා, ඉදි කිරීම් හා නඩත්තු කටයුතු | 16 |
| 02. | | අමාත්‍යාංශයේ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් | |
| | 2.1 | ආහාර සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීමේ විශේෂ සංවර්ධන වැඩසටහන | 17-21 |
| | 2.2 | කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන | 22-23 |
| | 2.3 | කෘෂිබෝග නිෂ්පාදන පුරෝකතන වැඩසටහන | 24-25 |
| | 2.4 | ලොකු ළූණු බීජ නිෂ්පාදන වැඩසටහන | 26-27 |
| | 2.5 | සහල් අපනයන වැඩසටහන | 28-29 |
| | 2.6 | “දැයට කිරුළ” ජාතික සංවර්ධන වැඩසටහන | 30-32 |
| 03. | | විශේෂ සංවර්ධන වැඩසටහන්/ ව්‍යාපෘති | 33-35 |
| 04. | | ගොවින්ගේ භාරකාර අරමුදල | 36-50 |
| 05. | | මූල්‍ය වාර්තා | |
| | 5.1 | අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය 2014.12.31 | 51-54 |
| | 5.2 | අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු | 55 |
| 06. | | 2014 සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් සිදු කළ සංවර්ධන වැඩසටහන් | 56-60 |
| 07. | | අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන වල සංවර්ධන වැඩසටහන් | |
| | 7.1 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 61-65 |
| | 7.2 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 66-71 |
| | 7.3 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 72-75 |
| | 7.4 | ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | 76-87 |
| | 7.5 | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය | 88-91 |
| | 7.6 | ශ්‍රී ලංකා සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය | 92-94 |
| | 7.7 | පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය | 95-98 |
| | 7.8 | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | 99-102 |
| | 7.9 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | 103-105 |
| | 7.10 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | 106-112 |
| | 7.11 | ජාතික පොහොර ලේකම් කාර්යාලය | 113-117 |
| | 7.12 | සී/ස ලංකා පොහොර සමාගම | 118-119 |
| | 7.13 | සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 120-121 |
| | 7.14 | සී/ස ලංකා පොස්පේට් සමාගම | 122-123 |

# 2014-2015 අමාත්‍යාංශය භාරව කටයුතු කරන ලද ගරු අමාත්‍යවරුන් හා ලේකම්වරුන්

- **කෘෂිකර්ම අමාත්‍යවරු**
  ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා. ( හිටපු අමාත්‍ය)
  ගරු දුමින්ද දිසානායක මැතිතුමා.

- **කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍යතුමා/ අමාත්‍යතුමිය**
  ගරු වයි.ජී. පද්මසිරි මැතිතුමා. (හිටපු නියෝජ්‍ය අමාත්‍ය)
  ගරු අනෝමා ගමගේ මැතිතුමිය.

- **අමාත්‍යාංශයේ ලේකම්වරු**
  ආර්.එම්.ඩී.බී. මීගස්මුල්ල මහතා. (හිටපු ලේකම්)
  බී. විජයරත්න මහතා.

## 2014 අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන වල ප්‍රධානීන්

| |
|---|
| **1.** ආචාර්ය රොහාන් විජේකෝන් මහතා.<br>- කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| **2.** එන්.කේ.ඊ. රූපසිංහ මහතා.<br>- අධ්‍යක්ෂ ජනරාල් - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| **3.** එම්.ඒ.එස්. වීරසිංහ මහතා.<br>- ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| **4.** නන්දසේන හේරත් මහතා.<br>- සභාපති - ශ්‍රී ලංකා හදබිම අධිකාරිය |
| **5.** ඊ.එම්. අභයරත්න මහතා.<br>- අධ්‍යක්ෂ - හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය |
| **6.** කුමුදුනී ගුණසේකර මිය<br>- සභාපති - ශ්‍රී ලංකා සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය |
| **7.** ජගත් පාලිත ජයවර්ණ මහතා.<br>- සභාපති - පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය |
| **8.** ආචාර්ය ජේ.ඩී.සමරසිංහ මහතා.<br>- සභාපති - ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව |
| **9.** පණ්ඩුක වීරසිංහ මහතා<br>- අධ්‍යක්ෂ ජනරාල් - කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය |
| **10.** එන්.ජී. රත්නායක මහතා.<br>- අධ්‍යක්ෂ - ජාතික පොහොර ලේකම් කාර්යාලය |
| **11.** බුද්ධික මඩිහහේවා මහතා.<br>- සභාපති - සී/ස ලංකා පොහොර සමාගම |
| **12.** එන්.එස්.එම්.සම්සුදීන් මහතා.<br>- සභාපති - සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම |
| **13.** ජාලිය පී. කුලසේකර මහතා<br>- සභාපති - සී/ස ලංකා පොස්පේට් සමාගම |

# 01. සාමාන්‍ය පරිපාලනය

## *1.1 කාර්ය මණ්ඩල තොරතුරු*

| අනු අං. | නම | තනතුර |
|---|---|---|
| **01.** | ආර්.එම්.ඩී.බී. මීගස්මුල්ල මහතා | ලේකම් |
| **02.** | ඒ.එල්.ඒ. අසෝක සිරිවර්ධන මහතා | අතිරේක ලේකම් (පාලන) |
| **03.** | ආචාර්ය ඩී.බී.ටී. විජේරත්න මහතා | අතිරේක ලේකම් (තාක්‍ෂණ) |
| **04.** | එස්.එල්.ජී. බන්දුසිරි මහතා | ප්‍රධාන ගණකාධිකාරී |
| **05.** | ඩී.එන්. හෙට්ටිආරච්චි මිය | වැ.බ. ජ්‍යො.ස.ලේ.(ආයතන) |
| **06.** | එන්.පී. අමරතුංග මහතා | වැ.බ. ජ්‍යො.ස.ලේ.(පාලන) |
| **07.** | එච්.එස්. ධර්මවර්ධන මහතා | අධ්‍යක්‍ෂ (කෘෂි සේවා) |
| **08.** | එල්.යූ.එන්. සුමනසේකර මිය | අධ්‍යක්‍ෂ (තාක්‍ෂණ) |
| **09.** | ආචාර්ය ජේ.ඩී.එච්. විජේවර්ධන මහතා | අධ්‍යක්‍ෂ (කාබනික පොහොර) |
| **10.** | එන්.ජී. රත්නායක මහතා | අධ්‍යක්‍ෂ (ජා.පො.ලේකම් කාර්යාලය) |
| **11.** | එම්.කේ.ජී.එස්.පී.කේ. ජයසේකර මහතා | අධ්‍යක්‍ෂ (සැලසුම්) |
| **12.** | ඩබ්.කේ.එල්.ඊ. වලල්ලාවිට මහතා | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| **13.** | එස්.ඒ. ශ්‍රියානි මිය | ගණකාධිකාරී (ප්‍රසම්පාදන) |
| **14.** | සී.එස්. හෙට්ටිආරච්චි මිය | ගණකාධිකාරී (ගෙවීම්) |
| **15.** | ජී.කේ.ඩී.එච්.මැණිකේ මිය | සංඛ්‍යාලේඛනඥ |
| **16.** | පී.එන්.එන්. ජයනෙත්ති මහතා | නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (ව්‍යාපෘති) |
| **17.** | එම්.ජී.ඒ.පී. කුමාර මහතා | නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (ස්වාභාවික සම්පත්) |
| **18.** | කේ.යූ. ජයසේකර මහතා | සහකාර අධ්‍යක්‍ෂ (සැලසුම්) |
| **19.** | ඊ.එම්.එස්. ඒකනායක මහතා | සහකාර අධ්‍යක්‍ෂ (සැලසුම්) |
| **20.** | එස්.ඒ.එස්.කේ. සේනාධීර මයා | සහකාර අධ්‍යක්‍ෂ (කෘෂි තාක්‍ෂණ) |
| **21.** | එම්.කේ. රාජපක්ෂ මිය | සහකාර අධ්‍යක්‍ෂ (සංවර්ධන) |
| **22.** | කේ.එම්.වයි.එස්. බොරලැස්ස මිය | සහකාර ලේකම් (පාලන) |
| **23.** | ආර්.ජී. උත්පලා ඒ. ගුණසේකර මෙය | සහකාර ලේකම් (ආයතන) |
| **24.** | ඩබ්. මධූෂා ආර්. වීරක්කොඩි මිය | සහකාර අධ්‍යක්‍ෂ (සංවර්ධන) |
| **25.** | එස්.ඒ. නදීෂා දර්ශනී මිය | සහකාර ලේකම් (පාලන) |
| **26.** | එස්. සකි මොහොමඩ් මයා | යාන්ත්‍රික ඉංජිනේරු |
| **27.** | එල්. පර්සි කිත්සිරි පෙරේරා මහතා | සහකාර ලේකම් (කම්කරු සබඳතා) |
| **28.** | ජී.ආර්.ඩී. ගුණරත්න මයා | සහකාර අධ්‍යක්ෂ (ජා.පො. ලේ. කා.) |
| **29.** | සිසිර විජේසුන්දර මයා | සහකාර අධ්‍යක්ෂ (ජා.පො. ලේ. කා.) |
| **30.** | කේ.එච්.ඩබ්.එම්. කරුණාරත්න මයා | සහකාර අධ්‍යක්ෂ (ජා.පො. ලේ. කා.) |
| **31.** | බී.එච්. රොහාන් ඉන්දුක මයා | සහකාර අධ්‍යක්ෂ (ජා.පො. ලේ. කා.) |
| **32.** | ඒ.ආර්.එම්.ජී. නවරත්න බණ්ඩාර මයා | සහකාර අධ්‍යක්ෂ (ජා.පො. ලේ. කා.) |
| **33.** | කේ. මහතන්තිල මයා | වැ බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජා.පො. ලේ. කා.) |
| **34.** | ඩී.ජී.එස්. දසනායක මයා | සහකාර අධ්‍යක්ෂ (ජා.පො. ලේ. කා.) |
| **35.** | එන්. ධම්මික එදිරිසූරිය මයා | සහකාර අධ්‍යක්ෂ (ජා.පො. ලේ. කා.) |
| **36.** | ආර්.එම්.ටී. පුෂ්පකුමාර මයා | සහකාර අධ්‍යක්ෂ (ජා.පො. ලේ. කා.) |
| **37.** | එස්.ඒ. දසනායක මයා | සංඛ්‍යා ලේඛන නිලධාරි |
| **38.** | සී.පී. චන්ද්‍රසේකර මිය | සංඛ්‍යා ලේඛන නිලධාරි |
| **39.** | බී. ආරියපාල මහතා | භාෂා පරිවර්තක |
| **40.** | එස්.වයි. අබේවර්ධන මිය | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් |
| **41.** | පී.ඒ.එස්. චන්ද්‍රිකා මිය | වැ.බ. පරිපාලන නිලධාරී (ආයතන) |
| **42.** | එස්.ඒ. සමතපාල මයා | වැ.බ. පරිපාලන නිලධාරී (පාලන) |

## 2014.01.01 සිට 2014.12.31 දක්වා ස්ථාන මාරු වී පැමිණි මාණ්ඩලික නිලධාරීන්, අනෙකුත් නිලධාරීන් හා කණිෂ්ඨ සේවකයන්.

* මාණ්ඩලික නිලධාරීන්

| අනු අංක | නම | තනතුර | ස්ථාන මාරු වී ගිය දිනය |
|---|---|---|---|
| 01. | කේ.එස්.පී. පියතිස්ස මිය | සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | 2014.08.19 |
| 02. | එම්.ඒ.එස්.කේ. ගුණවර්ධන මිය | සහකාර ලේකම් (පාලන) | 2014.10.31 |
| 03. | එච්.ජී.ජී.ජේ. ධර්මසේන මයා | අධ්‍යක්ෂ (සංවර්ධන) | 2014.12.01 |

* සංවර්ධන නිලධාරීන්

| නම | ස්ථාන මාරු වී ගිය ස්ථානය | ස්ථාන මාරු වී ගිය දිනය |
|---|---|---|
| කේ.එන්. රුක්ෂානි මෙය | බස්නාහිර පළාත් ගුරු සේවය | 2014.01.03 |
| බී.ඒ.ඩී. නිලූෂිකා මෙය | බස්නාහිර පළාත් ගුරු සේවය | 2014.01.03 |
| අයි.එස්.ඩී. කුලරත්න මයා | බස්නාහිර පළාත් ගුරු සේවය | 2014.01.10 |
| පී.ජී.එම්.බී. ගමගේ මිය | බස්නාහිර පළාත් ගුරු සේවය | 2014.02.03 |
| එස්. තුල්සියා මෙය | ගණකාධිකාරී සේවය | 2014.02.07 |
| එල්.ජී.වී. ලක්මාලි මෙය | බස්නාහිර පළාත් ගුරු සේවය | 2014.02.25 |
| ජී.එන්. ප්‍රියදර්ශනී මෙය | බස්නාහිර පළාත් ගුරු සේවය | 2014.05.12 |
| එම්.ආර්.වයි. සෞම්‍යපාලි මෙය | බස්නාහිර පළාත් ගුරු සේවය | 2014.05.12 |
| ඒ.ඩී.එස්.එල්. කරුණාතිලක මයා | බස්නාහිර පළාත් ගුරු සේවය | 2014.05.12 |
| පී.ඩී.එන්. ආරියරත්න මෙය | බස්නාහිර පළාත් ගුරු සේවය | 2014.05.12 |
| එස්.එන්.එම්. සුභාෂිනි මෙය | බස්නාහිර පළාත් ගුරු සේවය | 2014.05.21 |
| එස්.කේ. වීරසිංහ මිය | මධ්‍ය පළාත් ගුරු සේවය | 2014.06.10 |
| ඩී.එම්.ආර්.එන් ධනපාල මිය | මධ්‍ය පළාත් ගුරු සේවය | 2014.06.11 |
| බී. මිනිලි මෙය | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 2014.06.16 |
| කේ. සසිදරන් මයා | මහාමාර්ග, වරාය හා නාවික කටයුතු අමා. | 2014.07.17 |
| පී.ඒ.ඩී.ඩබ්. පෙරියප්පෙරුම මිය | වයඹ පළාත් සභාව | 2014.07.23 |
| ඒ.ටී. අබේගුණවර්ධන මයා | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 2014.07.28 |
| එල්.ඩී. කාහිංගල මයා | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 2014.07.30 |
| එන්. නිරංජනා මෙය | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපා. | 2014.09.10 |
| ආර්.ඩබ්.ඩබ්. සිල්වා මයා | දකුණු පළාත් ගුරු සේවය | 2014.09.13 |
| පී.ජී. ප්‍රසාදි ලක්මිණි මෙය | දකුණු පළාත් සභාව | 2014.09.30 |
| ආර්.එච්.ඒ.ඩබ්. රුවිනි මිය | උද්භිද උද්‍යාන හා පොදු විනෝ. කටයුතු අමා. | 2014.09.30 |
| ඩී.ටී.එස්. පතිරණ මිය | බස්නාහිර පළාත් ගුරු සේවය | 2014.10.01 |
| ඩී.ඒ.එන්. නිර්මලී | විදේශ රැකියා සුභසාධන ප්‍රවර්ධන අමා. | 2014.10.13 |

## 2014.01.01 සිට 2014.12.31 දක්වා ස්ථාන මාරු වී ගිය සංවර්ධන නිලධාරීන්

| අනු අංක | නම | සේවය කල ආයතනය | ස්ථාන මාරු වී ගිය ආයතනය | දිනය |
|---|---|---|---|---|
| 01. | වයි.එම්.යු. අංජලී මෙය | මැද දුම්බර ප්‍රා.ලේ.කා. | උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු දෙපා. | 2014.10.02 |
| 02. | ආර්.පී.එස්.පී. කුමාර මයා | ගලිගමුව ප්‍රා.ලේ.කා. | උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු දෙපා. | 2014.09.26 |

| | | | | |
|---|---|---|---|---|
| 03. | ඩබ්.එම්.ජී.කේ. වීරකෝන් මිය | වීරඹුගෙදර ප්‍රා.ලේ.කා. | මහව ප්‍රා.ලේ.කා. | 2014.11.20 |
| 04. | ජේ.එච්.අයි.ආර්. ජයමහ මෙය | මහවැව ප්‍රා.ලේ. කා. | වයඹ පළාත් සභාව | 2014.11.04 |
| 05. | එච්.බී.එන්.එස්. කුමාර මයා | පලුගස්වැව ප්‍රා.ලේ. කා. | පෞද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය | 2014.07.16 |
| 06. | ටී.එස්.එම්.එස්. සෙනෙවිරත්න මයා | සියඹලාන්ඩුව ප්‍රා.ලේ.කා. | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 2014.07.22 |
| 07. | කේ.ආර්.එස්.එස්. විජේනායක මයා | උකුවෙල ප්‍රා.ලේ. කා. | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 2014.07.21 |
| 08. | එච්.ජී.එන්. සිල්වා මිය | කොත්මලේ ප්‍රා.ලේ. කා. | අධ්‍යාපන අමාත්‍යාංශය | 2014.07.28 |
| 09. | ආර්.ඩී.අයි. මැණිකේ මිය | හිගුරක්ගොඩ ප්‍රා.ලේ. කා. | අධ්‍යාපන අමාත්‍යාංශය | 2014.10.31 |
| 10. | ටී.ඩී.එස්.පී.කේ. දෙවරත්න මිය | හිඟුරක්ගොඩ ප්‍රා.ලේ. කා. | වයඹ පළාත් සභාව | 2014.10.31 |
| 11. | ඩබ්.ජේ.ජී. උදයානි මිය | මාදම්පේ ප්‍රා.ලේ. කා. | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 2014.11.05 |
| 12. | අයි.එස්. විතානගේ මිය | කතරගම ප්‍රා.ලේ. කා. | අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය | 2014.11.05 |
| 13. | කේ.එස්.ජී.එස්. ජයතුංග මිය | රාජාංගනය ප්‍රා.ලේ. කා. | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 2014.11.12 |
| 14. | පී.එස්. නීලාරත්න මිය | නුවරඑළිය ප්‍රා.ලේ. කා. | ගුරු සේවය | 2014.06.02 |
| 15. | එච්.එම්.වයි.ජී.එස්.බී. කේ. හේරත් මෙය | යටවත්ත ප්‍රා.ලේ. කා. | ගුරු සේවය | 2014.06.09 |
| 16. | ජී.එම්.ජී.පී. ජයසේකර මිය | නුවරඑළිය ප්‍රා.ලේ. කා. | ගුරු සේවය | 2014.06.04 |
| 17. | ආර්.එස්.ඩී.ආර්. රාමනායක මිය | අඹගමුව ප්‍රා.ලේ. කා. | ගුරු සේවය | 2014.06.03 |
| 18. | එච්.ජී.ඩී. බණ්ඩාර මිය | අඹගමුව ප්‍ර.ලේ. කා. | ගුරු සේවය | 2014.11.09 |
| 19. | ඩබ්.ජී.සී.එස්.බී. සුමනසිරි මයා | නුවරඑළිය ප්‍රා.ලේ. කා. | ගුරු සේවය | 2014.03.06 |
| 20. | ඩී.එම්.එන්.පී.කේ. දිසානායක මිය | ගල්නෑව ප්‍රා.ලේ. කා. | ගුරු සේවය | 2014.01.18 |
| 21. | එම්.එම්.යූ.එන්.එම්. මුදන්නායක මිය | හඟුරන්කෙත ප්‍රා.ලේ. කා. | ගුරු සේවය | 2014.06.06 |

* <u>රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය</u>

| අනු අංක | නම | තනතුර | ස්ථාන මාරු වී ගිය දිනය |
|---|---|---|---|
| 01. | ඩබ්.එම්.එස්.පී. වීරසිංහ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.10 |
| 02. | වයි.ජී.ඩී.එස්. නිලන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.02.28 |

* <u>පුස්තකාලයාධිපති සේවය</u>

| අනු අංක | නම | තනතුර | ස්ථාන මාරු වී ගිය දිනය |
|---|---|---|---|
| 01. | කේ.ජී.එස්. ගුණතිලක මයා | පුස්තකාලයාධිපති | 2014.03.21 |

* ඒකාබද්ධ රියදුරු  සේවය

| අනු අංක | නම | තනතුර | ස්ථාන මාරු වී ගිය දිනය |
|---|---|---|---|
| 01. | ඩබ්.එම්.එන්.කේ. ජයම්පති මයා | රියදුරු II 'අ' | 2014.01.20 |
| 02. | එම්.ජී. ජයරත්න මයා | රියදුරු II 'ආ' | 2014.07.09 |
| 03. | කේ.එච්.ජේ.ඒ. කුමාර් මයා | රියදුරු II 'ආ' | 2014.08.13 |
| 04. | බී.එම්. කුමාරතිලක මයා | රියදුරු II 'ආ' | 2014.12.09 |
| 05. | එල්.ජී. ජයරත්න මයා | රියදුරු II 'අ' | 2014.12.11 |

* කනිෂ්ඨ සේවක නිලධාරීන්

| අනු අංක | නම | තනතුර | ස්ථාන මාරු වී ගිය දිනය |
|---|---|---|---|
| 01. | එම්.ජී.එස්.ඩී. විද්‍යාපති මිය | කාර්යාල කාර්ය සේවය III | 2014.08.24 |
| 02. | එම්.එස්.ජීවන්ති මෙය | කාර්යාල කාර්ය සේවය III | 2014.09.05 |

## 2014.01.01 සිට 2014.12.31 දක්වා ස්ථාන මාරු වී පැමිණි මාණ්ඩලික නිලධාරීන්, අනෙකුත් නිලධාරීන් හා කණිෂ්ඨ සේවකයන්

* මාණ්ඩලික නිලධාරීන්

| අනු අංක | නම | තනතුර | ස්ථාන මාරු වී පැමිණි දිනය |
|---|---|---|---|
| 01. | එස්.ඒ.එස්.කේ. සේනාධීර මයා | සහකාර අධ්‍යක්ෂ (කෘෂි තාක්‍ෂණ) | 2014.06.18 |
| 02. | එස්.ඒ. නදීශා දර්ශනී  මිය | සහකාර ලේකම් (පාලන) | 2014.10.01 |
| 03. | කේ.එම්.වයි.එස්. බොරලැස්ස මිය | සහකාර ලේකම් (පාලන) | 2014.10.29 |

* සංවර්ධන නිලධාරීන්

| අනු අංක | නම | සේවය කල ආයතනය | සේවය සඳහා පැමිණි ආයතනය | දිනය |
|---|---|---|---|---|
| 01. | අයි.එම්.සී.එස්. බන්දුසේන මිය | මහව ප්‍රා.ලේ.කා. | වීරඹුගෙදර ප්‍රා.ලේ.කා. | 2014.02.08 |

* රාජ්‍ය කළමනාකරණ සහකාර

| අනු අංක | නම | තනතුර | ස්ථාන මාරු වී පැමිණි දිනය |
|---|---|---|---|
| 01. | ජී.ඒ. පෙරේරා මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.06 |
| 02. | ඩබ්.ඩී. අනෝමා නන්දනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.06 |
| 03. | කේ. වර්ණි ශමිලා කෝරළගේ මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.01.06 |

## 2014.01.01 සිට 2014.12.31 දක්වා වෙනත් සේවාවන් සඳහා නිදහස් කරන ලද නිලධාරීන්

* සංවර්ධන නිලධාරීන්

| අනු අංක | නම | සේවය කල ආයතනය | නිදහස් කල සේවය | නිදහස් වී ගිය දිනය |
|---|---|---|---|---|
| 01. | එච්.එම්.ඒ.ජී. තිලකරත්න මයා | වාරියපොල ප්‍රා.ලේ.කා. | ගුරු සේවය | 2014.01.02 |
| 02. | ජේ.එච්.එම්.බී.ටී. ජයසුන්දර මයා | කුලියාපිටිය (නැ) ප්‍රා.ලේ.කා. | ගුරු සේවය | 2014.01.06 |
| 03. | ජේ.ඒ.පී.එස්. ජයලත් මයා | කුලියාපිටිය (නැ) ප්‍රා.ලේ.කා. | ගුරු සේවය | 2014.01.06 |
| 04. | ටී.එස්. රුවන් මයා | කුරුවිට ප්‍රා.ලේ.කා. | ගුරු සේවය | 2014.01.30 |
| 05. | එන්.කේ. වීරසිංහ මිය | යටිනුවර ප්‍රා.ලේ.කා. | ගුරු සේවය | 2014.02.03 |
| 06. | ආර්.එස්.ඩී.එච්. රාමනායක මිය | පස්බාගෙ කොරලේ ප්‍රා.ලේ.කා. | ගුරු සේවය | 2014.02.03 |
| 07. | බී.පී.යු.ආර්. බණ්ඩාර මයා | අලව්ව ප්‍රා.ලේ.කා. | කෘෂිකර්ම නිලධාරී යු.හ. ස්වේච්ඡා බලසේනාව | 2014.02.11 |
| 08. | ඒ. ප්‍රේමචන්ද්‍ර මයා | කහවත්ත ප්‍රා.ලේ.කා. | ගුරු සේවය | 2014.04.02 |
| 09. | කේ.අයි. සඳමාලි මිය | කුලියාපිටිය (නැ) ප්‍රා.ලේ.කා. | ගුරු සේවය | 2014.05.12 |
| 10. | පී.ජී.සී.සී. ගුණසිංහ මිය | පස්බාගෙ කොරලේ ප්‍රා.ලේ.කා. | ගුරු සේවය | 2014.05.23 |
| 11. | ජේ.එම්.එන්.ජේ. වැලිවිට මයා | හතරලියද්ද ප්‍රා.ලේ.කා. | ගුරු සේවය | 2014.06.04 |
| 12. | ජේ.බී.ඩබ්.එස්.එම්.ජී.ඩබ්.ජේ.බී. ගල්පොත්තාවල මිය | තුම්පනේ ප්‍රා.ලේ.කා. | ගුරු සේවය | 2014.06.05 |
| 13. | එල්.ඒ.ටී.එස්. විමල්සිංහ මිය | තුම්පනේ ප්‍රා.ලේ.කා. | ගුරු සේවය | 2014.06.06 |
| 14. | කේ.ජී.එම්.ඩී. කරුණාතිලක මෙය | මහනුවර දිස්ත්‍රික් ලේ.කා. | ගුරු සේවය | 2014.06.13 |

## 2014.01.01 සිට 2014.12.31 දක්වා විශ්‍රාම ගිය මාණ්ඩලික නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන්

| අනු අංක | සේවා කාණ්ඩය | නම | තනතුර | විශ්‍රාම ගිය දිනය |
|---|---|---|---|---|
| 01. | ශ්‍රී.ලංකා කෘෂි.සේවය | එල්.කේ. හතුරුසිංහ මයා | අධ්‍යක්ෂ (ව්‍යාපෘති) | 2014.04.09 |
| | | ආචාර්ය ඩී.එම්.එන්. දිසානායක මයා | අතිරේක ලේකම් (කෘෂි සංවර්ධන) | 2014.10.30 |
| 02. | ශ්‍රී.ලංකා ක්‍රමසම්පාදන සේවය | එන්.ජී. රත්නායක මයා | අධ්‍යක්ෂ (ජාතික පොහොර ලේකම් කාර්යාලය) | 2014.08.14 |
| 03. | රා.කළ.සහකාර සේවය | පී.ඒ.එම්. චන්ද්‍රලතා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2014.11.27 |
| 04. | ඒකාබද්ධ රියදුරු සේවය | එස්.ඒ. ජයසිරි මයා | රියදුරු I | 2014.04.17 |
| 05. | කණිෂ්ඨ සේවක නිලධාරීන් | පී.ඩබ්. ජිනදාස මයා | කාර්යාල කාර්ය සේවය | 2014.02.21 |
| | | එන්.වී. පියසිරි මයා | කාර්යාල කාර්ය සේවය | 2014.07.10 |

## *1.2 මානව සම්පත් සංවර්ධනය*

### <u>පුහුණු වැඩසටහන්</u>

| | වැය විෂය අංකය | වැය වූ මුදල (රු.) |
|---|---|---|
| දේශීය පුහුණු | **118-1-2-2401** අමාත්‍යාංශය<br>**118-2-3-2401** කෘෂි සංවර්ධන අංශය | **1,216,317.67**<br>**693,784.79** |
| විදේශීය පුහුණු | **118-1-2-1102** අමාත්‍යාංශය<br>**118-1-2-1102** පාලන අංශය (නිල සංචාර)<br>**118-2-3-1102** කෘෂි සංවර්ධන අංශය (නිල සංචාර)<br>**118-1-2-2401** පාලන අංශය (පුහුණු වැඩසටහන්)<br>**118-2-3-2401** කෘෂි සංවර්ධන අංශය (පුහුණු වැඩසටහන්) | **3,784,315.04**<br>**179,917.50**<br>**2,010,852.71**<br>**775,958.17**<br>**693,784.79** |

### <u>දේශීය පුහුණු වැඩසටහන්</u>

* **2014 වර්ෂයේ පුහුණු පාඨමාලා සඳහා සහභාගී වු නිලධාරීන්**

| අනු අංක | පුහුණු වැඩසටහන | සහභාගී වු නිලධාරීන් ගේ නාමලේඛනය |
|---|---|---|
| **01.** | දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව | කේ.යු. ජයසේකර මහතා - සහකාර අධ්‍යක්ෂ |
| **02.** | අමාත්‍යාංශයේ රියදුරු හා කාර්යාල කාර්ය සහායක නිලධාරීන් සඳහා පවත්වනු ලැබූ පුහුණු පාඨමාලා | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල වලට අනියුක්ත කිරීම සඳහා බඳවා ගත් සියලුම රියදුරු සහ කාර්යාල කාර්ය සහායකවරුන් |
| **03.** | මානව හිමිකම් පශ්චාත් උපාධිය | පී.ඒ.එස්. හේවගේ මිය - නීති නිලධාරී |
| **04.** | කාර්යාල කාර්ය සහායක නිලධාරීන්ගේ වගකීම් හා කාර්යභාරය | ඒ.පී.ඒ. ගුණවර්ධන මහතා - කාර්යාල කාර්ය සහයක |
| **05.** | නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන | එන්.එස්. දිවලආරච්චි මිය - කාන්තා කේන්ද්‍ර නිලධාරී |
| **06.** | ප්‍රසම්පාදන වැඩමුළුව | ලලනි ලසන්තිකා පෙරේරා මෙය.<br>ඩී. නාලිකා මනෝරි කරුණාරත්න මෙය. |
| **07.** | මුදල් රෙගුලාසි **104** පරීක්ෂණ සම්බන්ධ පුහුණු වැඩසටහන් | අමාත්‍යාංශයේ නිලධාරීන් හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල නිලධාරීන් |
| **08.** | සරප් / මුදල් අයකැමි තනතුරේ කාර්යභාරය හා වගකීම | ඇස්ලි පෙරේරා මහතා - රාජ්‍ය කළමනාකරණ සහකාර |
| **09.** | විශේෂ පුස්තකාල කළමනාකරණ වැඩමුළුව | ඩබ්.එම්.සී.එල්. විජේසිංහ මෙනෙවිය |
| **10.** | පර්යේෂණ තොරතුරු පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීමෙ විවෘත ප්‍රවේශය | ඩබ්.එම්.සී.එල්. විජේසිංහ මෙනෙවිය |
| **11.** | දින **12**ක නේවාසික නොවන දෙමළ භාෂා පුහුණු වැඩසටහන | අමාත්‍යාංශයේ නිලධාරීන් |

# විදේශ සංචාර වලට සහභාගී වූ නිලධාරීන්

| අනු අංක | නම | තනතුර | වැඩසටහන | කාල පරිච්ඡේදය | රට |
|---|---|---|---|---|---|
| 1. | එන්.පී. අමරතුංග මයා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | විමධ්‍යගත පාලනය හා යහපාලන ගුරු උපදේශ පිළිබඳ CIRDAP-NIRD ජාත්‍යන්තර පුහුණු වැඩසටහන | 2014.01.09 – 2014.01.18 | ඉන්දුනීසියා |
| 2. | එල්.එන්.ජී. ජී. හෙක්ටර් මයා | සංවර්ධන නිළධාරී | බුද්ධිමය දේපල අයිතිවාසිකම් හා අදාළ වෙනත් කරුණු | 2014.01.20 – 2014.03.17 | ඉන්දියා |
| 3. | ජී.කේ. මුදලිගේ මහතා | සංවර්ධන නිළධාරී | කෘෂිකර්ම හා ආහාර නිෂ්පාදන කාර්යයන් සැලසුම් කිරීම හා ප්‍රවර්ධනය | 2014.01.20 – 2014.03.14 | ඉන්දියා |
| 4. | ආර්.එම්.ඩී.බී. මීගස්මුල්ල මයා | ලේකම් | ආසියා හා පැසිපික් කලාපය “රියා” (Ria) ක්‍රමෝපායන පිළිබඳ උපදේශ රැස්වීම | 2014.01.28 | බැංකොක් |
| 5. | ඩී.එල්.ජී. තිලකරත්න මයා | කෘෂි මෙහෙයුම් නිළධාරී | ග්‍රාමීය සංවර්ධන සඳහා භූ ගර්භ තොරතුරු අදාළ කර ගැනීම | 2014.02.10 – 2014.03.24 | ඉන්දියා |
| 6. | එස්.ඒ. මහවත්තගේ මයා | කෘෂි සංවර්ධන නිළධාරී | එළවළු නිෂ්පාදන පිළිබඳ පුහුණු පාඨමාලාව | 2014.02.15 - 2014.04.30 | ඊජිප්තුව |
| 7. | ආචාර්ය එඩී.එම්.එන්. දිසානායක මයා | අතිරේක ලේකම් (කෘෂි සංවර්ධන) | ආසියාවේ ආහාර බෝග නිෂ්පාදනය පිළිබඳ පළමු වාර්ෂික සමුළුව | 2014.02.17 2014.02.21 | වියට්නාම ය |
| 8. | යූ.පී.සී. කුෂන්කා මෙය | අයවැය සහකාර | ග්‍රාමීය සංවර්ධන පිළිබඳ වැඩමුළුව හා පුහුණු වැඩසටහන | 2014.02.23 – 2014.03.06 | බංගලා දේශය |
| | එස්.ඩී. කුසුම් ශ්‍රියානි මිය | සංවර්ධන සහකාර | | | |
| 9. | එම්.කේ. රාජපක්ෂ මිය | සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | සංවර්ධනය විෂයයෙහි ග්‍රාමීය තාක්ෂණය යොදා ගැනීම පිළිබඳ ජාත්‍යන්තර සහයෝගීතා වැඩමුළුව | 2014.02.18 – 2014.02.27 | ඉන්දියා |
| 10. | පී.එන්.එන්. ජයනෙත්ති මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාපෘති) | ආසියා පැසිපික් කලාපීය ආර්ථික හා තාක්ෂණික - සහයෝගීතා පිළිබඳ ශ්‍රී ලංකා ඉරාක ඒකාබද්ධ කමිටුවේ 8 වැනි සැසිවාරය | 2014.02.24 – 2014.02.25 | ඉරාකය |
| 11. | එම්.කේ.ජී.එස්.පී .කේ. ජයසේකර මයා | අධ්‍යක්ෂ (සැලසුම්) | කෘෂිකාර්මික ආයෝජන සඳහා CFC මූලධර්ම අදාළ කර ගැනීම. | 2014.03.03 – 2014.03.04 | තායිලන්ත ය |
| 12. | ආචාර්ය ඩී.බී.ටී. විජේරත්න මයා | අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) | පවුල් ගොවිපල ක්‍රමය පිළිබඳ ගෝලීය වැඩමුළුව | 2014.03.04 – 2014.03.17 | හංගේරියා |
| 13. | ඒ.එල්.ඒ. අසෝක සිරිවර්ධන මයා | අතිරේක ලේකම් (පාලන) | ග්‍රාමීය සංවර්ධනය විෂයයෙහි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය අදාළ කර ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන | 2014.03.10 – 2014.03.19 | ඉන්දියා |

| | | | | | |
|---|---|---|---|---|---|
| 14. | ආචාර්ය ජේ.ඩී.එච්. විජේවර්ධන මයා | අධ්‍යක්ෂ (කාබනික පොහොර) | තිරසාර කෘෂිකාර්මික - සංවර්ධන සඳහා කාබනික ගොවිතැන මැයෙන් වූ ජාත්‍යන්තර වැඩමුළුව | **2015.03.15 - 2015.03.20** | ඕමාන් |
| 15. | එච්.ආර්.ජී.බී. එරබදුපිටිය මයා | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ (අනුරාධපුරය) | ආසියා - යුරෝපා රටවල් සඳහා හරිතාගාර එළවළු වගාව පිළිබඳ පුහුණු පාඨමාලාව | **2014.04.22 – 2014.05.06** | චීනය |
| 16. | වයි. කැටෙපෙආරච්චි මයා | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ (පොළොන්නරුව) | සංරක්ෂණ කෘෂිකර්මය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව හා පුහුණු පාඨමාලාව | **2014.03.24 – 2014.04.02** | ඉන්දියා |
| 17. | ආර්.එම්.ඩී.බී. මීගස්මුල්ල මයා | ලේකම් | 3 වැනි මහ සමුළුව | **2014.04.23 – 2014.04.25** | වියට්නාමය |
| | ආචාර්ය ඩී.බී.ටී. විජේරත්න මයා | අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) | | | |
| 18. | එච්.එම්.අයි. දේශප්‍රිය මහතා | තොරතුරු තාක්ෂණ නිලධාරී | ආසියානු රටවල කෘෂිකර්මාන්තයෙහිලා තොරතුරු තාක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය | **2014.05.09 – 2014.05.29** | චීනය |
| 19. | ඊ.එම්.එස්. ඒකනායක මයා | සහකාර අධ්‍යක්ෂ | ආපදා කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව හා පුහුණු වැඩසටහන | **2014.05.19 – 2014.05.23** | සැම්බියා |
| 20. | ඊ.එම්.ඩී. එස්.එන්.ඒකනායක මයා | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බදුල්ල) | කාර්යක්ෂම ප්‍රතිචාර හා තාක්ෂණ කළමනාකරණය මඟින් ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව හා පුහුණු පාඨමාලාව | **2014.05.19 – 2014.05.28** | ඉන්දියා |
| 21. | එස්. කයිලේෂ්වරන් මිය | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ (යාපනය) | කෘෂිකර්මාන්තය හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ හැකියා වර්ධනය | **2014.06.08 – 2014.06.21** | කොරියා |
| 22. | ආර්.එම්.ඩී.බී. මීගස්මුල්ල මයා | ලේකම් | කුරක්කන් වගාව ප්‍රවර්ධනය පිළිබඳ අධ්‍යයන චාරිකාව | **2014.06.13 - 2014.06.15** | ඉන්දියා |
| | ආචාර්ය ඩී.බී.ටී. විජේරත්න මයා | අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) | | | |
| 23. | ආර්.එම්.ඩී.බී. මීගස්මුල්ල මයා | ලේකම් | බීජ පාලනය පිළිබඳ ප්‍රතිපාර්ශවීය වැඩමුළුව | **2014.07.26 – 2014.08.02** | ජපානය |
| 24. | ආචාර්ය ඩී.බී.ටී. විජේරත්න මහතා | අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) | සර්ම කලාපීය පළතුරු පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව | **2014.08.12 – 2014.08.14** | මලයාසියා |
| 25. | ඒ.එල්.ඒ. අසෝක සිරිවර්ධන මයා | අතිරේක ලේකම් (පාලන) | 13 වැනි ආසියා පැසිපික් කලාපීය කෘෂිකර්ම ප්‍රතිපත්ති සමුළුව | **2014.09.01 – 2014.09.02** | කොරියා |

| | | | | | |
|---|---|---|---|---|---|
| 26. | ආර්.එම්.ඩී.බී. මීගස්මුල්ල මයා | ලේකම් | ඉහළ මට්ටම් නිලධාරීන් සඳහා කෘෂිකර්මාන්තය පිළිබඳ සම්මන්ත්‍රණයක් | 2014.09.14 – 2014.09.18 | කොරියා |
| | ආචාර්ය ඩී.බී.ටී. විජේරත්න මහතා | අතිරේක ලේකම් (කෘෂි තාක්‍ෂණ) | | | |
| 27. | එන්.පී. අමරතුංග මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ග්‍රාමීය මට්ටමේ පරිවර්තනය මලයාසියාව අත්දැකීම් තුළින් | 2014.09.21 – 2014.10.03 | මලයාසියා |
| 28. | කේ.සී. ඊෂානි මිය | කෘෂි සංවර්ධන සහකාර | කෘෂිකර්මාන්තයෙහිලා දේශගුණික වෙනස්කම් වල බලපෑම | 2014.09.30 – 2014.10.03 | ඉන්දුනීසියා |
| 29. | එච්.එස්. ධර්මවර්ධන මහතා | අධ්‍යක්‍ෂ (කෘෂිසේවා) | ගෝලීය වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුමය පිළිබඳ ඉහළ මට්ටමේ පුහුණු වැඩසටහන | 2014.09.14 – 2014.09.28 | චීනය |
| 30. | එල්.යූ.එන්. සමරසේකර මිය | අධ්‍යක්‍ෂ (කෘෂි තාක්‍ෂණ) | සාර්ක් රටවල අනුගමනය කෙරෙන සාධනීය කෘෂිකාර්මික ක්‍රම පිළිබඳ කලාපීය වැඩමුළුව | 2014.09.22 – 2014.09.24 | බංගලා දේශය |
| 31. | පී.එන්.එන්. ජයනෙත්ති මහතා | අධ්‍යක්‍ෂ (ව්‍යාපෘති) | සමාජ ආරක්‍ෂණ ග්‍රාමීය සේවා නියුක්තිය හා ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ආසියා පැසිපික් කලාපීය සමුළුව | 2014.10.08 – 2014.10.09 | තායිලන්ත ය |
| 32. | එච්.ජී.ජී.ජේ. ධර්මසේන මයා | අධ්‍යක්‍ෂ (සංවර්ධන) | තිරසාර සංවර්ධනය සඳහා ජල සම්පත් කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව හා පුහුණු වැඩසටහන | 2014.10.13 – 2014.10.26 | ඉන්දියා |
| | එම්.ජී. අජිත් පුෂ්පකුමාර මහතා | නි.අධ්‍යක්ෂ (ස්වභාවික සම්පත්) | | | |
| 33. | එස්.එල්.ජී. බන්දුසිරි මහතා | ප්‍රධාන ගණකාධිකාරී | ගෝලීය නායකත්ව වැඩමුළුව | 2014.10.21 – 2014.10.24 | කොරියා |
| | පී.එන්.එන්. ජයනෙත්ති මයා | නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (ව්‍යාපෘති) | | | |
| 34. | කේ.එච්.ඩබ්.එම්. කරුණාරත්න මයා | සහකාර අධ්‍යක්‍ෂ | පොහොර තත්ත්ව පාලනය | 2014.11.12 – 2014.12.16 | ඉන්දියා |
| 35. | ඩී.එන්. හෙට්ටිආරච්චි මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | සුළු ගොවීන් කොන්ත්‍රාත් ගොවිතැන හරහා කලාපීය හා ගෝලීය ක්‍රියාදාමයට ඒකාබද්ධ කිරීම පිළිබඳ වැඩමුළුව | 2014.11.03 – 2014.11.07 | වියට්නාම ය |
| 36. | එම්.කේ.ජී.එස්.පී .කේ. ජයසේකර මයා | අධ්‍යක්‍ෂ (සැලසුම්) | ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම, දිළිඳුකම පිටු දැකීම තුළින් තිරසාර කෘෂිකර්මාන්තයක අවශ්‍යතාව පිළිබඳ වැඩමුළුව | 2014.11.24 – 2014.11.28 | ඉන්දුනිසියා |
| 37. | ආචාර්ය ජේ.ඩී.එච්. විජේවර්ධන මහතා | අධ්‍යක්‍ෂ (කාබනික පොහොර) | තිරසාර සංවර්ධනය සඳහා ජල සම්පත් කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | 2014.12.03 | ඉන්දියා |

## *1.3 වත්කම් අත්පත් කර ගැනීම්*

* <u>*මිලදී ගත් වාහන.*</u>

| වාහන අංකය | වාහන වර්ගය | වටිනාකම (රු.මි.) | මිලදී ගත් දිනය |
|---|---|---|---|
| **CAB 3218** | ටොයෝටා ලෑන්ඩ්කෲෂර් ජීප් | **33.0** | ***2014.11.03*** |
| **CAB 4184** | ටොයෝටා ලෑන්ඩ්කෲෂර් ජීප් | **38.5** | ***2014.11.03*** |
| **CAB 4182** | ටොයෝටා ලෑන්ඩ්කෲෂර් ජීප් | **38.5** | ***2014.11.03*** |
| **PF 7317** | ටොයෝටා හයිලක්ස් ඩබල් කැබ් | **7.1** | ***2014.12.08*** |
| **PF 7316** | ටොයෝටා හයිලක්ස් ඩබල් කැබ් | **7.1** | ***2014.12.08*** |
| **PF 7319** | ටොයෝටා හයිලක්ස් ඩබල් කැබ් | **7.1** | ***2014.12.08*** |
| **PF 8351** | ටොයෝටා හයිලක්ස් ඩබල් කැබ් | **7.1** | ***2014.12.08*** |
| **PF 8350** | ටොයෝටා හයිලක්ස් ඩබල් කැබ් | **7.1** | ***2014.12.08*** |
| **PF 7314** | ටොයෝටා හයිලක්ස් ඩබල් කැබ් | **7.1** | ***2014.12.08*** |
| **PF 7313** | ටොයෝටා හයිලක්ස් ඩබල් කැබ් | **7.1** | ***2014.12.08*** |
| **PF 7318** | ටොයෝටා හයිලක්ස් ඩබල් කැබ් | **7.1** | ***2014.12.08*** |
| **PF 7320** | ටොයෝටා හයිලක්ස් ඩබල් කැබ් | **7.1** | ***2014.12.08*** |
| එකතුව | | **173.9** | |

* <u>*ලීසිං කර ලබාගත් වාහන.*</u>

| වාහන අංකය | වාහන වර්ගය | වටිනාකම (රු.මි.) |
|---|---|---|
| **KY 3832** | නිෂාන් ටියානා කාර් | **14.7** |
| **PF 7652** | මිට්ෂුබිෂි L200 කැබ් | **7.2** |
| **PF 7661** | මිට්ෂුබිෂි L200 කැබ් | **7.2** |
| **PF 7641** | මිට්ෂුබිෂි L200 කැබ් | **7.2** |
| **PF 7657** | මිට්ෂුබිෂි L200 කැබ් | **7.2** |
| **PF 7639** | මිට්ෂුබිෂි L200 කැබ් | **7.2** |
| එකතුව | | **50.7** |

## *1.4 අලුත්වැඩියා, ඉදිකිරීම් හා නඩත්තු කටයුතු.*

| නඩත්තු කටයුතු | වියදම (රුපියල්) |
|---|---|
| 1. අමාත්‍යාංශ ගොඩනැඟිල්ලේ වහල, සීලිම් සහ අනෙකුත් අලුත්වැඩියාවන් | **19,294,261.31** |
| 2. ගොඩනැඟිල්ලේ හා අල්මාරි/ කබඩ් වල තීන්ත ආලේප කිරීම | **19,297.72** |
| 3. වැසිකිලි අලුත්වැඩියා කිරීම් | **28,478.60** |
| 4. තිරරෙදි පිරිසිදු කිරීම් | **4,850.00** |
| 5. ගලි පිරිසිදු කිරීම සඳහා ගලි රථ සේවා ලබා ගැනීම | **72,173.12** |
| 6. කාමර වෙන්කිරීම් | **4,828.65** |
| 7. විදුලි සෝපානය අලුත් වැඩියා කිරීම් හා සේවා කටයුතු | **178,002.00** |

# 02 අමාත්‍යාංශයේ ප්‍රධාන සංවර්ධන වැඩසටහන්

**2014** මුදල් වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ප්‍රධාන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වූ අතර, ඒ සඳහා වෙන් කළ ප්‍රතිපාදනයන් වර්ෂය තුළ නැවත සංශෝධනයට ලක් විය. **2014.12.31** දිනට **81%** ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගැනිමට හැකිවිය.

**<u>2014 වර්ෂයේ අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වූ ප්‍රධාන සංවර්ධන වැඩසටහන්</u>**

| අනු අංක | වැඩසටහන | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි) | සංශෝධිත ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 1. | ආහාර සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීමේ විශේෂ සංවර්ධන වැඩසටහන | 420 | 281.85 | 281.8 | 100 |
| 2. | කාබනික පොහොර නිෂ්පාදන හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන | 270 | 197.17 | 197.16 | 100 |
| 3. | කෘෂිබෝග අස්වනු පුරෝකථන වැඩසටහන | 5 | 2.7 | 2.7 | 100 |
| 4. | ලොකු/රතු ළූණු බීජ නිෂ්පාදන වැඩසටහන | 30 | 15.5 | 15.5 | 100 |
| 5. | සහල් අපනයන වැඩසටහන | 75 | 39 | 39 | 100 |
| 6. | "දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය" | 50 | 32.9 | 29.7 | 66 |
| 7. | ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම | 20 | 11.25 | 11.25 | 100 |
| | මුළු එකතුව | 850 | 569.12 | 565.86 | 99 |

**2014** වර්ෂයේදී ක්‍රියාත්මක කළ සියලුම සංවර්ධන වැඩසටහන් රටේ කෘෂිකාර්මික උන්නතිය සඳහා සෘජු දායකත්වයක් ලබා දෙන ලදි. එහිදි වැඩසටහන් අනුව ලබා ගත් භෞතික ප්‍රගතිය පහත පරිදි දක්වා ඇත.

## 2.1 ආහාර සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීමේ විශේෂ සංවර්ධන වැඩසටහන.

### 2.1.1 <u>අතිරේක ආහාර බෝග ප්‍රවර්ධන වැඩසටහන</u>

| | |
|---|---|
| වෙන් කල ප්‍රතිපාදනය (රු.මි.) 300 | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) 130.579 |

**2014** දෙසැම්බර් මස මහා භාණ්ඩාගාරය විසින් සිදු කරන ලද සංශෝධනයට අනුව මෙම වැඩසටහනේ ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. **72** දක්වා අඩු කරන ලදී.

අතිරේක ආහාර බෝග ප්‍රවර්ධන වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වනුයේ **2016** වර්ෂය වන විට ශ්‍රී ලංකාව අතිරේක ආහාර බෝග වලින් ස්වයංපෝෂිත වීමයි.

සෝයා, උඳු, මුං ඇට, මිරිස්, ලොකු ළූණු, රතු ළූණු, රට කජු, කුරක්කන්, තල යනා දී බෝග ප්‍රධාන වශයෙන් අතිරේක ආහාර බෝග ලෙස සැලකේ. මෙම වැඩසටහන **2014** වර්ෂයේදී ප්‍රධාන වශයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන ලබා දීම මගින් හා තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයක දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්‍ෂවරුන් මගින් ක්‍රියාත්මක කෙරුණි. මේ යටතේ මිරිස් හෙ.ක් **4178.1** ක් ද මුං හෙක්ටයාර **402.23** ක්ද ලොකු ළූණු හෙක්ටයාර **403.7** ක් ද පොප්කෝන් හා බඩ ඉරිඟු

හෙක්ටයාර 40 ක් ද වගා කර ඇත.මීට අමතරව කව්පි, රටකජු, තල වැනි බෝගද සුළු වශයෙන් වගා කර ඇත.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලැබූ ජාතික මිරිස් වගා වැඩසටහන මුළු මිරිස් වගාවෙන් හෙක්ටයාර 3,710 කට හිමිකම් කියයි. මීට අමතරව මෙම වැඩසටහන යටතේ වගා මළු මිලියනයක මිරිස් වගා කිරීම ද ජාතික මිරිස් වගා වැඩසටහන යටතේ ක්‍රියාත්මක කෙරුණි. ශ්‍රී ලංකාව තුළ මිරිස් සඳහා ඇති සැලකිය යුතු ඉල්ලුම සපුරාලීමට මෙම මිරිස් වගා වැඩසටහන දායකත්වයක් ලබා දී ඇත.

මීට අමතරව අතිරේක ආහාර බෝග බීජ ගබඩා කිරීම සඳහා රජයේ ගොවිපලවල්වල බීජ ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීම, ජල සම්පාදන පද්ධති වැඩිදියුණු කිරීම, මානුෂීය කෘෂි සත්කාර වැඩසටහන යටතේ අතිරේක බීජ හා කෘෂි උපකරණ ලබා දීම, ගොවිපල සංවර්ධන වැඩසටහන යටතේ රජයේ ගොවිපලවල්වල උපකරණ අළුත්වැඩියා කිරීම හා කෘෂි ළිං ඉදිකිරීම, අතිරේක ආහාර බෝග ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා උපකරණ මිලදී ගැනීම, එම නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සිදු කර ඇත.

මීට අමතරව අනුරාධපුරය, මාතලේ, හම්බන්තොට, ත්‍රිකුණාමලය, මාතර, පුත්තලම, කුරුණෑගල, කළුතර යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ප්‍රතිපාදන ලබාදීම තුළින් අතිරේක ආහාර බෝග වගා කර ඇත.

### 2.1.2 වාණිජ ගොවිපල වැඩසටහන

| | |
|---|---|
| වෙන් කල ප්‍රතිපාදනය - රු.මි. 60.0 | මූල්‍ය ප්‍රගතිය - රු.මි. 51.305 |

මෙම වැඩසටහන යටතේ වාණිජ මට්ටමින් වගා කරනු ලබන ගොවින් 500 ක් සඳහා 50% ගොවි දායකත්ව පදනම මත ඔවුන්ට අවශ්‍ය කෘෂි යෙදවුම් ලබා දීමට සැලසුම් කරන ලදී.

ඒ අනුව සියලුම දිස්ත්‍රික්ක වලින් සුදුසුකම් සපුරාලන ගොවින් තෝරා ගෙන ඔවුන්ට අවශ්‍ය ක්ෂේත්‍ර චාරිකා හා පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සඳහා හා කෘෂි යෙදවුම් ලබා දීම සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

හඳුනා ගත් වාණිජ ගොවින් අතරින් 264 දෙනෙකු වෙත ප්‍රතිලාභ ලබා දීම සඳහා රු.මි. 51.305 ක වියදමක්දරා ඇත.

ඒ යටතේ රෝද 2 අත් ට්‍රැක්ටර් 1, දියර ඉසින යන්ත්‍ර 1, ජල පොම්ප 5, කොන්ක්‍රීට් කණු 524, නළ ළිං 1, බිම්මල් ගෘහ 17, ආරක්ෂිත ගෘහ 47, ජල සම්පාදන පද්ධති 10, පලිබෝධනාශක විදින යන්ත්‍ර 1, කොම්පෝස්ට් නිෂ්පාදන ගොඩනැගිලි 1, උදළු 5, තල බීජ 6 kg, ප්ලාස්ටික් කූඩ 30, අන්නාසි පැළ 63,000, මී මැසි පෙට්ටි 06 ක් හා බැරල් 30 ලබා දීමට කටයුතු කර ඇත.


ආරක්ෂිත ගෘහය තුළ සලාද පිපිඤ්ඤා වගාව. ජනක සිරිමාන්න මයා -


ආරක්ෂිත ගෘහ තුළ ඕකිඩ් වගාව රසිකා දිල්රුක්ෂි මෙනෙවිය - 92,

## 2.1.3 තරුණ කෘෂි ව්‍යවසායකත්ව මෙහෙයුම් වැඩසටහන

| වෙන්කල ප්‍රතිපාදනය - (රු.මි.) 60 | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) - 43.55 |
| --- | --- |




කෘෂිකාර්මික කටයුතු පිළිබඳව උනන්දුවක් ඇති තරුණ ප්‍රජාව කෘෂි කර්මාන්තයට නැඹුරු කර ගැනීමේ අරමුණින් 2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන තරුණ කෘෂි ව්‍යවසායකත්ව මෙහෙයුම් වැඩසටහන සඳහා වයස අවු 18 – 40 අතර වයස් කාණ්ඩයේ සිටින තරුණ තරුණියන් 1000 කට වැඩි පිරිසක් දිස්ත්‍රික්ක 25 න් තෝරා ගෙන වසර පහක් පුරා ක්‍රියාත්මක කරමින් යන මෙම වැඩසටහනට රාජ්‍ය හා පෞද්ගලික අංශය සාර්ථක ලෙස පවත්වා ගෙන යනු ලබන කෘෂිකාර්මික ක්ෂේත්‍රයන් අධ්‍යයනය කිරීමත්, කෘෂිකාර්මික දැනුම ලබා දීමේ අදහසින් නේවාසික, තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීමත්, සිදු කරනු ලබයි.

ඒ අනුව 2014 වර්ෂය සඳහා මෙම වැඩසටහනට රු.මි. 60 ක් වෙන් කර තිබුණි. ඒ සඳහා තරුණයින් 1000ක් ඉලක්ක කර තිබූ අතර, 2014.12.31. දිනට එහි ප්‍රගතිය වශයෙන් ව්‍යවසායකයින් 994 ක් සම්බන්ධ කොට ඔවුන්ට ප්‍රතිලාභ ලබාදීමට රු.මි. 43.55 ක් වැය කොට ඇත.

මේ සඳහා තෝරා ගනු ලබන තරුණ තරුණයින් කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීමෙන් පසු ඔවුන්ට 50% දායකත්වය යටතේ මිරිස් බීජ, අන්නාසි හා පැපොල් බීජ පැළ, කෘෂි උපකරණ හා රෝපණ ද්‍රව්‍ය ලබා දීමත්, සිදු කරනු ඇත. ඒ අනුව 2014 වර්ෂයේ දිස්ත්‍රික්ක ගණනාවක තරුණ ව්‍යවසායකයින් සඳහා ආරක්ෂිත ගෘහ 12, දැල් ගෘහ 04, බිම්මල් ගෘහ 27, ගවමඩු 80, ගවගාල් 01, වතුර මෝටර් 19, ජලනල පද්ධති, වගා ලිං හා රෝපණ ද්‍රව්‍ය ලබාදීම සාර්ථක ලෙස සිදු කර ඇත. මෙම වැඩසටහන සමඟ අඛණ්ඩව සිටින කෘෂි ව්‍යවසායකයින් සඳහා සහතික පත්‍ර පිරිනැමීමක් සිදු කරනු ලබන අතරම, ඉදිරියේදී වාණිජ ගොවිපල වැඩසටහනට ඔවුන්ව සම්බන්ධ කර ගැනීමට කටයුතු සලසා ඇත.

## 2.1.4 "මානුෂීය කෘෂි සත්කාරය" වැඩසටහන පවුල් 1300

උතුරු නැගෙනහිර ප්‍රදේශයේ පැවති යුධමය තත්ත්වයෙන් පසුව නැවත ජීවන තත්ත්වය ගොඩ නැගීම සිදු කරනු ලබන ප්‍රජාවගේ ජීවන වෘත්තීන් හා ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් කිරීමේ අරමුණින් ඔවුන් කෘෂිකාර්මික කටයුතු සඳහා යොමු කිරීමට "මානුෂීය කෘෂි සත්කාරය" ව්‍යාපෘතිය හඳුනා ගත් ගොවි පවුල් 1,300 ක් ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා හදබිම අධිකාරිය හරහා ක්‍රියාත්මක කරන ලදී.

| වෙන් කල ප්‍රතිපාදනය : රු.මි. 5.251 | මූල්‍ය ප්‍රගතිය : රු.මි. 4.499 |
| --- | --- |

භෞතික ප්‍රගතිය :- වවුනියාව දකුණු ප්‍රදේශයේ නැවත පදිංචි කරන ලද ගොවි ප්‍රජාව සඳහා මූලික දැනුවත් කිරීමේ වැඩසටහන් 07 ක් පවත්වා ඇත. තෝරාගත් පවුල් 1300 ක් සඳහා කෘෂි උපකරණ කට්ටල 1300 ක් ලබා දීම හා අක්කර 1300 ක් සඳහා මුං බීජ 1798 kg / කව්පි බීජ 1774 kg/මිරිස් බීජ 115 kg /රටකජු බීජ 1000 kg වශයෙන් ලබා දී ඇත.

## 2.1.5. ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය හරහා ක්‍රියාත්මක කළ වැඩසටහන්

- *පෝෂණ මල්ල ව්‍යාපෘතිය*

| | |
|---|---|
| වෙන් කල ප්‍රතිපාදනය : රු.මි. 67.575 | මූල්‍ය ප්‍රගතිය : රු.මි. 39.279 |

**භෞතික ප්‍රගතිය :- ඒ අනුව මෙම වැඩසටහන යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ 24,436 ක්ද මොණරාගල හා හම්බන්තොට දිස්ත්‍රික්කවල පිළිවෙලින් 21,009 හා 33,288 ක් වශයෙන් මුළු පෝෂණ මලු 78,733ක් ලබා දී ඇත.**

- *දේශිය ආහාර ප්‍රවර්ධන වැඩසටහන*

**භෞතික ප්‍රගතිය :- දේශිය ආහාර භාවිතය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිස්ත්‍රික් මට්ටමෙන් හා ගම් මට්ටමින් ජනතාව දැනුවත් කිරීමේ ප්‍රායෝගික වැඩමුළු පැවැත්විම මෙම වැඩසටහනින් සිදුවිය.**

| | |
|---|---|
| වෙන් කල ප්‍රතිපාදන - රු.මි. 6.21 | මූල්‍ය ප්‍රගතිය - රු.මි. 5.227 |

**භෞතික ප්‍රගතිය :- කිලිනොච්චි, මොණරාගල හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල ගම් මට්ටමේ වැඩසටහන් 105 ක් හා දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් 31 ක් ක්‍රියාත්මක කර ඇත.**

- <u>ගොවිපල සංවර්ධන වැඩසටහන</u>

| වෙන් කල ප්‍රතිපාදන - රු.මි. 6.21 | මූල්‍ය ප්‍රගතිය - රු.මි. 3.00 |
|---|---|

| ගොවිපලවල් | වී වගාව | එලවළු වගාව | අතිරේක ආහාර බෝග වගාව | ගොවිපල උපකරණ අළුත්වැඩියාව | වගා ලිං ඉදි කිරීම | පරණ ගොඩ නැගිලි අළුත් වැඩියා | අලිවැට ඉදි කිරීම | පවතින බෝග නඩත්තුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1.තණමල්විල ගොවිපල | සුවදැල් අක්කර 4.5 බීජ වගා කර ඇත. | මුරුංගා පැළ 100 ක් වගා කර ඇත. වට්ටක්කා අක්කර ¼ , මෑ කරල් අක්කර ¼ වගා කර ඇත. බටු පැළ (අක්කර ¼) තවාන් දමා ඇත. | අක්කර 01 ක ප්‍රමාණයක් වගා කර ඇත. (බඩ ඉරිඟු) | ට්‍රැක්ටර් 01,නගුල් 01, ට්‍රැක්ටරයේ හයිඩ්‍රොලික් පද්ධතිය අළුතින් දැමීමක් සිදු කර ඇත. උදළු, කැති, බැටරි, ට්‍රේලරයේ කොටස් මිලදී ගන්නා ලදී. | වගා ලිං 01 | ගොඩ නැගිලි 01 | | අඹගස් 60, පොල් ගස් 50ක් වගා කර ඇත. කෙසෙල් හා දොඩම් අක්කර 01 ක වගා කර ඇත. |
| 2.බුත්තල ගොවිපල | | වම්බටු (අක්කර ¼ කට අස්වැන්න 5 kg ), බෝංචි වගාව (අක්කර ¼ කට අස්වැන්න 6kg ), මිරිස්, තක්කාලි, බටු, මෑ, වට්ටක්කා, කරවිල අක්කර1ක වගා කර ඇත. | අක්කර 3 ½ වගා කර ඇත. (බඩ ඉරිඟු) | ට්‍රැක්ටරය/ ට්‍රැක්ටර්ට්‍රේලරය අළුත්වැඩියාව, තණකොල කපන යන්ත්‍ර 01, උදළු පිහි මිලදී ගන්නා ලදී. | වගා ලිං 02 | | 1km පමණ දිග අලි වැටක් ඉදි කර ඇත. | |

## 2.2 කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන

| වෙන්කල ප්‍රතිපාදන:-රු.මි.270 | මූල්‍ය ප්‍රගතිය :-රු.මි.197.17 |
|---|---|

අප රටේ භාවිතා කරනු ලබන රසායනික පොහොර ප්‍රමාණයෙන් 95% ක් පමණ විදේශ රටවලින් ආනයනය කරනු ලබන අතර පොහොර ලෙස දේශීයව නිපදවනු ලබන්නේ එප්පාවල රොක් පොස්පේට් හා මැග්නීසියම් පෝෂ්‍ය පදාර්ථය සපයනු ලබන ඩොලමයිට් පමණි. රසායනික පොහොර ආනයනය සඳහා වාර්ෂිකව විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැයකරනු ලබන අතර දිනෙන් දින ලෝක වෙළෙඳපොලේ රසායනික පොහොරවල මිල ඉහල යමින් පවතී. මෙම තත්ත්වය ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටවලට දරාගැනීම අපහසුවී ඇත.

දිවයිනේ බොහෝ ප්‍රදේශවල වගා පසෙහි සාරවත්බව අඩුබව සිදුකරන ලද පර්යේෂණ හා විශ්ලේෂණ ගණනාවක් මඟින් පෙනී ගොස් ඇත. පසේ සමස්ත සාරවත්භාවය රැකගැනීම සඳහා පසට අනිවාර්යයෙන්ම කාබනික පොහොර යෙදිය යුතු වේ. එමෙන්ම කාබනික පොහොර යෙදීම මඟින් බෝගවලට යෙදිය යුතු රසායනික පොහොර ප්‍රමාණය අඩු කර ගතහැකි බව මේ ආශ්‍රිතව කරන ලද පර්යේෂණවලින් පෙන්වා දී ඇත.

කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම ජාතික අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන ඇති අතර 2008 වර්ෂයේ සිට කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීම සඳහා දිවයින පුරා විවිධ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කර ගෙනයනු ලැබේ.

පසුගිය වර්ෂ වලදී මෙන්ම 2014 වර්ෂයේද මෙම වැඩසටහන යටතේ දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක වල විවිධ ක්‍රියාකාරකම් රැසක් සිදු කර ඇත. ග්‍රාමීය මට්ටමින් කාබනික පොහොර භාවිතා කරමින් වී, එළවළු, ලොකු ළූණු හා අර්තාපල් ආදර්ශන 4,894 ක් ස්ථාපනය කර ඇත. එම ආදර්ශන සඳහා භාවිතා කිරිමට කොම්පෝස්ට් මෙ.ටො. 3,092 ක් යොදා ඇති අතර කාබනික පොහොර භාවිතා කරමින් මුං බීජ අක්කර 465ක් වගාකර ඇත.

2014 වර්ෂය තුළදී දිස්ත්‍රික්ක මඟින් හා කාබනික පොහොර ව්‍යාපෘතියේ නියමු මධ්‍යස්ථානය වන මාකඳුර ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය මඟින් හා දිස්ත්‍රික් මට්ටමින් නිලධාරීන් හා ගොවීන් 25,752 ක් පුහුණු කර ඇති අතර කොම්පෝස්ට් නිෂ්පාදනය හා භාවිතය පිළිබඳ අත්පත්‍රිකා 154,070 ක් බෙදා හැර ඇත.

මෙම ව්‍යාපෘතියේ දායකත්වයෙන් 2014 වර්ෂයේදී මාකඳුර, ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා හදබිම අධිකාරිය හා දිස්ත්‍රික් මට්ටමින් කොම්පොස්ට් මෙ.ටො. 92,919 ක් පමණ නිෂ්පාදනය කර ඇත.



පොළොන්නරුව, මහවැලි බී කලාපයේ ගොවී පුහුණු වැඩසටහනකදී කාබනික පොහොර නිෂ්පාදනය කරන අයුරු

කොම්පෝස්ට් කි.ග්‍රෑම්. 1 ක මිල රු. 7.00 ක් ලෙස සැලකීමේදී නිෂ්පාදනය කරන ලද කොම්පොස්ට් පොහොර ප්‍රමාණයෙහි මූල්‍ය වටිනාකම රු.මි. 650 ක් පමණ වේ. මෙම සමස්ත වැඩසටහන සඳහා වැය කළ මුළු මුදලට වඩා නිෂ්පාදනය වූ කොම්පොස්ට්හි මූල්‍ය වටිනාකම වැඩිවීම මෙහිදී වැදගත් වේ.

මීට අමතරව වෙනත් විවිධ ක්‍රියාකාරකම් රාශියක් ද මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කර ඇත. මාකඳුර නියමු මධ්‍යස්ථානය මඟින් කොම්පොස්ට් නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා කි.ග්‍රෑම්. 5 මුහුන් පැකට් 16,772ක් ගොවීන් අතරේ බෙදා හැර ඇති අතර කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම සඳහා ප්‍රදර්ශණ 4 ක් පවත්වා ඇති අතර කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගන්නා විවිධ අමුද්‍රව්‍ය, පස් හා කොම්පොස්ට් සාම්පල් 2,329ක් රසායනික සංයුතිය සඳහා විශ්ලේෂණය කර ඇති අතර ඒවායේ පෝෂ්‍ය පදාර්ථ හා බැර ලෝහ පිළිබඳ විශ්ලේෂණයන්ද සිදු කර ඇත.



මාකඳුර නියමු මධ්‍යස්ථානයේ ඉදි කරන ලද දේශන ශාලාව

එම ක්‍රියාකාරකම් වලට අතිරේකව කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම සඳහා තත්පර 30 බැගින් වන කෙටි දැන්වීම් 6ක් නිෂ්පාදනය කර දින 50ක් ප්‍රචාරය කිරීම. විනාඩි 15 බැගින් වන රූපවාහිනී වැඩසටහන් 4ක් නිෂ්පාදනය කර ප්‍රචාරණය කර ඇති අතර තත්පර 15 හි ගුවන් විදුලි කෙටි පණිවුඩ 420ක් ප්‍රචාරණය කරන ලදී.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් දිස්ත්‍රික්ක පුරා ඇති පුරන් කුඹුරු අක්කර 850ක් කාබනික පොහොර භාවිතා කරමින් වගා කිරීමට ඉලක්ක කර ගනිමින් අක්කර 894 ක් අස්වද්දා වගා කර එම ඉලක්කය සම්පූර්ණ කර ඇත. එමෙන්ම “සන්හෙඩ්” කොළ පොහොර බීජ කි.ග්‍රෑම් 1540 ක් නිෂ්පාදනය කර ගොවීන් අතරේ බෙදා දීම ද සිදු කර ඇත.

ඉහත සිදු කරන ලද ක්‍රියාකාරකම් වලට අමතරව මෙම ව්‍යාපෘතිය මඟින් මෙම වැඩසටහනේ නියමු මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කරනු ලබන මාකඳුර ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2012 වර්ෂයේ මැයි මස 10 වෙනි දින මුල් ගල තබා ආරම්භ කල පුහුණු ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු මේ වන විට අවසන් කර ඇත.

## 2.3 කෘෂිබෝග නිෂ්පාදන පුරෝකථන වැඩසටහන

| වෙන් කළ ප්‍රතිපාදන :- රු.මි. 5.00 | මූල්‍ය ප්‍රගතිය :- රු.මි. 2.70 |
|---|---|

**අරමුණු :-**

ගොවි නිෂ්පාදන වැඩි වශයෙන් වෙළඳපලට පැමිණෙන කාල සීමාවේ දී ආනයනය සීමා කර එම නිෂ්පාදන වලට සාධාරණ මිලක් ලබා දීම, දේශීය නිෂ්පාදනය හිඟ කාලයන්හී දී පාරිභෝගිකයාට පහසු මිලට ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට හැකිවන අයුරින් ආනයන බදු සංශෝධනය කිරීම, වෙළඳපොළ පදනම් කරගත් වගා සැලැස්මක් හා වගා රටාවක් ඇති කොට අලෙවිකරණ ගැටළු අවම කර ගැනීම, ජාතික අවශ්‍යතාවයන් පදනම්කර ගෙන මාසික ඉලක්ක මත නිෂ්පාදනය කිරීමට ගොවීන් නැඹුරු කිරීම තුළින් අධිකත්වය හා අපතේ යාම අවම කිරීම, නිෂ්පාදකයාට තම නිෂ්පාදන සඳහා ලාභදායී මිලක් ලබා ගැනීමට හා පාරිභෝගිකයාට එම නිෂ්පාදන හා වෙළඳපොළ තොරතුරු හුවමාරුව තුළින් නිෂ්පාදකයින්, වෙළඳුන් හා පාරිභෝගිකයින් දැනුවත් කිරීම, බෝග නිෂ්පාදන පුරෝකථනය තුළින් ලබා ගන්නා ඉහල විශ්වසනීයත්වයකින් හා නිරවද්‍යතාවයකින් යුතු තොරතුරු ප්‍රාදේශීය සැලසුම්කරණයට හා ජාතික ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට යොමු කරවීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණු වේ.

**මූල්‍ය ප්‍රගතිය :-**

වැඩසටහන සඳහා **2014** වසර ට රු. මි. **5.00** ක් වෙන් වූ අතර, **2014** අවසාන කාර්තුවේදී එය රු.මි. **2.35** දක්වා සංශෝධනය කරන ලදී. මේ අනුව දෙසැම්බර් **31** වන විට රු. මි. **2.70** මූල්‍යමය ප්‍රගතියක් ලබා ඇත.

**භෞතික ප්‍රගතිය :- 2014** වසරේ දී පහත සඳහන් වාර්තා ප්‍රකාශයට පත් කර ඇත.

- **2013/14** මහ කන්නයේ ජනවාරි මස අග වන විට කෘෂිබෝග නිෂ්පාදන ප්‍රගතිය හා පුරෝකථනය.
- **2014** මැයි දක්වා කෘෂි බෝග නිෂ්පාදන තත්ත්වය.
- **2014** යල කන්නයේ ලොකුළූණු වගාව පිළිබඳ ප්‍රගතිය හා නිෂ්පාදන පුරෝකථනය.
- **2014** යල කන්නයේ වී වගාවේ ප්‍රගතිය, නිෂ්පාදන පුරෝකථනය සහ **2014** වර්ෂයේ වී සහ සහල් සුලභතාවය පිළිබඳ වාර්තාව.
- **2014** ජුනි දක්වා කෘෂිබෝග නිෂ්පාදන ප්‍රගතිය.
- කෘෂිකාර්මික බෝග නිෂ්පාදන ප්‍රගතිය හා නිෂ්පාදන පුරෝකථනය **2014** යල .

සහල්, ලොකුළූණු සහ අර්තාපල් සඳහා ආනයනයට අදාළ බදු සීමා සංශෝධනයේ දී ඉහත වාර්තා උපයෝගී කර ගන්නා ලදී. මෙම සංශෝධන මඟින් ගොවි නිෂ්පාදන වැඩි වශයෙන් වෙළඳපලට පැමිණෙන කාල සීමාවලදී ආනයනය අවම කර ගැනීමටත්, එමඟින් නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබා ගැනීමටත් හැකියාව ලැබිණි.

<u>ආකෘති පත්‍ර , ලිපිලේඛන බෙදා හැරීම හා නිලධාරීන් දැනුවත් කිරීම</u>

**2014** යල සහ **2014/15** මහ කන්නයට අදාළ ලිපිලේඛන, ආකෘති පත්‍ර හා සාරාංශ වාර්තා මුද්‍රණය කොට දිස්ත්‍රික් **18** කට බෙදා හැරීම සිදු කරන ලදී.
ප්‍රාථමික දත්ත සැපයුම්කරුවන් වන කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ගේ අධීක්ෂණ කටයුතු භාර ප්‍රාදේශීය සංවර්ධන නිලධාරීන්, දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ

ප්‍රධානත්වයෙන් පැවත්වෙන මාසික දිස්ත්‍රික් රැස්වීම් වල දී දැනුවත් කරන ලද අතර, 2014 වසරේ දිස්ත්‍රික්ක 08 ක අදාළ දැනුවත් කිරීම් සිදු කරන ලදී.

## *<u>මූල්‍ය ප්‍රතිපාදන යොදා නොගත් අනෙකුත් වැඩසටහන් - 2014 වර්ෂය</u>*

### 1. <u>2014 බෝග නිෂ්පාදන සැලැස්ම සකස් කිරීම.</u>

ශ්‍රී ලංකාවේ ආහාර අවශ්‍යතාවය සැපිරීමට අවශ්‍ය කෘෂිකාර්මික බෝග නිෂ්පාදන ඉලක්ක ඇතුළත් සැලැස්ම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බෝග පිළිබඳ විශේෂඥයන්ගේ එකඟතාවයෙන් සකස් කරන ලද අතර, අදාළ සියලු රාජ්‍ය ආයතනවලට බෙදා හරින ලදී.

### 2. <u>කෘෂිකාර්මික විෂය සම්බන්ධ දත්ත පද්ධතිය පවත්වා ගැනීම හා දත්ත ලබාදීම.</u>

මෙම දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, වෛද්‍ය පර්යේෂණ ආයතනය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් දත්ත එක්රැස් කිරීමත්, ශ්‍රී ලංකා මහ බැංකුව, මහා භාණ්ඩාගාරය ඇතුළු බොහෝ රජයේ ආයතන හා නිලධාරීන්ටත්, පෞද්ගලික ආයතන හා පුද්ගලයින් වෙතත් දත්ත ලබාදීම සිදු කරන ලදී.

### 3. <u>කන්න ප්‍රගති සමාලෝචන වාර්තා සකස් කිරීම.</u>

කන්න අවසානයේ ප්‍රගති වාර්තා ක්ෂේත්‍රයෙන් ලබා ගනිමින්, Seasonal Review, Maha 2013/14 වාර්තාව නිකුත් කර ඇත.

### 4. <u>ඉලක්කවලට අදාළ ප්‍රගතිය මාසිකව සමාලෝචනය කිරීම.</u>

ප්‍රාදේශීය කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් මඟින් මාසිකව ඉලක්කවලට අදාළ ප්‍රගති වාර්තා ලබා ගනිමින් අදාළ ප්‍රගතිය මාසිකව සමාලෝචනය කර ඇත.

## 2.4 ලොකු ළූණු/රතු ළූණු බීජ නිෂ්පාදන වැඩසටහන්

### 2.4.1 ලොකු ළූණු බීජ නිෂ්පාදන වැඩසටහන

මෙම වැඩසටහන 2010 වසරේදී මාතලේ දිස්ත්‍රික්කය මූලික කරගනිමින් ආරම්භ කරන ලදී. මේ වන විට අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල හා බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කරනු ලැබේ. 2014 වර්ෂයේදී මෙම වැඩසටහන අනුරාධපුර (පළාත් හා අන්තර් පළාත් බල ප්‍රදේශ තුළ), බදුල්ල (හසලක), පොළොන්නරුව හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක තුළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 20.0 ක ප්‍රතිපාදන වෙන් කළ අතර අනුරාධපුර (පළාත්) රු.මි.8.0 ක් ද, අනුරාධපුර (අන්තර් පළාත්) රු.මි.5.5 ක් ද, පොළොන්නරුව රු.මි.3.0 ක් හා හසලක රු.මි.0.5 ක් වශයෙන් ප්‍රතිපාදන ලබාදෙන ලදී.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මව් බීජ බල්බ කි.ග්‍රෑ 24,261 ක් මිලදී ගෙන ඇති අතර ගොවීන්ගෙන්ද ලබාගත් මව්බීජ බල්බ ඇතුළුව කි.ග්‍රෑ 205,139 ක් රහංගල හා සීතාඑළිය ප්‍රදේශයේදී සිදුකළ වසන්තීකරණ කටයුතු වලින් අනතුරුව නැවත ගොවීන් වෙත බෙදා දීම සිදු කර ඇත. ලොකු ළූණු වගාව සඳහා අවශ්‍ය යෙදවුම් සැපයීම, ලොකුළූණු මල් වැස්සෙන් හා පින්නෙන් ආරක්ෂා කර ගැනීම සඳහා පොලිතීන් ලබාදීම, මල් කඩා නොවැටී රඳවා ගැනීම සඳහා මාළු දැල් ලබාදීම, ඇසුරුම් කූඩ ලබාදීම, යල කන්නයේ බීජ අස්වනු ගබඩා කිරීම සඳහා රාක්ක සැපයීම හා බීජ වල ගුණාත්මක භාවය ආරක්ෂා වන පරිදි බීජ ඇසුරුම් ලබාදීම වැනි ක්‍රියාකාරකම් 50% ගොවි දායකත්වය යටතේ සිදුකරන ලදී.

2014 වර්ෂ අවසානය වන විට, ලොකු ළූණු වගාවන් ක්ෂේත්‍රය තුළ ස්ථාපනය කර ඇති අතර අනුරාධපුරය, පොළොන්නරුව හා හසලක ප්‍රදේශ ආශ්‍රිතව අස්වනු ලබාගනිමින් පවතින අතර 2015 වසරේ මාර්තු මාසය වන විට ඉතිරි අස්වනු ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

තවද, පසුගිය වසරේ යල කන්නය තුළ දිවයින පුරා පැවති දැඩි නියං තත්ත්වය හේතුවෙන් මව්බල්බ වසන්තීකරණ කටයුතු අපේක්ෂිත මට්ටමින් සිදුවී නොමැති අතර බෝගය ක්ෂේත්‍රයේ ස්ථාපනය සිදුකරන අවධිය වන විට පැවති වර්ෂාධික කාලගුණික තත්ත්වය නිසා අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී ඇත. වසන්තීකරණ කටයුතු තම බල ප්‍රදේශ ආශ්‍රිතව සිදුකර ගැනීම පිණිස නව ශීතාගාර පහසුකම් ලබාදීම මෙම වසර තුළ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් යටතේ සිදු කිරීමට අපේක්ෂා කෙරේ. එමඟින්, රහංගල / සීතාඑළිය ප්‍රදේශය වෙත ප්‍රවාහනය කිරීමට වැයවන මුදල් ඉතිරි කර ගැනීමට හැකිවේ.

පසුගිය වසර අවසන් වන විට, අනුරාධපුර (පළාත්) රු.මි. 7.107 ක්, අනුරාධපුර (අන්තර් පළාත්) රු.මි. 3.025 ක්, පොළොන්නරුව රු.මි. 0.545 ක් හා හසලක රු.මි. 0.136 ක මුදලක් වියදම් කර ඇත.

## 2.4.2. රතු ළූණු බීජ නිෂ්පාදන වැඩසටහන

රතුළූණු වගා වපසරිය හා නිෂ්පාදනය වැඩි කරමින් දේශීය වශයෙන් සිදු කරනු ලබන රතුළූණු නිෂ්පාදනය තුලින් ස්වයංපෝෂිත මට්ටමට ළඟාවීම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුලින් අපේක්ෂා කෙරේ. රතුළූණු වගාව සඳහා බල්බ භාවිතා කිරීමේදී, හෙක්ටයාරයක් සඳහා මව් බල්බ මෙ.ටො.1.2 - 1.8 පමණ අවශ්‍ය වේ. ස්වයංපෝෂිත මට්ටමට ළඟාවීමට අපේක්ෂිත ඉලක්කය මෙ.ටො.100,000 පමණ වන අතර ඒ සඳහා මව් බල්බ මෙ.ටො.15,000 ට වඩා ප්‍රමාණයක් අවශ්‍ය වේ. සත්‍ය බීජ භාවිතය සඳහා යොමුවීම තුළින් මෙම බීජ ලෙස වෙන් කරන මව් බල්බ ප්‍රමාණයද පරිභෝජනය සඳහා භාවිතා කළ හැකිවේ. රෝපණ ද්‍රව්‍ය ලෙස සත්‍ය බීජ භාවිතා කිරීමේදී වැයවන පිරිවැය මව්බල්බ භාවිතයට සාපේක්ෂව ඉතා අඩු ප්‍රමාණයකි. එබැවින්, වසර 2016 දී රතුළූණු වලින් ස්වයංපෝෂිත වීමේ ඉලක්ක ගත අරමුණ අනුව, විශේෂ ව්‍යාපෘතියක් ලෙස මෙම වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් පසුගිය වසරේදී දිස්ත්‍රික්ක 08 ක් හා මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සඳහා රු.මි.10.0 ක මුදලක් වෙන් කරන ලදී. ඒ අනුව, රත්නපුර දිස්ත්‍රික්කය සඳහා රු.මි. 2.0 ක් ද, යාපනය දිස්ත්‍රික්කයට රු.මි.1.5 ක් ද, ත්‍රිකුණාමලය, පුත්තලම, කිලිනොච්චිය, අම්පාර, හම්බන්තොට (පළාත්) හා හම්බන්තොට (අන්තර් පළාත්) බල ප්‍රදේශයන්ට රු.මි. 1.0 බැගින් වන පරිදි ප්‍රතිපාදන ලබාදෙන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා මව් බීජ කි.ග්‍රෑ 25,126 ක් මිලදී ගෙන, එම මව් බීජ වසන්තීකරණය කටයුතු රහංගල හා සීතාඑළිය ප්‍රදේශයේදී සිදුකිරීමෙන් අනතුරුව ඒවා නැවත ගොවීන් අතර බෙදා දී ඇත.

රතුළූණු වගාව සඳහා අවශ්‍ය යෙදවුම් හා ඇසුරුම් කූඩ සැපයීම, තවාන් ආවරණය සඳහා පොලිතීන් ලබාදීම හා මල් කඩා නොවැටී රඳවා ගැනීම සඳහා මාළු දැල් ලබාදීම යන කටයුතු 50% ගොවි දායකත්වය යටතේ සිදු කර ඇත. ත්‍රිකුණාමලය, යාපනය යන ප්‍රදේශ ආශ්‍රිතව මේ වන විට රතුළූණු බීජ අස්වනු ලබා ගනිමින් පවතින අතර 2015 වසරේ මාර්තු මාසය වන විට ඉතිරි අස්වනු ප්‍රමාණයද ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

පසුගිය වසරේ යල කන්නය තුළ දිවයින පුරා පැවති දැඩි නියං තත්ත්වය හේතුවෙන් මව් බල්බ වසන්තීකරණ කටයුතු අපේක්ෂිත මට්ටමින් සිදුවී නොමැති වීම හේතුවෙන් රත්නපුර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක ආශ්‍රිතව නිෂ්පාදන තත්ත්වය දුර්වල මට්ටමක පවතී. තවද කිලිනොච්චි ප්‍රදේශයට බලපෑ ගංවතුර ආපදා හේතුවෙන් යම් වගා හානි වීමක්ද සිදු වී ඇත.

2014 වසර අවසන් වන විට, ත්‍රිකුණාමලය රු.මි 0.892, යාපනය රු.මි 0.591, කිලිනොච්චි රු.මි. 0.622, අම්පාර රු.මි. 0.98, රත්නපුර රු.මි. 1.022, හම්බන්තොට (පළාත්) රු.මි. 0.519, හම්බන්තොට (අන්තර් පළාත්) රු.මි. 0.426 ක් හා මාධ්‍ය ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් රු.මි. 0.461 ක මුදලක් වියදම් කර ඇත.

## 2.4.3. පොප්කෝන් වගාව ප්‍රචලිත කිරීම සඳහා ප්‍රභේද වැඩි දියුණු කිරීම හා ඒ ආශ්‍රිත තාක්ෂණය දියුණු කිරීමේ වැඩසටහන

2014 වර්ෂයේදී මෙම වැඩසටහන මහ ඉලුප්පල්ලම පිහිටි ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා රු.මි. 1.612 ක ප්‍රතිපාදන ලබාදී ඇති අතර රු.මි. 0.542 මුදලක් වැය කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ ගොවි ක්ෂේත්‍රවල බීජ කි.ග්‍රෑ. 800 ක් නිෂ්පාදනය කර ඇත. මේවා ඊළඟ කන්නයේ බීජ ලෙස බෙදා දීමට අදහස් කෙරේ.

## 2.5 සහල් අපනයන වැඩසටහන

සහල් අපනයන වැඩසටහන සඳහා රුපියල් මිලියන 75 ක ප්‍රතිපාදන වෙන් කරනු ලැබූ අතර ඒ යටතේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි .

### 2.5.1. සහල් අපනයන කලාප පිහිටුවීමේ ව්‍යාපෘතිය

| | |
|---|---|
| වෙන්කල ප්‍රතිපාදන (රු. මි.) 25.0 | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) 2.620 |

අපනයන ගුණාත්මයකින් යුත් සහල් නිපදවීම ඉලක්ක කරගනිමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ඒකාබද්ධව අම්පාර, හම්බන්තොට, පොළොන්නරුව හා මහවැලි B හා C යන සහල් අපනයන කලාප වල පච්චපෙරුමාල්, සුවදැල් හා BG 11/65 අක්කර 162 ක් වගාකරන ලද අතර ඒ යටතේ අපනයන ගුණාත්මයකින් යුත් සහල් මෙ.ටො. 660 නිෂ්පාදනය කරන ලදි. තවද අපනයන ගුණාත්මයකින් යුත් වී නිෂ්පාදනය, ගොවි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා ආදර්ශන 20 ක් පිහිටුවන ලදි.

### 2.5.2. පාරම්පරික වී ප්‍රභේද වල ගුණාත්මක බිත්තර වී නිෂ්පාදනය

| | |
|---|---|
| වෙන්කල ප්‍රතිපාදන (රු. මි.) 3.738 | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) 2.407 |

පාරම්පරික වී ප්‍රභේද වල ගුණාත්මක බිත්තර වී නිෂ්පාදනය ප්‍රවර්ධනය සඳහා දිස්ත්‍රික් 16 ක යාය ආදර්ශන 30 ක් පිහිටුවන ලද අතර එමඟින් සුවදැල්, පච්චපෙරුමාල් යන පාරම්පරික වී ප්‍රභේද වල ගුණාත්මක බිත්තර වී බුසල් 8500 ක් ලබා ගැනීමට අපේක්ෂිතය. ගොවීන් මෙම වගාවට දිරිගැන්වීම සඳහා බිත්තර වී බහාලන ආකර්ෂණීය ලෙස නිර්මාණය කරන ලද පොලිතීන් ඇසුරුම් 1000 ක් ගොවීන් අතර බෙදා දෙන ලදි.

### 2.5.3. පහතරට තෙත් කලාපයේ වී වගාවේ ඵලදායිතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය

| | |
|---|---|
| වෙන්කල ප්‍රතිපාදන (රු. මි.) 3.5 | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) 2.288 |

පහතරට තෙත් කලාපයේ වී අස්වනු ඉහළ නැංවීම සඳහා මාතර, ගාල්ල, කොළඹ, ගම්පහ, කළුතර, රත්නපුර හා කෑගල්ල යන දිස්ත්‍රික්කවල පැරෂූට් ක්‍රමය, හා සින්ක් සල්ෆේට් යොදා අස්වනු ඉහළ නැංවීමේ ආදර්ශන 205 ක් ක්‍රියාත්මක කරන ලදි. මෙම ව්‍යාපෘති යටතේ පැරෂූට් තැටි 38,750 ක් ප්‍රතිලාභීන් අතර බෙදාදෙන ලදි.

## 2.5.4. අපනයනය සඳහා ගුණාත්මක වී ප්‍රභේද හා ආශ්‍රිත තාක්‍ෂණය සහ දේශීය ප්‍රමිතීන් දියුණු කිරීම.

මෙම ව්‍යාපෘතිය සඳහා 2014 වසර තුළදී රු.මි. 25.0 ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර වියදම රු.මි. 16.6 කි. බතලගොඩ පිහිටි වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් ප්‍රාදේශීය මට්ටමින් පිහිටි වී පර්යේෂණ ස්ථානයන් ආවරණය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. මෙමඟින් වැඩි දියුණු කරන ලද ගුණාත්මයෙන් ඉහළ වී ප්‍රභේද නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ. ක්ෂේත්‍රගත පර්යේෂණ වැඩසටහනක් බැවින් මෙය වසර කීපයක් තුළ ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘතියකි.

මේ යටතේ තෝරාගත් ප්‍රභේද හා පෙලපත් කිහිපයකත්, සම්ප්‍රදායික ප්‍රභේද කිහිපයකත් ලක්ෂණ සංසන්දනය කිරීම, සහල් වල ගුණාත්මය කෙරේ පරිසර සාධක හා කළමණාකරණ ක්‍රමවේදයන්හි බලපෑම, අපනයන වෙළඳපල සඳහා සුදුසු ප්‍රභේද නිෂ්පාදනය හා පසුඅස්වනු තාක්‍ෂණ ක්‍රමෝපායන් උපයෝගී කර ගැනීම සම්බන්ධයෙන් අධ්‍යයනය කෙරේ.

## 2.5.5. කුඹුරු ඉඩම් වල පොස්පේට් පොහොර භාවිතය කාර්යක්‍ෂම කිරීම.

2014 වසරේදී මෙම වැඩසටහන සඳහා රු.මි. 3.0 ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර වියදම රු.මි. 1.86 කි. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය බතලගොඩ පිහිටි වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් ක්‍රියාත්මක කෙරේ. මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරනුයේ කන්නයක් හැර කන්නයක් තුළ පොස්පරස් පොහොර භාවිතා කිරීමට ඇති විභවය පිළිබඳව විවිධ ප්‍රදේශ ආවරණය වන පරිදි ක්ෂේත්‍ර මට්ටමින් සිදු කළ පරියේෂණ ප්‍රතිඵල සංසන්දනාත්මකව විශ්ලේෂණය කිරීම වේ. පසුගිය වසර තුළ ප්‍රථම වරට ආරම්භ කරන ලද මෙම වැඩසටහන වගා ආදර්ශන 120 ක් ආවරණය වන පරිදි සිදු කර ඇති අතර ලබාගත් ප්‍රතිඵල අනුව නිගමනයන් කරා එළඹීමට තවදුරටත් මෙම ක්ෂේත්‍ර පරීක්‍ෂණ කටයුතු සිදුකළ යුතුව පවතී.

## 2.5.6. අපනයන වෙළඳපොළ ඉලක්ක කරගත් සහල්වල නිෂ්පාදන තත්ත්වය ප්‍රවර්ධනයට සුදුසු යාන්ත්‍රික ක්‍රම හඳුනාගැනීමේ වැඩසටහන

මෙම ව්‍යාපෘතිය, මහඉලුප්පල්ලම පිහිටි ගොවිපල යන්ත්‍රෝපකරණ පර්යේෂණ මධ්‍යස්ථානය මඟින් ක්‍රියාත්මක කරන ලද අතර 2014 වසරේදී රු.මි. 10.0 ක ප්‍රතිපාදන ලබාදෙන ලදී. ව්‍යාපෘතිය සඳහා වියදම රු.මි. 8.77 කි. මෙම වැඩසටහන මඟින් වී බෝගය ක්ෂේත්‍රයේ ස්ථාපනය කිරීම, අස්වනු නෙලීම හා සැකසීම සඳහා අවශ්‍ය කෘෂි යන්ත්‍රෝපකරණ හඳුන්වා දී ගොවීන් වෙත ලබාදීම සිදු කරනු ලබන අතර මෙම යන්ත්‍රෝපකරණ ක්ෂේත්‍රය තුළ භාවිතා කළ යුතු ආකාරය පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණු පාඨමාලාවන් ප්‍රදේශ කීපයක් ආවරණය වන පරිදි කෘෂි ව්‍යාප්ති නිලධාරීන් හා ගොවීන් සඳහා ලබාදී ඇත.

## 2.5.7 පහතරට තෙත් කලාපීය කුඹුරු ඉඩම් වල ඵලදායිතාවය ඉහළ නැංවීම.

මෙම ව්‍යාපෘතිය සඳහා 2014 වසර තුළදී රු.මි. 1.5 ක ප්‍රතිපාදන ලබාදී ඇති අතර වියදම රු.මි.1.122 කි. මෙම වැඩසටහන බතලගොඩ පිහිටි වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් සිදුකරනු ලබන අතර එමඟින් මූලික බීජ නිෂ්පාදනය සඳහා උචිත වී ප්‍රභේද 12 ක් හඳුනාගෙන ඇත. ඒවා මේ වන විට අක්කර 12.5 ක ක්ෂේත්‍රයක් තුළ ස්ථාපනය කර ඇත.

## 2.6 "දැයට කිරුළ" ජාතික සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය

"දැයට කිරුළ" - 2014 ජාතික සංවර්ධන වැඩසටහන කුරුණෑගල, කෑගල්ල හා පුත්තලම යන දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කල අතර, කුලියාපිටිය කාර්මික විද්‍යාල භූමි පරිශ්‍රය කේන්ද්‍රකර ගනිමින් කෘෂි ප්‍රදර්ශනය පැවැත්විණි.

මෙම සියලු කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පැවති සියලුම ආයතන සිය දායකත්වය ලබා දුන් අතර, ඒ සඳහා 2013/2014 මූල්‍ය වර්ෂයන් යටතේ දැයට කිරුළ වැය ශීර්ෂය මඟින්, අමාත්‍යාංශ ඍජු ප්‍රතිපාදන ලබා දෙන ලදී.ඒ අනුව, අදාළ ආයතන මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා ඒවායේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ.



### 1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

අක්කර 3 පමණ වූ කෘෂි ප්‍රදර්ශන භූමියේ සියලු සංවර්ධන කටයුතු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානයේ මූලිකත්වයෙන් සිදු කරන ලද අතර, ඒ සඳහා රු.මි. 17 ක ප්‍රතිපාදන වැය කරන ලදී. මේ සඳහා දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනයන් වල අනන්‍යතාවය පිළිබිඹු කරවන්නා වූ ප්‍රදර්ශන කුටි වලින් හා වී, අතිරේක ආහාර බෝග, එලවළු, කොළ එළවළු, අල වර්ග, හා ඌණ භාවිත පලතුරු වගා ආදර්ශනයන්ගෙන් ද, දේශීය ආහාර වර්ග, නවීන කෘෂිකාර්මික දැනුම, කාබනික පොහොර භාවිතය හා රෝපණ ද්‍රව්‍ය ප්‍රවර්ධනය කිරීමද මේ යටතේ සිදු විය. මෙයට අමතරව,

i. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පවතින බතලගොඩ පිහිටි වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් ක්‍රියාත්මක කරන ලද පැරෂූට් තාක්ෂණය යොදා ගනිමින් වී වගාවේ නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය සඳහා රු.මි. 0.5 ක ප්‍රතිපාදන ලබා දෙන ලද අතර, මෙම තාක්ෂණය යටතේ අක්කර 113 ක වී වගා කිරීමට අවශ්‍ය පැරෂූට් තැටි ලබා ගැනීම හා ගොවීන් පුහුණු කිරීම සිදු කරන ලදී.
ii. මාකඳුර පිහිටි ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන ආයතනය වෙත ද රු.මි. 0.88 ක ප්‍රතිපාදන ලබා දෙන ලද අතර, එමඟින් ගොවීන්ට ලබා දීම සඳහා අක්කර 5 ක රෝපණ ද්‍රව්‍ය ලෙස මුරුසි අන්නාසි පැළ 15,000 නිෂ්පාදනය කොට ඇත.
iii. අනුරාධපුර, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය (අන්තර් පළාත්) මඟින් රු.මි. 0.275 ක් වියදම් කොට ක්‍රියාත්මක කරන ලද TOM EJC අඹ ප්‍රභේදය ප්‍රචලිත කිරීම වෙනුවෙන් පැළ 500 ක් මිළදී ගෙන ප්‍රතිලාභීන් වෙත ලබාදීම.
iv. කෑගල්ල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය මඟින් දිස්ත්‍රික්කයේ තුන්දහසකට වඩා වැඩි මල් වගාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස පටක රෝපණ විද්‍යාගාරයක් ඉදිකිරීමට රු.මි. 2.4 ක ප්‍රතිපාදන ලබා දෙන ලද අතර, මූලික වශයෙන් රසායනික ද්‍රව්‍ය හා උපකරණ මිළදී ගැනීම සඳහා පමණක් එම මුදලින් රු.මි. 1.8 වියදම් දරා ඇත.

## 2. ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

අතිරේක ආහාර බෝග සුලභ කිරීමේ ව්‍යාපෘතිය හා ග්‍රාමීය කෘෂි නිෂ්පාදන අලෙවි ජාල ප්‍රවර්ධන ව්‍යාපෘතිය ශ්‍රී ලංකා හදබිම අධිකාරිය මඟින් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති වූ අතර, මේ සඳහා පිළිවෙලින් රු.මි. 1.236 හා රු.මි. 1.246 ප්‍රතිපාදන වෙන් කරන ලදී.

මේ අතුරින් භූමිය නිරවුල් කර ගැනීමට නොහැකි වූ බැවින් ග්‍රාමීය කෘෂි නිෂ්පාදන අලෙවි ජාල ප්‍රවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවුණු අතර, අතිරේක ආහාර බෝග සුලභ කිරීමේ ව්‍යාපෘතිය යටතේ අක්කර 1000 ක් වගා කිරීම වෙනුවෙන් මුං බීජ කි.ග්‍රෑ. 2500 ක් සහ මිරිස් බීජ කි.ග්‍රෑ. 50ක් ගොවීන් වෙත ලබා දීම වෙනුවෙන් රු.මි. 1.105 ක මුදලක් වැය කොට ඇත.

## 3. ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය (ශ්‍රී ලංකා සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය)

කුරුණෑගල, කෑගල්ල හා පුත්තලම යන දිස්ත්‍රික්කයන් තුළ ක්‍රියාත්මක කරන ලද දේශීය ආහාර පරිභෝජනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් සඳහා ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය වෙත 2013 මූල්‍ය වර්ෂයෙන් රු.මි. 2 .08 ක ප්‍රතිපාදන ලබා දෙන ලද අතර, මෙමඟින් ප්‍රතිලාභීන් 6500 වෙත අදාළ වැඩසටහන් 121 ක් පවත්වා ඇත.

මීට අමතරව, කෑගල්ල දිස්ත්‍රික් ලේකම්වරයාගේ ඉල්ලීමකට අනුව ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2014 මූල්‍ය වර්ෂයෙන් රු.මි. 0.002 ක ප්‍රතිපාදන ලබා දී ඇත.

## 4. පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

පසු අස්වනු තාක්ෂණ ආයතනය වෙත රු.මි. 1.124 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර, එයින් රු.මි. 0.907 ක් වියදම් කොට කුරුණෑගල, කෑගල්ල හා පුත්තලම යන දිස්ත්‍රික්කයන් තුළ සුළු හා මධ්‍ය පරිමාණ සහල් ආශ්‍රිත නිෂ්පාදන ව්‍යවසායකයින් ප්‍රචලිත කිරීම, රයිස් ක්‍රීම් නිෂ්පාදනය ප්‍රචලිත කිරීම, පලතුරු ආශ්‍රිත නිෂ්පාදන ප්‍රචලිත කිරීම, ආදර්ශ සහල් සැකසුම් පවුල් ස්ථාපිත කිරීම හා කෘෂි බෝග සඳහා දියුණු පසු අස්වනු තාක්ෂණ ක්‍රම හඳුන්වා දීම වැනි පසු අස්වනු තාක්ෂණය පිළිබඳව වැඩසටහන් 36 ක් පවත්වමින් ප්‍රතිලාභීන් 1652 ක් වෙත පුහුණුවීම් හා තෝරාගත් ප්‍රතිලාභීන් වෙත උපකරණ ලබා දීම සිදු කොට ඇත.

## 5. කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ප්‍රතිපාදන ලබා දීම

පලතුරු වගාවේ රෝපණ ද්‍රව්‍ය ලබාදීමේ ව්‍යාපෘතිය සඳහා කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් වෙත රු.මි. 4.44 ක ප්‍රතිපාදන ලබා දෙන ලද අතර, දිස්ත්‍රික්කයේ ප්‍රා.ලේ. කොට්ඨාශ 30 ක් ආවරණය වන පරිදි අන්නාසි අක්. 95 ක්, බද්ධ අඹ අක්. 293ක්, බද්ධ දොඩම් අක්. 27ක්, බද්ධ රඹුටන් අක්.16ක්, බීජ දෙළුම් අක්. 39ක් හා බීජ දෙහි අක්. 20 වගා කරන ලදී.

## 6. පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ප්‍රතිපාදන ලබා දීම

ජංගම සේවාවන්ට අදාළව බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම, කෘෂි උපකරණ ලබා දීම හා කුඩා අන්නාසි ගම්මාන ප්‍රවර්ධනය කිරීම වැනි ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 3.297 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දුන්නද, නොවැලැක්විය හැකි හේතුවක් මත එම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක නොවූ අතර, එම ප්‍රතිපාදන වලින් රු.මි. 2.816 ක මුදලක් අමාත්‍යාංශය මඟින් පුත්තලම දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරනු ලැබූ තරුණ කෘෂි ව්‍යවසායකත්ව වැඩසටහන සඳහා වැය කොට ඇත. මේ යටතේ වෙන්නප්පුව, මුන්දලම හා ආරච්චිකට්ටුව ප්‍රා.ලේ. කොට්ඨාශ ආවරණය වන පරිදි ඕකිඩ් මල් වගා ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කල අතර, ඒ සඳහා පැළ 2000 ක්, ආරක්ෂිත ගෘහ 02 ක්, ක්ෂුද්‍රජල පද්ධති 02 ක්, වගා ලිං 01 ක් සහ වතුර මෝටර් 01 ක් ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇත.

## 7. <u>කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ප්‍රතිපාදන ලබා දීම</u>

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කෘෂිකර්ම අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද කෘෂි ව්‍යවසායකයින්ගේ ඉඩම්වල වාණිජ පලතුරු වගාවන් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය හා කුඩා කණ්ඩායම් සවිබල ගැන්වීමේ ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් 2013 මූල්‍ය වර්ෂයෙන් රු.මි.6.9 ක ප්‍රතිපාදන වෙන් කලද, 2014 මූල්‍ය වර්ෂයෙන් පලතුරු වගාවන් ස්ථාපිත කිරීම වැඩසටහනේ පැළ ප්‍රවාහන කටයුතු වෙනුවෙන් රු.මි. 0.1 ක ප්‍රතිපාදන ලබා දී ඇත. මේ යටතේ දූරියන් පැළ 1,200 ක්, රඹුටන් පැළ 250 ක්, ගස්ලබු පැළ 1,000 ක් ඩ්‍රැගන් ෆෘට් පැළ 250 ක් හා මසක් වයසැති බඳුන්ගත මිරිස් පැළ 2,500 ක් ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇත.

❖ තවද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අමතරව අමාත්‍යාංශය යටතේ පවතින, ශ්‍රී ලංකා හදබිම අධිකාරිය, ශ්‍රී ලංකා කෘෂිකාර්මික ප්‍රතිපත්ති සභාව, පශ්චාත් අස්වැන්න පිලිබඳ තාක්‍ෂණ ආයතනය, ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, සී/ස ලංකා පොහොර සමාගම හා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම යන ආයතන විසින්ද තම ආයතනයන්හී කාර්යයන් පිළිබිඹු වන පරිදි ප්‍රදර්ශන කුටි පවත්වා ගෙනයන ලදී.

❖ 2014 මූල්‍ය වර්ෂය යටතේ වෙන් කරන ලද රු.මි. 50 ක් වූ (භාණ්ඩාගාර සංශෝධනයන්ට අනුව පසුව මෙය රු.මි. 40 විය.) ප්‍රතිපාදන මඟින් 2014 කුරුණෑගල වැඩසටහන සඳහා රු.මි. 24.5 ක ප්‍රතිපාදන ලබා දෙන ලද අතර, ඉතිරිය වන රු.මි. 15.5 ක ප්‍රතිපාදන මුදල 2015 – "දැයට කිරුළ" වැඩසටහන වෙනුවෙන් වෙන් කරන ලදී.

## <u>2015 – "දැයට කිරුළ" වැඩසටහන (මාතර)</u>

### i. <u>කෘෂි ප්‍රදර්ශන භූමිය සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන ලබා දීම</u>

අක්කර 8 ක් පමණ වපසරියකින් යුත් කෘෂි ප්‍රදර්ශන භූමියේ වැඩකටයුතු ආරම්භ කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය වෙත රු.මි. 5 ක ප්‍රතිපාදන ලබා දෙන ලදී.

### ii. <u>මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ප්‍රතිපාදන ලබා දීම</u>

දැයට කිරුළ සංවර්ධන වැඩසටහනට සමගාමීව මාතර දිස්ත්‍රික්කයේ ජංගම සේවා මඟින් හඳුනාගන්නා ලද ගැටලු සඳහා පිළියම් වශයෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද කුඩා වාරිමාර්ග යෝජනා ව්‍යාපෘති 24 ක් සඳහා රු.මි. 5.5 ක ප්‍රතිපාදන ලබා දෙන ලද අතර, එයින් රු.මි. 0.608 ක මුදලක් පමණක් වියදම් කොට ව්‍යාපෘති 3 ක් පමණක් ක්‍රියාත්මක කොට ඇති අතර, කාලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඉතිරි ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීය. මෙම ජංගම සේවා වැඩසටහන් අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝම්බර් මාස වලදී ක්‍රියාත්මක කොට තිබුණි.

### iii. <u>බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ප්‍රතිපාදන ලබා දීම</u>

ජංගම සේවා මඟින් හඳුනාගන්නා ලද ගැටලු සඳහා පිළිතුරු ලෙස බදුල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද හරිතාගාර ලබා දීම, රෝස වගාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීම සහ බිම්මල් වගාව ප්‍රවර්ධනය කිරීම වැනි ව්‍යාපෘති සඳහා රු.මි. 1.56 ක ප්‍රතිපාදන ලබා දුන්න ද ඒවා ක්‍රියාත්මක නොවීය.

### iv. <u>රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ප්‍රතිපාදන ලබා දීම</u>

අපනයනය සඳහා ඇන්තූරියම් වගා කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මි. 1.478 ක ප්‍රතිපාදන ලබා දෙන ලද අතර, ඉන් රු.මි. 0.980 ක් වියදම් දරා වැඩසටහන් ක්‍රියාත්මක කොට ඇත.

# 03. විශේෂ සංවර්ධන වැඩසටහන්/ ව්‍යාපෘති.

01. උද්‍යාන බෝග පසු අස්වනු හානිය අවම කිරීමට අදාළව කරන ලද තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘති යෝජනාව එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) මඟින් අනුමත කල අතර එම ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කර ඇත.

02. ග්‍රාමීය සංවර්ධනයට අදාළ විශේෂඥයකුගේ සේවය ලබා ගැනීම හා ශාක නිරෝධායන මධ්‍යස්ථානයේ උපකරණ මිලදී ගැනීම සඳහා වූ ව්‍යාපෘති යෝජනා 2ක් JICA ආයතනයට යොමු කරන ලදුව එය ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.

03. ආසියානු ආහාර හා කෘෂිකර්ම සහයෝගීතා මුලපිරුම (AFACI) සංවිධානය යටතේ දකුණු කොරියානු රජයේ තාක්ෂණික හා මූල්‍යමය ආධාර මත පර්යේෂණ ව්‍යාපෘති 11 ක් සාර්ථක ලෙස ක්‍රියාත්මක වේ. පසුගිය වර්ෂයේ අවසන් වූ ව්‍යාපෘති දෙකක් සඳහා ඉදිරි අවුරුදු 2ක් සඳහා දීර්ඝ කිරීමක් ලබා ගැනීමට හැකිවිය. කෘෂි යාන්ත්‍රීකරණයට අදාළ නව ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කිරීමට හැකි විය. ව්‍යාපෘති භාර පර්යේෂකයින් (Principal Investigators) විවිධ රටවල පැවති ප්‍රගති සමාලෝචන රැස්වීම් වලට සහභාගී කරවීමට කටයුතු කල අතර ශාක ජාන සම්පත් කළමණාකරණයට අදාළ ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචන රැස්වීම 2014 අගෝස්තු මාසයේ දී ශ්‍රී ලංකාවේ පවත්වන ලදි.

04. මූල්‍ය ආධාර ලබා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් සාක් සංවර්ධන අරමුදල (SDF) වෙත ඉදිරිපත් කර ඇත. ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් සාක් සංවර්ධන අරමුදල සඳහා ඉදිරිපත් කිරීමට සකස් කල Highland Food Security with High Value Chain ව්‍යාපෘති යෝජනාවට කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ තොරතුරු සපයන ලදි.

05. අළුතින් සාමාජිකත්වය ලබා ගත් අප්‍රිකානු - ආසියානු ග්‍රාමීය සංවර්ධන සංවිධානය (AARDO) මූල්‍ය සහයෝගය මත කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව නිලධාරින් 22 දෙනෙකු විවිධ රටවල පුහුණු වැඩසටහන්/ වැඩමුළු සඳහා සහභාගී කරවා ඇත. "කාලගුණික විපර්යාස හා කෘෂිකර්මය අනුවර්තනය හා බලපෑම අඩුකිරීම" තේමාව ඔස්සේ ජාත්‍යන්තර වැඩමුළුවක් සැප්තැම්බර් මස 22 – 26 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ පැවැත්වීමට කටයුතු කරන ලදී. මේ සඳහා බංගලාදේශය, තායිවානය, ඝානාව, ඉන්දියාව, ඉරාකය, ජෝර්දානය, ලෙබනනය, මලාවි, නයිජීරියාව, ඕමානය, පකිස්ථානය ඇතුළු රටවල් 16 ක ඉහළ නියෝජිතයින් සහභාගී විය.

06. දේශීය කෘෂිකර්ම සංවර්ධනය හා කර්මාන්තයේ සහයෝගීතාවය ප්‍රවර්ධනය යන තේමාව යටතේ ආසියානු ඵලදායිතා සංවිධානයේ (APO) ජාත්‍යන්තර වැඩමුළුවක් 2014 ජූනි මාසයේ දී සංවිධානය කොට ශ්‍රී ලංකවේ පැවැත්වීමට කටයුතු කරන ලදි. මේ සඳහා චීන සමූහාණ්ඩුව, ෆීජී, ඉරානය, ඉන්දියාව, ඉන්දුනීසියාව, මොංගෝලියාව, පකිස්ථානය, පිලිපීනය ඇතුළු රටවල් 14ක ඉහළ මට්ටමේ නියෝජිතයින් 24 දෙනෙකු සහභාගී විය.

07. විවිධ රටවල් සමඟ තාක්ෂණික සහයෝගීතාවය සංවර්ධනය කර ගැනීමේ ගැනීමේ වැඩසටහන යටතේ බෙලරුස්, සීෂෙල්ස් රාජ්‍යය, ඉරාකය, ජපානය, හා චීනය සමඟ නව අවබෝධතා ගිවිසුම් 4ක් සකස් කර අදාළ රටවල එකඟතාවය ලබා ගැනීමට කටයුතු කර ඇත. එමෙන්ම එම අවබෝධතා ගිවිසුම් වලට එළඹීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.

08. FAO, CIRDAP හා AARDO සංවිධාන සඳහා 2014 වර්ෂයට අදාළ වාර්ෂික දායක මුදල් ගෙවීමට කටයුතු කර ඇත.

09. අළුතින් අත්සන් කිරීමට යෝජිත ශ්‍රී ලංකා - බංගලාදේශ නිදහස් වෙළඳ ගිවිසුම හා BIMSTEC නිදහස් වෙළඳ ගිවිසුම සඳහා කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව තොරතුරු වාණිජ දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත.

| | වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල (රු.) | වැයවූ ප්‍රමාණය (රු.) |
|---|---|---|
| දායක මුදල් | 35,000,000.00 | |
| FAO | | 17,169,785.06 |
| CIRDAP | | 2,261,14 2.37 |
| ARRDO | | 3,047,910.71 |
| වැඩමුළු සංවිධානය | | |
| APO | | 3,248,769.48 |
| ARRDO | | 2,710,208.62 |

## දිවි නැඟුම ජාතික සංවර්ධන වැඩසටහන - VI අදියර

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් පහත සඳහන් උප ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.

### 1. එළවළු බීජ හා පැළ බෙදාදීමේ ව්‍යාපෘතිය

| වෙන්කල ප්‍රතිපාදන: රු. මි. 70.0 | මූල්‍ය ප්‍රගතිය: රු. මි. 47.308 |
|---|---|

දිවයින පුරා ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන මඟින් ග්‍රාමසේවා කොට්ඨාශ මට්ටමින් තෝරාගත් ප්‍රතිලාභින් විසි පන් ලක්ෂයක් සඳහා එළවළු බීජ වර්ග 07 කින් සමන්විත බීජ කට්ටලයක් හා එළවළු වර්ග 4 කින් සමන්විත බඳුන්ගත පැළ 9 ක් ලබාදෙන ලදි.

### 2. පළතුරු පැළ බෙදා දීමේ වැඩසටහන

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන මඟින් දිවයිනේ සෑම ග්‍රාමසේවා කොට්ඨාශයකින්ම තෝරාගත් ප්‍රතිලාභින් 100 ක් සඳහා එම කලාප වලට ගැලපෙන පලතුරු පැළ 100 ක් නොමිලේ ලබාදෙන ලදි.

### 3. කතුරුමුරුංගා පැළ සැපයීමේ ව්‍යාපෘතිය

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන මඟින් සෑම ග්‍රාමසේවා කොට්ඨාශයකින් තෝරාගත් ප්‍රතිලාභින් 75ක් සඳහා කතුරුමුරුංගා පැළ නොමිලේ ලබාදුන් අතර දිවයින පුරා මෙම වැඩසටහන ක්‍රියාත්මක විය.

### 4. පාසල් ගෙවතු සඳහා පලතුරු පැළ හා එළවළු බීජ ලබාදීමේ වැඩසටහන

දිවයින පුරා ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන මඟින් පාසල් 10,012 ක ගෙවතු සඳහා පලතුරු පැළ හා එළවළු බිජ ලබා දෙන ලදි. මෙම වැඩසටහන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලදි.

## 5. රාජ්‍ය නිලධාරින් සඳහා පලතුරු පැළ ලබාදීමේ වැඩසටහන

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ දිවයින පුරා ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන මඟින් රාජ්‍ය නිලධාරීන් සඳහා පලතුරු පැළ නොමිලේ ලබා දෙන ලදි.

## ජාතික ගොවි සතිය හා කෘෂිකාර්මික ප්‍රදර්ශනය

| | |
|---|---|
| වෙන් කළ ප්‍රතිපාදන - රු.මි. 44.03 | මූල්‍ය ප්‍රගතිය - රු.මි. 43.12 |

ජාතික ගොවි සතිය හා කෘෂිකාර්මික ප්‍රදර්ශනය - 2014, තෙලිජ්ජවිල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්විණි. ප්‍රදර්ශනයට සමගාමීව ප්‍රාදේශීය සංවර්ධනය ඉලක්ක කර ගනිමින් "රන් අස්වනු පුදින නිල්වලා අරුණෝදය " යන තේමාවෙන් යුක්ත ව මෙවර ජාතික ගොවි සතිය පැවැත්විණි. අප රට අත් කරගෙන ඇති කෘෂිකාර්මික දියුණුව හා නවීන තාක්ෂණය කෘෂි කර්මාන්තය වෙත යොදවාගැනීම පිළිබඳ විදහා දැක්වෙන ආකාරයකින් නිර්මාණය කරන ලද ප්‍රදර්ශන භූමියකින්ද සමන්විත වූ ජාතික ගොවි සතිය යටතේ පහත සඳහන් ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක විය.

- තෙලිජ්ජවිල ගොවිපල සංවර්ධනය කිරීමේ වැඩසටහන
- තෝරාගත් කෘෂි ව්‍යවසායකයින් සඳහා ආරක්ෂිත ගෘහ 100ක් ඉදිකිරීම
- මාතර දිස්ත්‍රික්කයේ වගා නොකරන ඉඩම් වල තෘණ වගා කිරීම හා කිරි ගව පාලනය
- මාතර දිස්ත්‍රික්කයේ කොරටු වගා ව්‍යාපෘතිය
- තෙලිජ්ජවිල ගොවිපල භූමියේ කුඹුරු වල නියර වගා වැඩසටහන
- ආදර්ශ පාසැල් ගෙවතු වැඩසටහන







# 04. ගොවීන්ගේ භාරකාර අරමුදල

1994 දී ස්ථාපිත භාරකාර ඔප්පුවේ සඳහන් වන ආකාරයට හා 2002 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් අරමුණු පුළුල් කිරීම මගින් ගොවීන්ගේ භාරකාර අරමුදල පහත අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වේ.

* ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය හා ගොවි ජනතාවගේ සුබසාධනය වැඩි දියුණු කිරිම.
* සුළු ගොවීන්ට කෙටිකාලීන කෘෂිකාර්මික ණය පහසුකම් සැලසීම.
* සුළු ගොවීන්ට කෘෂිකාර්මික යෙදවුම් සම්පාදනය.
* සුළු ගොවීන්ගේ මූල්‍ය දුෂ්කරතාවයන් මගහරවා ගැනිම සඳහා සුළු ගොවියාට වෙළෙඳපල ණය පහසුකම් සැපයිම.
* සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුබසාධනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
* බෝග හා සත්ව නිෂ්පාදන ක්‍රියාවලිය මෙන්ම නිෂ්පාදනය පිරිසැකසුම සඳහා සුළු ගොවීන්ට අවශ්‍ය වෙනත් අනුග්‍රහයන් ලබා දීම.
* කෘෂිකාර්මික සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා විශේෂ කෘෂිකාර්මික වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

## 1. ක්‍රියාත්මක ක්‍රමවේදය

අධ්‍යක්ෂ මණ්ඩලයක් හරහා එක් එක් වර්ෂය සඳහා ව්‍යාපෘති අනුමත කිරිම තුළින් අදාළ ආයතන මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සිදු කරයි. අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි සමන්විත වේ.

- සභාපති - කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්
- සමාජික - ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්
- සාමාජික - ප්‍රධාන ගණකාධිකාරී (කෘෂිකර්ම අමාත්‍යාංශය)
- සාමාජික - භාණ්ඩාගාර විශේෂ නියෝජිත

## 2. අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය

අරමුදල සඳහා වන ප්‍රධාන ආදායම් මාර්ගය ගොවිසෙත ලොතරැයියේ අලෙවි ආදායමෙන් යම් ප්‍රතිශතයක් බවත්, එය විටින් විට ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ සාකච්ඡා කර තීරණය කර ගත යුතු බවත් භාරකාර ඔප්පුවේ සඳහන් කර ඇත.

**2014 වර්ෂයේදී මුදල් නිදහස් කරන ලද**
**සංවර්ධන ව්‍යාපෘතීන්ට අදාළ වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

### 4.1 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

#### 4.1.1 පුහුණු වැඩසටහන්

| වැඩසටහන | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| කෘෂිරසායන වෙළඳාම පිළිබඳ පුහුණු කිරීම | 2,915,000.00 | 1,700,000.00 | 58 |

### 4.1.2 <u>කෘෂිරසායන වෙළඳාම හා තාක්ෂණික පුහුණුව</u>

ගොවීන් හට තම ක්ෂේත්‍රයේ පවතින පළිබෝධනාශක ගැටලු සඳහා විසඳුම් ලබා දීම හා පළිබෝධනාශක අනිසි භාවිතය වැළැක්වීම සඳහා කෘෂි රසායන අලෙවි හා තාක්ෂණ සහකරුවන් පුහුණු කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මෙහෙයවනු ලබන පුහුණු පාඨමාලාවකි.

| | දිස්ත්‍රික්කය | පුහුණු ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | අනුරාධපුරය | 90 |
| 2. | ගම්පහ | 30 |
| 3. | රත්නපුර | 30 |
| 4. | හම්බන්තොට | 30 |
| 5. | මාතලේ | 30 |
| 6. | බදුල්ල | 60 |
| | මුළු එකතුව | 270 |

## 4.2 ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

### 4.2.1 පොහොර ගබඩා ඉදි කිරීම

| වැඩසටහන | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| ඌරුබොක්ක ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ඉදිකිරීම | 1,657,442.00 | 1,657,442.00 | 100 | 100 |
| දිස්ත්‍රික් මට්ටමින් පොහොර ගබඩා ඉදි කිරීම | 1,800,000.00 | 1,796,727.30 | 99.8 | 100 |
| එකතුව | 3,457,442.00 | 3,454,169.30 | | |

<u>ඌරු බොක්ක ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පොහොර ගබඩාව</u>

ක්‍රියාත්මක දිස්ත්‍රික්කය - මාතර
ප්‍රා.ලේ. කොට්ඨාශය - පස්ගොඩ
ගො.සේ.ම. බල ප්‍රදේශය - ඌරුබොක්ක
වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය - අක්කර 1067
පොහොර ගබඩාවේ ධාරිතාවය - මෙ.ටො. 50
ලියාපදිංචි ගොවි සංවිධාන සංඛ්‍යාව - 12

## 4.2.2 ග්‍රාමීය සුළු වාරිමාර්ග පුනරුත්ථාපන වැඩසටහන

ග්‍රාමීය මට්ටමින් ගොවී ජනතාවට ජල පහසුකම් ලබා ගැනීම සඳහා ස්ථාපනය කරන ලද සුළු පරිමාණයේ වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

| වැඩසටහන | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| වව්නියාව හා මොනරාගල දිස්ත්‍රික්කවල සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය | **16,910,000.00** | **10,228,640.41** | **60** | **100** |
| මාතර දිස්ත්‍රික්කයේ සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය | **19,000,000.00** | **8,000,000.00** | **42** | **100** |
| මහනුවර දිස්ත්‍රික්කයේ සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය | **4,000,000.00** | **4,000,000.00** | **100** | **100** |
| එකතුව | **39,910,000.00** | **22,228,640.41** | | |

### ගොවීන්ගේ භාරකාර අරමුදල යටතේ ක්‍රියාත්මක කරන ලද සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණයන්

### ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින්

| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ | **2014.12.31** වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | **2014.12.31** දිනට වියදම (රු.) |
|---|---|---|
| රිදීමාලියද්ද | **07** | **834,301.11** |
| මහියංගනය | **10** | **1,840,122.88** |
| වැලිමඩ | **03** | **558,788.58** |
| හල්දුම්මුල්ල | **04** | **539,688.32** |
| එකතුව | **24** | **3,772,900.89** |

| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ | වගා කරනු ලබන කුඹුරු අක්කර ගණන | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව |
|---|---|---|
| රිදීමාලියද්ද | **292** | **205** |
| මහියංගනය | **3710** | **1673** |
| වැලිමඩ | **169** | **94** |
| හල්දුම්මුල්ල | **175** | **276** |
| එකතුව | **4346** | **2248** |

**<u>මහියංගන - විරාණගම 202/ඩී 04 එෆ්.සී. 48 ඇල ප්‍රතිසංස්කරණය කිරීම</u>**

වියදම රු.- **193,375.15**
ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව **-14**
වගා කරනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය**-38**



**<u>මහියංගනය - FC 47 අලුත්තරම ඇල ප්‍රතිසංස්කරණය කිරීම</u>**

වියදම රු.- **152,182.68**
ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව- **18**
වගා කරනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය**-45**



**<u>මහියංගනය - හොබරියාව 206/ඩී4 ඇල ප්‍රතිසංස්කරණය කිරීම - (2014)</u>**

වියදම රු.**-233,695.48**
ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව **-154**
වගා කරනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය**-385**



- වව්නියාව මොනරාගල සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය - උදාන වැව ප්‍රතිසංස්කරණය.

<u>ප්‍රතිසංස්කරණයට පෙර</u>

<u>ප්‍රතිසංස්කරණයෙන් පසු</u>





- <u>හල්ලල වැව ප්‍රතිසංස්කරණය</u>





➢ <u>නාඹටුන්න වැව ප්‍රතිසංස්කරණය</u>





➢ <u>දෙගම්පොත වැව ප්‍රතිසංස්කරණය</u>





## 4.2.3 විවිධ වැව් අමුණු හා පැති බැම් ප්‍රතිසංස්කරණය

| වැඩසටහන | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| හම්බන්තොට දිස්ත්‍රික්කයේ සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය - ගොන්නොරුව | 11,415,000.00 | 9,778,789.25 | 86 | 100 |
| නෙළුම් වැව හා වාරි ඇළ ප්‍රතිසංස්කරණය | 1,503,876.90 | 1,480,631.96 | 98 | 100 |
| කොස්මෝදර ඇල වේල්ල සකස් කිරීම | 279,000.00 | 147,448.21 | 53 | 100 |
| මඩකලපුව දිස්ත්‍රික්කයේ (තාරාවෙයි) ප්‍රවාහන ක්‍රියාවලියක් සකස් කිරීම | 1,733,110.00 | 1,733,110.00 | 100 | 100 |
| මඩකලපුව දිස්ත්‍රික්කයේ මැට්ටිවැලි අමුණ ප්‍රතිසංස්කරණය | 1,900,000.00 | 1,000,000.00 | 53 | 100 |
| නාකඳවෙල හා වැද්දාවල පැති බැම් ඉදි කිරීම | 400,000.00 | 400,000.00 | 100 | 100 |
| හම්බන්තොට දිස්ත්‍රික්කයේ දෙගම්පොත වැව ප්‍රතිසංස්කරණය | 10,839,000.00 | 2,000,000.00 | 18 | 100 |
| උඩුහුපිටිය ඇල ප්‍රතිසංස්කරණය | 1,540,000.00 | 343,000.00 | 22 | 100 |
| කෝරළේ ඇල ප්‍රතිසංස්කරණය | 2,200,000.00 | 307,702.44 | 14 | 100 |
| එකතුව | 31,809,986.90 | 17,190,681.86 | | |

- වඩුවාව කිරිවිල ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය
(ප්‍රා.ලේ. - වැලිපිටිය, ගො.සේ.ම. - වැලිගම, ග්‍රා.නි. වසම - පලල්ල)




- මඩුවලමගදෙණිය අමුණ ප්‍රතිසංස්කරණය
(ප්‍රා.ලේ. - මුලටියන, ගො.සේ.ම. - දෙයියන්දර, ග්‍රා.නි. වසම - මඩුවල)




- ගමගෙවත්ත අමුණ ප්‍රතිසංස්කරණය
(ප්‍රා.ලේ. - මුලටියන, ගො.සේ.ම. - දෙයියන්දර, ග්‍රා.නි. වසම - නෙරලම්පිටිය)




- පුහුන්නවිල වත්ත අමුණ ප්‍රතිසංස්කරණය
(ප්‍රා.ලේ. - අතුරලිය, ගො.සේ.ම. - විල්පිට, ග්‍රා.නි. වසම - විල්පිට - බටහිර)




### 4.2.4. කෘෂි මාර්ග ඉදිකිරීම

ගොවීන්හට තම වගාබිම් වෙතට වගාවන් සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර සහ කෘෂිකාර්මික උපකරණ මෙවලම් පහසුවෙන් ගෙන යා හැකි වන පරිදි හා එහි ඵලදාව පහසුවෙන් වෙළෙඳපළ කරා ගෙන යාම සඳහා එම කෘෂිකාර්මික බිම් සහ ගම්මාන හරහා කෘෂි මාර්ග ඉදිකර දීමෙන් ප්‍රවාහන වියදම් අවම කොට ගොවීන්ගේ නිෂ්පාදන වියදම අඩු කිරීම සහ ඵලදාව වැඩි කිරීමෙන් ද කෘෂිකර්මාන්තය ආකර්ෂණීය වෘත්තියක් කිරීමෙන් ජාතික ආර්ථිකයට ශක්තියක් ඇති කිරීම මෙමඟින් බලාපොරොත්තු වේ.

| වැඩසටහන | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| මාතර දිස්ත්‍රික්කයේ කෘෂි මාර්ග ඉදි කිරීම | **18,000,000.00** | **6,000,000.00** | **33.33** | **100** |

- කැටන්විල හුන්දිරිමුල්ල කෘෂි මාර්ගය ප්‍රතිසංස්කරණය
(ප්‍රා.ලේ. - අකුරැස්ස, ගො.සේ.ම. - අකුරැස්ස, ග්‍රා.නි. වසම - කැටන්විල)





- පැල්පතවත්ත සහ පහලවත්ත කෘෂි මාර්ගය ප්‍රතිසංස්කරණය





### 4.2.5 ප්‍රදර්ශන, සංස්කෘතික හා වෙනත් වැඩසටහන්

| වැඩසටහන | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| **1.වක්ගල්මෝදර කරදිය පාලනය** | **3,000,000.00** | **2,700,000.00** | **90** | **100** |
| **2.අලුත් සහල් මංගල්‍යය - 2014** | **1,000,000.00** | **1,000,000.00** | **100** | **100** |
| **3.2014 ජාතික ගොවි සතියට සමගාමීව පුරන්ව ඇති කුඹුරු අස්වැද්දීම** | **1,000,000.00** | **642,500.00** | **64** | **100** |
| **4.ක්ෂේත්‍ර දිනපොත් මුද්‍රණය සඳහා** | **2,500,000.00** | **2,500,000.00** | **100** | **100** |
| **එකතුව** | **7,500,000.00** | **6,842,500.00** | | |

### 4.3 ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පල්ලම

| වැඩසටහන | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| කෘෂි ළිං ඉදි කිරීමේ වැඩසටහන | 1,190,000.00 | 200,000.00 | 17 | 50 |

### 4.4 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ

| වැඩසටහන | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1.කෘෂි ළිං ඉදි කිරීමේ වැඩසටහන | 2,300,000.00 | 450,000.00 | 20 | 100 |
| 2.ලොකු ළූණු බීජ නිෂ්පාදනය ප්‍රවර්ධන ව්‍යාපෘතිය | 6,000,000.00 | 2,200,000.00 | 37 | 100 |
| එකතුව | 8,300,000.00 | 2,650,000.00 | | |

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලොකු ළූණු බීජ බෙදා හැරීම හා ලබා ගන්නා ලද අස්වැන්න

| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ | ලබා දෙන ලද බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ) | වියදම් කරන ලද මුදල (රු.) | ගොවීන් ගණන | වගා වපසරිය අක්කර | ලබා ගත් අස්වැන්න (මෙ.ටො) | රු. 60/- සහතික මිලට අනුව මුළු ආදායම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| දඹුල්ල | 328.5 | 637,290 | 335 | 131.4 | 1,116.9 | 67.01 |
| ගලේවෙල | 239.0 | 463,660 | 182 | 95.6 | 812.6 | 48.76 |
| නාඋල | 250.5 | 485,970 | 478 | 100.2 | 851.7 | 51.10 |
| ලග්ගල පල්ලේගම | 85.5 | 165,870 | 82 | 34.2 | 290.7 | 17.44 |
| පල්ලේපොල | 29.5 | 57,230 | 11 | 11.8 | 100.3 | 6.02 |
| රත්තොට | 3.0 | 5,820 | 5 | 1.2 | 10.2 | 0.61 |
| විල්ගමුව | 64.00 | 124,160 | 54 | 25.6 | 217.6 | 13.06 |
| එකතුව | 1,000 | 1,940,000 | 1,147 | 400 | 3,400 | 204 |





දඹුල්ල ඉබ්බන්කටුව රතුළූණු වගාව

## 4.4 කෘෂි ළිං ඉදි කිරීමේ වැඩසටහන - මාතලේ



| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ඉදි කිරීමට ඉලක්ක ගත ළිං සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| දඹුල්ල | 07 | 4 | 57% |
| ගලේවෙල | 06 | 4 | 67% |
| නාඋල | 03 | 3 | 100% |
| ලග්ගල පල්ලේගම | 03 | 3 | 100% |
| විල්ගමුව | 03 | 3 | 100% |
| එකතුව | 22 | 17 | 59% |

## 4.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල

| වැඩසටහන | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් සඳහා | 5,000,000.00 | 1,156,000.00 | 23 | 100 |

## 4.6 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල

| වැඩසටහන | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| පැරෂුට් තැටි ලබා දීම | 700,000.00 | 560,000.00 | 80 | 100 |

## 4.7 දකුණු පළාත් සභාව



| වැඩසටහන | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍ර ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| බිම්මල් බීජ නිෂ්පාදන ඒකක ස්ථාපිත කිරීම - ලබුදූව ගොවිපල | 2,000,000.00 | 2,000,000.00 | 100 | 100 |

## 4.8 සබරගමුව පළාත් සභාව

| වැඩසටහන | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| කෘෂි ළිං ඉදි කිරීමේ වැඩසටහන | 1,250,000.00 | 250,000.00 | 20 | 100 |
| ඇන්තූරියම් වගාව වැඩිදියුණු කිරීම | 1,200,000.00 | 747,500.00 | 62 | 100 |

➢ ඇන්තූරියම් වගාව වැඩිදියුණු කිරීම





## 4.9 උතුරු පළාත් සභාව

| වැඩසටහන | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම | 9,000,000.00 | 6,500,000.00 | 65 | 100 |
| ඩ්‍රැගන් ෆෲට් පලතුරු හඳුන්වාදීම - මන්නාරම | 594,600.00 | 530,500.00 | 89 | 80 |
| එකතුව | **9,594,600.00** | **7,030,500.00** | | |

## 4.10 වයඹ පළාත් සභාව

| වැඩසටහන | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| පොල් ඉඩම්වල අන්නාසි වගාව ප්‍රවර්ධනය | 2,474,300.00 | 2,434,188.00 | 98 | 100 |
| ලොකු ළූණු නිෂ්පාදනය ප්‍රවර්ධනය | 1,525,700.00 | 1,337,029.00 | 67 | 100 |
| එකතුව | 4,000,000.00 | 3,771,217.00 | | |

### ලොකු ළූණු නිෂ්පාදනය ප්‍රවර්ධනය - වයඹ පළාත

**විදේශ විනිමය ඉතුරු කරගනිමින් ආනයනය අවම කරගනිමින් දේශීය ලොකු ළූණු අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි ලොකු ළූණු නිෂ්පාදනය ප්‍රවර්ධනය සඳහා දේශීයව නිපදවන ලද සත්‍ය බීජ භාවිතයෙන් ලොකු ළූණු වගාවේ ඵලදායීත්වය ඉහළ නැංවීම අරමුණු කොටගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.**

| කලාපය | වගා ඉලක්කය (අක්.) | ප්‍රගතිය (අක්) | ප්‍රතිශතය |
|---|---|---|---|
| ගල්ගමුව | 20 | 20 | 100 |
| මහව | 05 | 05 | 100 |
| වාරියපොළ | 06 | 06 | 100 |
| ඉබ්බාගමුව | 7.5 | 7.5 | 100 |
| ආනමඩුව | 05 | 05 | 100 |
| පුත්තලම | 04 | 04 | 100 |
| එකතුව | 45.5 | 45.5 | 100 |



වාරියපොල



ගල්ගමුව



වාරියපොල



ආනමඩුව


## වයඹ පළාතේ ලොකු ළූණු බීජ නිෂ්පාදනය

| කලාපය | වසන්තීකරණය සඳහා ඇසුරුම් සැපයීම |
|---|---|
| පුත්තලම | 62 |
| ආනමඩුව | 20 |
| වාරියපොල | 06 |
| මහව | 04 |
| ගල්ගමුව | 70 |
| ඉබ්බාගමුව | 80 |
| එකතුව | 242 |






## වයඹ පළාතේ ලොකු ළූණු වගාවේ වපසරියේ වාර්ෂික වෙනස්වීම්



## වයඹ පළාතේ අන්නාසි වගාව ප්‍රවර්ධනය




## වයඹ පළාතේ පොල් ඉඩම් වල අන්නාසි වගාව -2014 භෞතික ප්‍රගතිය



වැදුණිබ



| කලාපය | වපසරිය (අක්කර) | ඉලක්ක (පැළ) | ප්‍රගතිය පැළ |
|---|---|---|---|
| දඹදෙණිය | 10.5 | 42000 | 42000 |
| මාදම්පේ | 43.5 | 174000 | 174000 |
| වාරියපොල | 09 | 36000 | 36000 |
| කුරුණෑගල | 20 | 80000 | 80000 |
| කුලියාපිටිය | 13 | 52000 | 52000 |
| එකතුව | 96 | 384000 | 384000 |

* **පසු අස්වනු හානි අවම කිරීම සඳහා ඇසුරුම් සැපයීම**

| කලාපය | ලබා දුන් ඇසුරුම් ප්‍රමාණය |
|---|---|
| දඹදෙණිය | 55 |
| වාරියපොල | 20 |
| මාදම්පේ | 70 |
| කුරුණෑගල | 41 |
| එකතුව | 286 |

### 4.11 පසු අස්වනු තාක්ෂණ ආයතනය

| වැඩසටහන | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| යන්ත්‍රෝපකරණ ප්‍රදර්ශනය | **1,000,000.00** | **1,000,000.00** | **100** | **100** |

### 4.12 ජාතික කෘෂි ව්‍යාපාර කවුන්සිලය

| වැඩසටහන | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| ගොවි සම්මාන හා කෘෂිකාර්මික ප්‍රදර්ශනය - 2014 | **500,000.00** | **500,000.00** | **100** | **100** |






"ගොවිපළෙන් මුළුතැන්ගෙට" යන තේමාව යටතේ ජාතික කෘෂි ව්‍යාපාර මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ගොවි සම්මාන හා කෘෂිකාර්මික ප්‍රදර්ශනය - 2014 මඟින් නව තාක්ෂණය ගොවි ජනතාවට හඳුන්වාදීම සිදු කෙරෙන අතර, ගොවිතැනේ වඩාත් දක්ෂ ගොවි මහත්ම මහත්මීන් දිරිගැන්වීම හා ඔවුන්ගේ මෙහෙය ඇගයීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

### 4.13 කෘෂිකර්ම අමාත්‍යාංශය

| වැඩසටහන | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| ගොවිසතිය හා කෘෂිකාර්මික ප්‍රදර්ශනය - 2014 | **12,500,000.00** | **12,146,746.00** | **97** | **100** |
| ජනාධිපති මන්දිරවල හරිතාගාර ඉදි කිරීම | **168,239.79** | **168,239.79** | **100** | **100** |
| එකතුව | **12,668,239.79** | **12,314,985.79** | | |

## ණය මුදල් නිදහස් කිරීම්

### 1. කෙටිකාලීන ණය

| වැඩසටහන | ක්‍රියාත්මක ආයතනය | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 1.1.පොහොර පරීක්ෂණ වැඩසටහන | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | **1,000,000** | **500,000** | **50** | **100** |
| 1.2.සහල් ආශ්‍රිත දේශීය බිස්කට් නිෂ්පාදනය සඳහා බීජ වී නිෂ්පාදනය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | **1,000,000** | **500,000** | **50** | **100** |
| 1.3.හෙළ ගොවිතැන ප්‍රවර්ධන වැඩසටහන | විශේෂ ව්‍යාපෘති අමාත්‍යාංශය | **2,500,000** | **2,500,000** | **100** | **100** |
| එකතුව | | **4,500,000** | **3,500,000** | | |

## 1.1. පොහොර පරීක්ෂණ වැඩසටහන

ශ්‍රී ලංකාවට ආනයනය කරන, නිර්දේශ නොකරන ලද පොහොර වර්ගයන්හි යෝග්‍යතාවය පරීක්ෂා කිරීම මෙහි ප්‍රධානතම අරමුණ වන අතර, එමඟින් ගොවියා වෙත වඩා ගුණාත්මක හා වැඩි ඵලදායීතාවයකින් යුත් පොහොර වර්ග හඳුන්වා දීම ද අරමුණු කොට ගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.





## 1.2. සහල් ආශ්‍රිත දේශීය බිස්කට් නිෂ්පාදනය සඳහා බීජ වී නිෂ්පාදනය

අතිරික්ත සහල් නිෂ්පාදනය කාර්යක්ෂමව උපයෝගී කර ගැනීමේ ක්‍රමවේදයක් සැකසීම, වැඩි ඉල්ලුමක් පවතින ප්‍රභේදවල බීජ වී සුලභ කිරීම, සහල් ආශ්‍රිත දේශීය නිෂ්පාදන සුලභ කරවීම හා දිරි ගැන්වීම, දේශීය ව්‍යවසායකයන් හට ආයෝජන අවස්ථා උදා කර දීම, වී ගොවීන්ගේ කෘෂිකාර්මික ආදායම ඉහළ නැංවීම යන අරමුණු සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

## 1.3. හෙළ ගොවිතැන ප්‍රවර්ධන වැඩසටහන

වකුගඩු රෝගය ව්‍යාප්තව ඇති රාජාංගනය වම් ඉවුර ව්‍යාපාරයේ සාම්ප්‍රදායික වී ගොවිතැන ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති අමාත්‍යාංශය විසින් කටයුතු කරන ලද අතර, එම මාස් කන්නයේදී අක්කර 100 ක් පමණ සාම්ප්‍රදායික වී වගා කරනු ලැබූ අතර බිත්තර වී සඳහා බුසල් 2000 ක් මිලදී ගැනීමට අවශ්‍යව තිබුණි. ඒ සඳහා ගොවීන්ගේ භාරකාර අරමුදලින් රු.මි. 2.5 මුදලක් කෙටිකාලීන ණයක් වශයෙන් ලබා දෙන ලදි.

# 2. දිගු කාලීන ණය

| වැඩසටහන | ක්‍රියාත්මක ආයතනය | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| **2.1.**ගොවි බැංකු සඳහා අමතර ප්‍රාග්ධන මුදල් ලබා දීම | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | **49,500,000** | **39,300,000** | **79** | **100** |
| **2.2.**ගැඹුරු ළිඳක් ඉදි කිරීම - අනුරාධපුරය | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | **500,000** | **500,000** | **100** | **75** |
| **2.3.**කෘෂි ව්‍යාපාර නැංවීම සඳහා සමගාමී වැඩසටහන | කොළඹ විශ්වවිද්‍යාලය | **1,000,000** | **1,000,000** | **100** | **100** |
| එකතුව | | **50,000,000** | **39,800,000** | | |

## 2.1.ගොවි බැංකු ණය

සහනදායී පොළී පදනමක් යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා ගොවිජන බැංකු වෙතින් මෙම ණය වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. ගොවීන්ට අතරමැදියන්ගෙන් සිදුවන බලපෑම අවම කර ගැනීම, ගොවීන්ගේ ආර්ථික ශක්තිය වැඩිදියුණු කිරීම හා එමඟින් කෘෂිකර්මාන්තය ශක්තිමත් කිරීම මෙම ණය වැඩසටහන්වල අරමුණ වේ.

ගොවි බැංකු ණය පිළිබඳ විස්තර වාර්තාව

| වර්ෂය | ශේෂය 2014.12.31 දිනට(රු) | වර්ෂය තුළ ණය දීම්(රු) | වර්ෂය තුළ ආපසු ලැබීම්(රු) | වර්ෂය තුළ ලද පොළිය(රු) |
|---|---|---|---|---|
| 2010 | 158,759,000.00 | 21,500,000.00 | 85,000,000.00 | 2,373,274.93 |
| 2011 | 98,759,000.00 | 15,000,000.00 | 75,000,000.00 | 1,340,466.71 |
| 2012 | 71,500,000.00 | 35,000,000.00 | 62,259,000.00 | 560,671.33 |
| 2013 | 63,600,000.00 | 40,100,000.00 | 48,000,000.00 | - |
| 2014 | 69,050,000.00 | 39,300,000.00 | 12,050,000.00 | - |
| | | 150,900,000.00 | 282,309,000.00 | |

## 3. යතුරුපැදි ණය වැඩසටහන

ක්ෂේත්‍ර නිලධාරීන්ට විශේෂයෙන්ම කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් හා කෘෂිකර්ම උපදේශකවරුන්ගේ රාජකාරි පහසුවෙන් හා කාර්යක්ෂමව ඉටු කිරීම අරමුණු කරගෙන එම නිලධාරීන් හට සහන පොළියක් යටතේ මෙම ණය ලබා දී ඇත.

| ක්‍රියාත්මක ආයතනය | අනුමත මුදල (රු) | අරමුදල් නිදහස් කර ඇති ප්‍රමාණය (රු) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 4,860,100.00 | 3,299,520.00 | 68 |

## 4. ගොවීන්ගේ භාරකාර අරමුදලේ ආදායම් සාරාංශය (2013/2014)

| ආදායම් ස්වභාවය | ආදායම (රු) 2013.12.31 | ආදායම (රු) 2014.12.31 |
|---|---|---|
| ගොවිසෙත ලොතරැයි ආදායම | 196,220,108.00 | 234,996,160.00 |
| පොළී ආදායම | 116,914,876.02 | 81,366,998.07 |
| වෙනත් ලැබීම් | 375,500.00 | 345,000.00 |
| එකතුව | 313,510,484.02 | 316,708,158.07 |

## 5. ගොවීන්ගේ භාරකාර අරමුදලේ වියදම් සාරාංශය (2013/2014)

| වියදම් ස්වභාවය | වියදම (රු) 2013.12.31 | වියදම (රු) 2014.12.31. |
|---|---|---|
| සංවර්ධන | 103,910,755.75 | 42,864,565.91 |
| අත්තිකාරම් | 21,307,237.31 | 66,130,947.07 |
| ණය | 293,529,928.35 | 295,931,494.46 |
| එකතුව | 418,747,521.41 | 404,927,007.44 |

# 05. මූල්‍ය ප්‍රගතිය.

## 5.1 අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය (2014.12.31 දක්වා)

| වැඩසටහන 01 - මෙහෙයුම් වැඩසටහන | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය 01 - අමාත්‍ය කාර්යාලය | | | | | |
| අයිතමය | විස්තරය | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු) | මුළු වියදම (රු) | ඉතුරුම් අතිරික්තය (රු) | % |
| | **පුනරාවර්තන වියදම්** | **48,147,000** | **47,524,707.73** | **622,292.27** | **99%** |
| | පුද්ගල පඩි නඩි | 19,409,690 | 19,406,267.62 | 3,422.64 | 100% |
| | ගමන් වියදම් | 5,937,310 | 5,503,617.88 | 433,691.86 | 93% |
| | සැපයීම් | 10,900,000 | 10,867,960.81 | 32,039.19 | 100% |
| | නඩත්තු වියදම් | 9,200,000 | 9,129,984.09 | 70,015.91 | 99% |
| | කොන්ත්‍රාත් සේවා | 2,700,000 | 2,616,877.33 | 83,122.67 | 97% |
| | **මූලධන වියදම්** | **58,900,000** | **49,688,796.50** | **9,211,203.50** | **84%** |
| | මූලධන වත්කම් වල පුනුරුත්තාපනය හා වැඩි දියුණු කිරීම | 4,200,000 | 3,594,570.00 | 605,430.00 | 86% |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 54,700,000 | 46,094,227 | 8,605,774 | 84% |
| | **මුළු ව්‍යාපෘතිවල වියදම** | **107,047,000** | **97,213,504.23** | **9,833,495.77** | **91%** |

| වැඩසටහන 01 - මෙහෙයුම් වැඩසටහන | | | | | |
|---|---|---|---|---|---|
| වාපෘතිය 02 - ආයතන පරිපාලන සේවා | | | | | |
| අයිතමය | විස්තරය | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු) | මුළු වියදම(රු) | ඉතුරුම් අතිරික්තය(රු) | % |
| | පුනරාවර්තන වියදම් | **109,123,317** | **101,901,369.73** | **7,221,947.27** | **93%** |
| | පුද්ගල පඩි නඩි | 50,173,917 | 48,430,129.36 | 1,743,787.64 | 97% |
| | ගමන් වියදම් | 1,599,400 | 679,215.01 | 920,184.99 | 42% |
| | සැපයීම් | 10,656,388 | 8,590,419.82 | 2,065,968.18 | 81% |
| | නඩත්තු වියදම් | 13,300,000 | 12,017,134.98 | 1,282,865.02 | 90% |
| | සේවා | 31,564,000 | 30,356,623.96 | 1,207,376.04 | 96% |
| | මාරු කිරීම් | 1,829,612 | 1,827,846.60 | 1,765.40 | 100% |
| | මූලධන වියදම් | **25,682,600** | **24,100,020.26** | **1,582,579.74** | **94%** |
| | මූලධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 11,853,294 | 11,851,386.01 | 1,908.43 | 100% |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 12,312,458 | 10,731,786.51 | 1,580,671.31 | 87% |
| | හැකියා වර්ධනය | 1,516,848 | 1,516,847.74 | - | 100% |
| | මුළු ව්‍යාපෘතිවල වියදම | **134,805,917** | **26,001,389.99** | **8,804,527.01** | **93%** |

| වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහන් | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘති 03 - කෘෂි සංවර්ධන වැඩසටහන | | | | | |
| අයිතමය | විස්තරය | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු) | මුළු වියදම (රු) | ඉතුරුම් අතිරික්තය (රු) | % |
| | **පුනරාවර්තන වියදම්** | **514,497,083** | **50,215,321.38** | **4,281,761.62** | **88%** |
| | පුද්ගල පඩි නඩි | 442,029,083 | 394,626,610.36 | 47,402,472.64 | 89% |
| | ගමන් වියදම් | 7,500,000 | 2,676,182.04 | 4,823,817.96 | 36% |
| | සැපයීම් | 14,200,000 | 13,280,029.78 | 919,970.22 | 94% |
| | නඩත්තු වියදම් | 6,068,000 | 5,313,553.02 | 754,446.98 | 88% |
| | සේවා | 9,700,000 | 7,923,871.07 | 1,776,128.93 | 82% |
| | මාරු කිරීම් | 35,000,000 | 26,395,075.11 | 8,604,924.89 | 75% |
| | **මූලධන වියදම්** | **595,057,421** | **591,039,374.15** | **4,018,046.83** | **99%** |
| | මූලධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 900,000 | 762,906.66 | 137,093.34 | 85% |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 13,000,000 | 12,285,193.71 | 714,806.29 | 95% |
| 2502 | හැකියා වර්ධනය | 700,000 | 693,784.79 | 6,215.21 | 99% |
| | අනෙකුත් ප්‍රාග්ධන වියදම් | 580,457,421 | 577,297,489 | 3,159,932 | 99% |
| | **මුළු ව්‍යාපෘතිවල වියදම** | **1,109,554,503.98** | **1,041,254,695.53** | **68,299,808.45** | **94%** |

| වැඩසටහන 02 - සංවර්ධන කාර්යයන් | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘති 04 - පොහොර පනත ක්‍රියාත්මක කිරීම | | | | | |
| අයිතමය | විස්තරය | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු) | මුළු වියදම (රු) | ඉතුරුම් අතිරික්තය (රු) | % |
| | **විස්තරය** | **34,869,452,579** | **31,857,344,231.76** | **3,012,108,347.26** | **91%** |
| | පුනරාවර්තන වියදම් | 49,500,000 | 48,256,551.86 | 1,243,448.14 | 97% |
| | පුනරාවර්තන වියදම් | 700,000 | 688,258.27 | 11,741.73 | 98% |
| | ගමන් වියදම් | 1,260,000 | 769,702.33 | 490,297.67 | 61% |
| | සැපයුම් | 600,000 | 400,557.42 | 199,442.58 | 67% |
| | නඩත්තු වියදම් | 5,500,000 | 4,884,260.00 | 615,740.00 | 89% |
| | කොන්ත්‍රාත් සේවා | 34,811,892,579 | 31,802,344,901.88 | 3,009,547,677.14 | 91% |
| | **පැවරීම** | **950,000** | **683,740.68** | **266,259.32** | **72%** |
| | ප්‍රාග්ධන වියදම් | 450,000 | 290,821.68 | 159,178.32 | 65% |
| | ප්‍රාග්ධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 500,000 | 392,919.00 | 107,081.00 | 79% |
| | **මුළු වියදම්** | **34,870,402,579** | **31,858,027,972.44** | **3,012,374,606.58** | **91%** |

| වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහන | | | | | |
|---|---|---|---|---|---|
| වාපෘතිය 5 - කෘෂිකර්ම/ ගොවිජන සංවර්ධන ආයතන හා සමාගම් | | | | | |
| අයිතමය | විස්තරය | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු) | මුළු වියදම (රු) | ඉතුරුම් අතිරික්තය (රු) | % |
| | පුනරාවර්තන වියදම් | **316,711,000** | **287,021,440** | **29,689,560.00** | 91% |
| 1503 | මුදල් මාරු කිරීම් හා සහනාධාර | | | | |
| | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි ක. පර් හා පුහුණු ආයතනය | 150,000,000 | 124,782,000 | 25,218,000.00 | 83% |
| | ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | 47,000,000 | 47,000,000 | - | 100% |
| | පශ්චාත් අස්වැන්න පිළිබද තාක්ෂණ ආයතනය | 75,000,000 | 72,724,250 | 2,275,750.00 | 97% |
| | කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | 27,711,000 | 26,015,190 | 1,695,810.00 | 94% |
| | ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය | 17,000,000 | 16,500,000 | 500,000.00 | 97% |
| | මූලධන වියදම් | **192,000,000** | **168,877,330** | **23,122,670.00** | 88% |
| 2201 | රජයේ ආයතන වලට මාරු කිරීම | | | | |
| | හෙ.කො. ගොවි. ක. පර්. හා පුහුණු ආයතනය | 12,000,000 | 6,475,330 | 5,524,670.00 | 54% |
| | ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | 70,000,000 | 66,554,000 | 3,446,000.00 | 95% |
| | පසු අස්වනු තාක්‍ෂණ ආයතනය | 75,000,000 | 70,401,000 | 4,599,000.00 | 94% |
| | කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | 30,000,000 | 20,447,000 | 9,553,000.00 | 68% |
| | ජාතික ආහාර ප්‍රවර්. මණ්ඩ. | 5,000,000 | 5,000,000 | - | 100% |
| | මුළු ව්‍යාපෘතිවල වියදම | **508,711,000** | **455,898,770** | **52,812,230.00** | 90% |

| කෘෂිකර්ම අමාත්‍යාංශය | | | | | |
|---|---|---|---|---|---|
| මූල්‍ය වාර්තා සාරාංශය -2015 | | | | | |
| අයිතමය | විස්තරය | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු) | මුළු වියදම (රු) | ඉතුරුම් අතිරික්තය (රු) | % |
| | පුනරාවර්තන වියදම් | **35,857,930,979** | **32,744,007,070.60** | **3,113,923,908.36** | **91%** |
| | පුද්ගල පඩි නඩි | **561,112,690** | **510,719,559.20** | **50,393,131.06** | **91%** |
| 1001 | වැටුප් හා වේතන | 320,541,099 | 292,256,952 | 28,284,147 | 91% |
| 1002 | අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 6,900,000 | 5,851,411 | 1,048,589 | 85% |
| 1003 | වෙනත් දීමනා | 233,671,591 | 212,611,196 | 21,060,396 | 91% |
| | ගමන් වියදම් | **15,736,710** | **9,547,273.20** | **6,189,436.54** | 61% |
| 1101 | ගමන් වියදම් දේශීය | 7,900,000 | 4,088,616 | 3,811,384 | 52% |
| 1102 | ගමන් වියදම් විදේශීය | 7,836,710 | 5,458,657.11 | 2,378,052.63 | 70% |
| | සැපයුම් | **37,016,388** | **33,508,112.74** | **3,508,275.26** | **91%** |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 9,677,251 | 9,359,910 | 317,341 | 97% |
| 1202 | ඉන්ධන හා ලිහිසි තෙල් | 26,979,137 | 23,850,136 | 3,129,001 | 88% |
| 1203 | නිල ඇඳුම් | 360,000 | 298,067 | 61,933 | 83% |
| | නඩත්තු වියදම් | **29,168,000** | **26,861,229.51** | **2,306,770.49** | **92%** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1301 | වාහන | 22,800,000 | 22,358,229 | 441,771 | 98% |
| 1302 | යන්ත්‍රෝපකරණ හා පිළියත | 4,168,000 | 2,303,819 | 1,864,181 | 55% |
| 1303 | ගොඩනැගිලි සහ නිර්මිත | 2,200,000 | 2,199,181.85 | 818.15 | 100% |
| | කොන්ත්‍රාත් සේවා | **49,464,000** | **45,781,632.36** | **3,682,367.64** | **93%** |
| 1401 | ප්‍රවාහන | 1,200,000 | 990,010.00 | 209,990.00 | 83% |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 9,050,000 | 7,534,165 | 1,515,835 | 83% |
| 1403 | විදුලි සහ ජලය | 16,100,000 | 14,981,421 | 1,118,579 | 93% |
| 1404 | ගෙවල් කුලි හා කුලී ගාස්තු | 714,000 | 713,980 | 20 | 100% |
| 1405 | වෙනත් | 22,400,000 | 21,562,056 | 837,944 | 96% |
| | පැවරිම | **35,165,433,191** | **32,117,589,264** | **3,047,843,927.37** | **91%** |
| 1503 | වත්කම් පැවරිම හා සහනාධාර | 316,711,000 | 287,021,440.00 | 29,689,560.00 | 91% |
| 1504 | සංවර්ධන සහනාධාර | 34,811,892,579 | 31,802,344,902 | 3,009,547,677 | 91% |
| 1505 | දායකත්ව ගාස්තු | 35,000,000 | 26,395,075.11 | 8,604,924.89 | 75% |
| 1506 | රාජ්‍ය සේවකයන්ට නිවාස ණය සඳහා ගෙවන පොලිය | 1,800,000 | 1,798,234.66 | 1,765 | 100% |
| 1701 | පාඩු හා කපා හැරීම් | 29,612 | 29,611.94 | 0 | 100% |
| | ප්‍රාග්ධන වියදම් | **872,590,021** | **834,389,261.59** | **38,200,759.39** | **96%** |
| | ප්‍රාග්ධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | **17,403,294** | **16,499,684.35** | **903,610.09** | **95%** |
| 2001 | ගොඩනැගිලි සහ නිර්මිත | 6,932,294 | 6,432,294.44 | 500,000.00 | 93% |
| 2002 | යන්ත්‍රෝපකරණ හා පිළියත | 1,721,000 | 1,435,480.00 | 285,520.00 | 83% |
| 2003 | වාහන | 8,750,000 | 8,631,909.91 | 118,090 | 99% |
| | ස්ථාවර වත්කම් අත්පත් කර ගැනිම | **80,512,458** | **69,504,125.72** | **11,008,332.10** | **86%** |
| 2101 | වාහන | 62,150,000 | 52,030,318 | 10,119,683 | **84%** |
| 2102 | ලිබඩු හා කාර්යාල උපකරණ | 10,857,989 | 10,857,522.28 | 466 | 100% |
| 2103 | යන්ත්‍රෝපකරණ | 7,504,469 | 6,616,286 | 888,183 | 88% |
| | පැවරීම් සහ සහනාධාර | **774,674,269** | **748,385,451.52** | **26,288,817.20** | **97%** |
| 2201 | ප්‍රග්ධන පැවරීම් සහ සහනාධාර | 192,000,000 | 168,877,330.00 | 23,122,670.00 | 88% |
| 2401 | පුහුණු හා හැකියා වර්ධනය | 2,216,848 | 2,210,632.53 | 6,215.21 | 100% |
| 2502 | වෙනත් ප්‍රාග්ධන වියදම් | 580,457,421 | 577,297,488.99 | 3,159,931.99 | 99% |
| | මුළු වියදම් | **6,730,521,000** | **33,578,396,332.19** | **3,152,124,667.81** | **91%** |

## 5.2 අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු

විගණන පරීක්ෂණ පැවැත්වීම

අභ්‍යන්තර විගණන අංශයට අයත් වී ඇති කාර්ය මණ්ඩලය හා අනෙකුත් සම්පත් මෙන්ම කාර්ය මණ්ඩලයේ පළපුරුද්ද හා පුහුණුව යන සීමාවන්ට යටත්ව අමාත්‍යාංශය යටතේ ඇති හඳුනාගත් අවධානම් සහිත ක්ෂේත්‍ර විගණනය සඳහා ප්‍රමුඛ අවධානය යොමු කරන ලදී. ඒ අනුව 2014 වර්ෂය තුළ විගණන පරීක්‍ෂණ 42 ක් සිදු කර ඇති අතර විස්තරාත්මක තොරතුරු පහත සඳහන් පරිදි වේ.

| ආයතනය | විගණන/විශේෂ පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 16 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 02 |
| පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්‍ෂණ ආයතනය | 03 |
| හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ පුහුණු ආයතනය | 01 |
| ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | 02 |
| ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | 01 |
| ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය | 01 |
| සී/ස ලංකා පොහොර සමාගම | 08 |
| සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 08 |
| එකතුව | 42 |

2014 වර්ෂය තුළදී මූල්‍ය විගණනයට වඩා අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන වෙන් කළ සංවර්ධන ව්‍යාපෘතිවල ක්‍රියාකාරීත්වය ඇගයීම සඳහා ක්‍රියාකාරීව විගණන වැඩසටහන් සිදු කරන ලදී.

සමස්තයක් ලෙස සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ පසු විපරම් ක්‍රියාවලිය පිළිබඳව අධ්‍යනය කළ අතර, කාර්යක්‍ෂම පසු විපරම් ක්‍රියාවලියක් සකස් කිරීමේ අවශ්‍යතාවය හා වැදගත්කම පිළිබඳව විගණන කළමනාකරණ කමිටුව හරහා කරුණු ඉදිරිපත් කිරීම සිදුකරන ලදී.

# 06. සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන් (2014 වර්ෂය)

## 1. <u>ඌව වෙල්ලස්ස කොකෝවා සංවර්ධන වැඩසටහන</u>

**2014** වර්ෂයේ දී නිලධාරින් හා ක්ෂේත්‍ර නිලධාරින් **82** ක් හා ගොවීන් **1154** ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කර ඇත. තව ද මේ වන විට හෙක්ටයාර් **270** ක භූමියක් සංවර්ධනය කිරීම සඳහා ගොවීන් **774** දෙනෙකු තෝරා ගෙන ඇති අතර පැළ ලක්ෂ **4** ක ප්‍රමාණයක් නිෂ්පාදනය කර ඇත.

| වැඩසටහන | මූල්‍ය ඉලක්කය (රු.) | මූල්‍ය ප්‍රගතිය (රු.) |
|---|---|---|
| ඌව වෙල්ලස්ස කොකෝවා සංවර්ධන වැඩසටහන | **5,000,000.00** | **2,939,061.76** |





## 2.<u>දැයට කිරුළ-2014</u>

දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය සඳහා අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන වන අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා කජු සංස්ථාව එක් සෙවනකට රැගෙන එමින් ඒකාබද්ධ ප්‍රදර්ශන කුටියක් ඉදි කරන ලද අතර , අදාළ ප්‍රදර්ශනය **2014.02.21** දින සිට **2014.03.01** දක්වා වයඹ විශ්වවිද්‍යාල භූමියේ දී අති සාර්ථකව පවත්වන ලදී.

| වැඩසටහන | ගෙවීම්කරන ලද වැය විෂය | ඇස්තමේන්තුගත මුදල (රු.) | 2014.12.31 දිනට වියදම (රු.) |
|---|---|---|---|
| දැයට කිරුළ | **180-01-02-01-2502** | **4,000,000.00** | **2,884,357.10** |

**2015** දී පැවැත්වීමට නියමිතව තිබූ දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට අදාළව "ගමකින් ගමකට ගෙයකින් ගෙයකට ප්‍රජා සත්කාරක සේවා හා ජංගම සේවා වැඩසටහන" ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා කජු සංස්ථාවට අදාළව **2014.06.02** සිට **2014.08.24** දක්වා සිදු කරන ලද ජංගම සේවා සමස්ත ප්‍රගතිය පහත දැක්වේ.



ගරු ඇමතිතුමා සහ ලේකම්තුමා විසින් ප්‍රදර්ශන කුටිය නිරීක්ෂණය කරමින්.

| දිස්ත්‍රික්කය | ඉදිරිපත් වූ ගැටළු සංඛ්‍යාව | එදිනම විසඳුම් ලබාදුන් ගැටළු සංඛ්‍යාව | ඉදිරියේ දී විසඳුම් ලබා දීමට හැකි ගැටළු සංඛ්‍යාව | වෙනත් ආයතන වෙත යොමු කල ගැටළු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| බදුල්ල | **1416** | **1340** | **36** | **40** |
| මොණරාගල | **2699** | **2676** | **18** | **05** |
| එකතුව | **4115** | **4016** | **54** | **45** |

## 3. දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන



**2014** දිවිනැගුම වැඩසටහනට අදාළව වාණිජ වගා ඒකක **1040** ක් අක්කර **930** ක් ආවරණය වන පරිදි වගා කර ඇති අතර අක්කර ½ සිට අක්කර **2 ½** දක්වා වූ ඉඩම්වල ආදර්ශවත් ලෙස අපනයන කෘෂිබෝග වගා කිරීමට ප්‍රතිලාභින් උනන්දු කරවීම හා අපනයන කෘෂිබෝග ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන වෙළඳපලට ඉදිරිපත් කිරීමෙන් ප්‍රතිලාභින්ගේ ආර්ථිකය නැංවීමේ අරමුණෙන් ස්ථාපිත කරන ලද ගෘහස්ත ආර්ථික ඒකක **30** ක් සඳහා දැරීමට සිදුවන පිරිවැයෙන් **50%** ක් රු. **30,000** ක උපරිමයකට යටත්ව ප්‍රතිලාභින් වෙත ගෙවීම් කටයුතු සිදුකර ඇත. තවද ගුණාත්මයෙන් යුතු පැළ නිෂ්පාදනය කිරීමේ අරමුණෙන් අළුතෙන් පැළ ගෘහ **09** ක් ඉදිකිරීම සඳහා ද ප්‍රතිපාදන ලබා දී ඇත. මීට අමතරව ගෙවතු වගා වැඩසටහන සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් අපනයන කෘෂි බෝග පැළ **830,000** ක් බෙදා දීම, බද්ධ කජු පැළ **183,093** ක් හා බීජ කජු පැළ **118,236** ක් බෙදා දී ඇත.

| වැඩසටහන | ගෙවීම් කරන ලද වැය විෂය | ඇස්තමේන්තුගත මුදල (රු.) | **2014.12.31** දිනට වියදම (රු.) |
|---|---|---|---|
| දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන | **105-02-01-01-2015** | **61,560,000.00** | **40,148,348.15** |
| | **105-02-02-01-2014** | **50,000,000.00** | **31,934,261.09** |

## 4. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ වැඩසටහන

බන්ධනාගාර රැඳවියන් සහ පුනරුත්ථාපනලාභින් රටේ සංවර්ධනයට දායකකර ගැනීමත් ඔවුන් පුනරුත්ථාපනය කොට යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමත් අරමුණු කරගෙන පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් හා සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාශ රැසක් ඒකරාශීව අන්තර් අමාත්‍යාශ වැඩසටහන ක්‍රියාත්මක කරගෙන යනු ලබයි.

දැනට මෙම වැඩසටහන ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතින අතර අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් **2014.07.31** වන විට බන්ධනාගාර ආශ්‍රිත ඉඩම් සංවර්ධනය යටතේ බදුල්ල තල්දෙන බන්ධනාගාරයේ කුරුඳු පැළ තවානක් ඉදි කර ඇති අතර, ගම්පහ මිතිරිගල බන්ධනාගාරයේ කුරුඳු ඉඩමෙහි ඵලදායිතා නැංවීම යටතේ හෙක්ටයාර් **01** ක සංවර්ධන කටයුතු සිදු කෙරෙමින් පවතී.

යුධ හමුදා කඳවුරු ආශ්‍රිත ඉඩම් සංවර්ධනය යටතේ කළුතර, දොඹගොඩ යුද හමුදා යුධෝපකරණ රෙජිමේන්තුව විසින් ගම්මිරිස් සහ කුරුඳු අක්කර **25.5** ක් වගා කර ඇති අතර කුරුඳු තැලුම් ඒකකයක් ස්ථාපනය කර ඇත. මීට අමතරව කරන්දෙණිය විශේෂ කාර්ය බලකාය විසින් කුරුඳු වගාව සාර්ථකව ස්ථාපනය කර ඇති අතර ඉඟුරු සහ කහ ගෙවතු වගාවක් වශයෙන් හඳුන්වා දී ඇත. තව ද

ගාල්ල බුස්ස හමුදා කඳවුර ද, කන්කසන්තුරේ යුධ හමුදා කඳවුර ආශ්‍රිතව ද අපනයන බෝග සංවර්ධනයට අදාළ කටයුතු ආරම්භ කර ඇත.

## 5. පොල් වගාව තුළ සුළු අපනයන බෝග වගාව

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ සීඝ්‍රයෙන් පැතිර ගොස් ඇති පොල් වගාවේ කොළ මැලවීමේ රෝගය නිසා විනාශ වූ පොල් වගා කරුවන්ගේ ආර්ථික සුරක්ෂිත බව තහවුරු කිරීම පිණිස විනාශ වූ පොල් වගාවන් ආශ්‍රිතව සුළු අපනයන බෝග හඳුන්වාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙමින් පවතී.

පොල් වගාව තුළ ඉඟුරු වගාකර ඇති අයුරු.......



එකී වැවිලිකරුවන් සඳහා කුරුඳු ,ගම්මිරිස් වැනි දිගුකාලීන බෝග වගාවන් මෙන්ම ඉඟුරු, කහ වැනි කෙටිකාලීන බෝගයන්ද හඳුන්වාදීම සිදුකොට ඇත .ඒ අනුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂය සඳහා කුරුඳු පැළ 400,000 ක් ද, ගම්මිරිස් පැළ 50,000 ක් ද, 2015 වර්ෂය සඳහා කුරුඳු පැළ 400,000 ක්ද ගම්මිරිස් පැළ 150,000 ක් ද නිෂ්පාදනය කර එම වැවිලිකරුවන් සඳහා ලබා දී ඇත.

## 6. ජාතික ගොවි සම්මේලනය

සුළු අපනයන බෝග ක්ෂේත්‍රයේ නියැලී සිටින පාර්ශවකරුවන්ගේ මූල්‍ය තත්ත්වය තවදුරටත් ඉහළ නැංවීමේ ක්‍රමෝපායන් හඳුන්වාදීමේ අභිලාෂයෙන් හා ජාතික මට්ටමේ ඉලක්කයන් කරා ගමන් කිරීමේ මූලික පියවර පිළිබඳ දැනුවත් කිරීම සඳහා සුළු අපනයන බෝග පාර්ශවකරුවන් සඳහා ජාතික ගොවි සම්මේලනයක් 2014.11.22 වන දින ජනාධිපති මන්දිරයේ දී පවත්වන ලදී.

## 7. කුළුබඩු පූජාව

දේශයේ ආර්ථිකයට ජීවය සපයන කෘෂිකාර්මික ක්ෂේත්‍රයක් වූ කුළුබඩු ක්ෂත්‍රයේ නිෂ්පාදන වල අග්‍රඵලය ශ්‍රී දළදා වහන්සේට උත්සව ශ්‍රීයෙන් පූජාකිරීම සඳහා සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව සංවිධානය කරන ලද කුළුබඩු පූජා මංගල්‍ය 2014.06.16 දින මහනුවර ශ්‍රී දළදා මාළිගා පරිශ්‍රයේ දී පවත්වනු ලැබී ය. ප්‍රධාන වශයෙන් කුරුඳු, සාදික්කා හා එනසාල් ඇතුළු නැවුම් කුළුබඩු පූජා කිරීම සිදු කෙරුණු අතර දළදා මාළිගයේ වාර්ෂික අවශ්‍යතාවය සඳහා වන කුළුබඩු පූජා කිරීම එදිනම සිදු කරන ලදී.



*මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ දී කුළුබඩු මංගල්‍යය සඳහා ගරු ඇමතිතුමාලේකම්තුමා සහ අධ්‍ය ,ක්‍ෂ ජනරාල්තුමා සහභාගී වූ අවස්ථාව...*

## 8. සුළු අපනයන බෝග උපායමාර්ගික සංවර්ධන සැලැස්ම එළි දැක්වීම හා වැඩමුළුව (2015-2025)



උපාය මාර්ගික සැලැස්ම එළිදැක්වීමේ අවස්ථාව

ඉදිරි දස වසර සඳහා සුළු අපනයන ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා සකස්කල ඒකාබද්ධ සැලැස්ම මෙහිදී ඉදිරිපත් කරන ලදී.මෙම උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම සැකසීමේ දී එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ පූර්ණ මූල්‍ය දායකත්වය හා උපදේශකත්වය ලබා දුන් අතර ක්ෂේත්‍රයේ සියලුම පාර්ශවකරුවන් හා විද්වතුන්ගේ සහභාගිත්වයෙන් 2014.12.18 දින මහ බැංකු ශ්‍රවණාගාරයේ දී එළිදැක්වීම සිදු කරන ලදී.

## 9. ප්‍රවර්ධන කාර්යයන්

**I.** සුළු අපනයන බෝග ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් සඳහා තොරතුරු ලබාදීමේ අරමුණින් අත්පත්‍රිකා කිහිපයක් මුද්‍රණය කර ඇත.

- ඒ අනුව 2014 වර්ෂයේ දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයේ දී කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ ගොවි ජනතාව දැනුවත් කිරීම සඳහා සුළු අපනයන බෝග ක්ෂේත්‍රයට සම්බන්ධ බෝග පිළිබඳව තොරතුරු හා අමාත්‍යාංශයේ කාර්යභාරය ඇතුළත් කර සිංහල භාෂාවෙන් එක් අත් පත්‍රිකාවක් "සුළු අපනයන බෝග වගාවට අපෙන් අතහිත" යනුවෙන් ද, දෙමළ භාෂාවෙන් එක් අත් පත්‍රිකාවක් හා ඉංග්‍රීසි භාෂාවෙන් "Helping hand from us for cultivation of minor export crops" වශයෙන් අත් පත්‍රිකාවක් ද නිර්මාණය කරන ලදී.

- මීට අමතරව පුවක් වගාව ව්‍යාප්ත කිරීමේ අරමුණෙන් ජනතාව දැනුවත් කිරීමේ අභිලාශයෙන් " පුවක් වරුණ " නමින් අත් පත්‍රිකාවක් මුද්‍රණය කර ඇත.

**II.** සුළු අපනයන බෝග ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් සඳහා තොරතුරු දීප ව්‍යාප්තව ලබාදීමේ අරමුණින් පුවත්පත් දැන්වීමක් මුද්‍රණය කරන ලදී.

- ඒ අනුව 2014 වර්ෂය සඳහා "සුළු අපනයන බෝග සඳහා ආයෝජන ආධාර වැඩසටහන" යනුවෙන් සිංහල භාෂාවෙන් පුවත්පත් දැන්වීමක් "දිවයින" පුවත්පතේ 2014.05.28 දින පළකරන ලදී.

**III.** "සිරිත" නමින් ත්‍රෛමාසික සඟරාවක් එළි දැක්වීම.

සුළු අපනයන බෝග ක්ෂේත්‍රයේ නියැලි සිටින සියලුම පාර්ශවකරුවන් ආමන්ත්‍රණය කිරීම හා ඔවුන් වෙත එම ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන තොරතුරු සන්නිවේදනය කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමේ අරමුණෙන් ඇරඹි "සිරිත" සිව්මාසික පුවත්පත් සංග්‍රහයේ වෙළුම් 4ක් 2014 වර්ෂයේ දී එළිදක්වා ඇත. 2014.12.31 දිනට වියදම (රු.) 130,591.00







## 10. අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

| වැඩසටහන | ස්ථානය | දිනය | ක්‍රියාකාරකම්/ප්‍රගතිය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) |
|---|---|---|---|---|---|
| 1.තාක්ෂණික කුසලතා ප්‍රවර්ධන වැඩසටහන | ඉදිකිරීම්, අභ්‍යාස සහ සංවර්ධන ආයතනය, පැලවත්ත | 2014.04.25 හා 2014.05.23 | සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍යාශයට අයත් සංවර්ධන නිලධාරින් හා රාජ්‍ය කළමනාකරණ සේවයේ නිලධාරින් සඳහා තොරතුරු තාක්ෂණික දැනුම යාවත්කාලීන කිරීම, MS Office මෘදුකාංග මඟින් උපරිම ප්‍රයෝජන ගන්නා ආකාරය , ඊ මේල් හා අන්තර්ජාලය උපරිමයෙන් භාවිතා කරන ආකාරය පිළිබඳ දැනුම හා අවබෝධය ලබා දීමේ අරමුණින් වැඩසටහන් 2ක් පැවැත්වීම. | 2,000,000.00 | 878,801.20 |
| 2.සංවර්ධන වැඩසටහන් පිළිබඳ සංඛ්‍යාලේඛණ හා තොරතුරු එක්රැස් කිරීම | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය | 2014.05.08 හා 09 යන දෙදින | සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පවතින අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරින් සඳහා දත්ත හා තොරතුරු කළමනාකරණය පිළිබඳව අවබෝධයක් ලබා දීම සඳහා වැඩසටහන් 2ක් පැවැත්වීම | | |
| 3.කළමනාකරණ සේවයේ හා සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරින් සඳහා කලමනාකරණ කුසලතා ප්‍රවර්ධන වැඩසටහන | පැළවත්ත ඉදිකිරීම්, අභ්‍යාස සහ සංවර්ධන ආයතනය | 2014.10.24 වන දින | සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍යාශය හා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරින් සඳහා කළමනාකරණ කුසලතා හැකියාව ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහනක් පැවැත්වීම | | |

# 07. අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයවල සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති

## 7.1 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**පර්යේෂණ 1.** <u>නිකුත් කල නව බෝග ප්‍රභේද</u>





Bg 251GSR Bg 310 Bg 455






At 373 ලොකුලූනු - MIBO 1 හොරණ ලාවුළු 1 හොරණ ලාවුළු 2







හොරණ ලාවුළු 3 හොරණ පැපොල් දෙමුහුන් පොළොස්






මිරිස් (MIPC -1) බතල - HORDI මලී අඟුණ දුඹුරු කොල්ලු අඟුණ කළු කොල්ලු

- දේශීයව වැඩිදියුණු කළ මිරිස් දෙමුහුම් 6ක් සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද පරීක්ෂණ අත්හදා බැලීම් සිදුකරනු ලැබිණි.
- ලොකු ළූණු ආර 2ක අනුවර්තීබව පරීක්ෂා කිරීම සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් සිදු කරනු ලැබිණි.
- නව දිලීර නාශක 2ක් [ (ක්‍රෙසොසිම් - මෙතිල් 44.3% w/w සහ ටෙබුකොනසෝල් 25% WDG) (Kresoxim – methyl 44.3% w/w and Tebuconazole 25% WDG)] වී කොපු අංගමාරය සඳහා අගයනු ලැබු අතර මෙම දිලීරනාශක දෙකම *RhizoctoniaSolani*සඳහා වූ නිර්දේශිත පළිබෝධනාශක හා සමානවම හිතකර විය.
- මුං වගාවේදී තද බීජ ඇතිවීම සඳහා පසෙහි තෙතමනයෙහි සම්බන්ධතාවය පරීක්ෂා කිරීම උදෙසා අධ්‍යයනයක් සිදු කළ අතර එම අධ්‍යනයෙහි ප්‍රතිඵලයට අනුව මුංවල (*Vigna radiate* L) තද බීජ ඇතිවීම අවම කිරීම සඳහා වගාවට දින 4 කාල පරාස අන්තරයකදී 27.5%ක ජල මට්ටමක් යෙදිය යුතු බව හෙළිදරව් විණි.

- දිවයිනේ වෙනස් ප්‍රදේශ වලදී නව පැළෑටි රෝග 10ක් ඇතිවීම හඳුනා ගනු ලැබිණි.
- මිරිස්, ගර්කින් සහ පළා එළවළු සඳහා පළිබෝධවලින් තොරව වගා කිරීම උදෙසා උචිතම ක්‍රමය සමෝධානික රෝග කළමනාකරණය බව හඳුනා ගනු ලැබිණි.
- වට්ටක්කා කහපැහැ ගැන්වීමේ රෝගය ඇති වීම පමා කිරීම උදෙසා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කෙරිණි.
- පේර සහ අඹ ප්‍රධාන වශයෙන් වගා කරන්නා වූ ප්‍රදේශ සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ වැඩසටහන හඳුන්වා දෙනු ලැබිණි.
- තක්කාලි වල පිටිපුස් සහ යටිපුස් රෝග සහ බටුවල මුල් සහ කරල් විදින්නා පාලනය කිරීම උදෙසා නව අඩු විෂ සහිත දිලීරනාශක සහ කාමිනාශක හඳුනාගනු ලැබිණි.
- බිම්මල් වගා කිරීම උදෙසා නව තාක්ෂණ 2ක් හඳුන්වා දෙනු ලැබිණි.
    - අඩු පිරිවැයති බීජ නිෂ්පාදනය තාක්ෂණය මගින් නිෂ්පාදන කාර්යක්‍ෂමතාවයට බලපෑමක් ඇති නොකර ප්‍රාග්ධන සහ මෙහෙයුම් පිරිවැය 90%කින් අඩු කරගත හැක.
    - මුතුබෙල් බිම්මල් නිෂ්පාදනය සඳහා උපස්ථරයක් ලෙස පිදුරු යොදාගැනීම පිළිබඳ තාක්ෂණය ලබාදීම.
- කටුඅනෝදා පළතුරු ප්‍රචලිත කිරීමේ අරමුණු ඇතිව රත්නපුර ගම්මාන 4ක් සහ මාතර දිස්ත්‍රික්කයේ ගම්මාන 2ක් ස්ථාපිත කෙරිණි.
- රතු දුඹුරු පසෙහි බිංදු වාරි ක්‍රමය යටතේ මිරිස් සඳහා පොහොර මිශ්‍රිත ජල නිර්දේශිත පිළිවෙත් මාලාවක් වැඩිදියුණු කරනු ලැබිණි.
- පළතුරු වගාව සහ පරිභෝජනය ප්‍රචලිත කිරීම උදෙසා හොරණ පළතුරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයෙහි පළතුරු ප්‍රවර්ධන සතියක් පවත්වනු ලැබිණි.
- වගාව සහ බෝග සැකසුම් සඳහා පහසුකම් සැලසීම උදෙසා යන්ත්‍ර කිහිපයක් වැඩිදියුණු කෙරිණි. එනම්,
    - මඤ්ඤොක්කා වැටි සකසනය
    - කුරක්කන් කොළ මඩිනය
    - අධි ධාරිතා බඩ ඉරිඟු කොළ මඩිනය
    - අධි ධාරිතා බිත්තර වී පිරිසිදුකරණය
    - යදැති නඟුල් බීජ වප්කරය

## 1. බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

2014 වර්ෂය තුළදී නිකුත් කරන ලද බීජ ප්‍රමාණය පහත වගුවේ දැක්වේ.

| බෝගය | 2013/14 මහ | 2014 යල | එකතුව |
|---|---|---|---|
| මිරිස් | 4,168 kg | 1,099 kg | 5,267 kg |
| ලොකු ලූණු | 216 kg | 4.68 kg | 220.68 kg |
| බීජ අර්තාපල් | 228.4 mt | 352.81 mt | 581.21 mt |
| කව්පි | 12,139 kg | 12,888.8 kg | 25,027.8 kg |
| මුං ඇට | 170,780 kg | 29,738.8 kg | 200,518.8 kg |
| බඩඉරිඟු | 40,532 kg | 1,999.5 kg | 42,531.5 kg |
| උඳු | 30,526 kg | 9,669.25 kg | 40,195.25 kg |

## 2. බීජ සහතික කිරීම සහ පැළෑටි සංරක්ෂණය

- නීති කෙටුම්පත් ආයතනයට 1999 අංක 35 දරණ පැළෑටි සංරක්ෂණ පනතට නව රෙගුලාසි ඉදිරිපත් කරනු ලැබිණි.
- තොරතුරු පහසුවෙන් ලබාගැනිම සඳහා 2007 සිට 2014 දක්වා එළවළු සහ පලතුරු බීජ ආනයනය සඳහා නිකුත් කළ බලපත්‍ර 6000 සඳහා දත්ත වගුවක් වැඩිදියුණු කෙරිණි.
- විසිතුරු මල්පැළෑටි 30,122ක් ආනයනයට පෙර කෘමි පළිබෝධකයින්, වෛරස් සහ පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන් සඳහා පරීක්ෂා කරනු ලැබිණි.
- වැලිගම ප්‍රදේශයේ පොල් කොළ මැලවීමේ රෝගය පාලනය සඳහා බලයලත් නිලධාරීන් 19 දෙනෙකු සෘජුවම අනුයුක්ත කරනු ලැබිණි.
- වී, එළවළු ධාන්‍ය, බඩඉරිඟු, තෙල් බෝග පලතුරු සහ මුල් සහ ආකන්ධ බෝග පැළෑටි ජාන සම්පත් නියැදි 380ක් රැස්කරනු ලැබිණි.
- 2014.03.21 දිනැති 1845/43 අංක දරන රජයේ අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් පළිබෝධනාශක 5ක් [(ඇලක්ලෝ, සයිරොමයිසින්, පැරකෙයුට්, ඩයිමෙතොයෙට්, ෆේන්තියෝන්) (Alachlor, Cyromazine, Paraquat, Dimethoate&Fenthion)] තහනම් කිරීම උදෙසා නිල නිවේදනය ප්‍රකාශයට පත් කෙරිණි.

## 3. කෘෂිකර්ම ව්‍යාප්තිය

<u>අන්තර් පළාත් ප්‍රදේශ</u>

- වී නිෂ්පාදනය සහ ඵලදායිතාවය වැඩිකිරීම උදෙසා පාරිසරික හිතකර පිළිවෙත් මාලාවන් සහ යාන්ත්‍රීකරණ ක්‍රමෝපායන් ඇතුලත් වන යාය 2 වැඩසටහන හඳුන්වා දෙනු ලැබිණි.
- මැද කන්න වගාවන් සහිතව වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කරන්නාවූ භූමි ප්‍රමාණය වැඩිකිරීම උදෙසා විශේෂ අවධානයක් ලබා දුණි. විශේෂයෙන් ලොකු ළූණු, රතු ළූණු, බඩඉරිඟු, මුං, රටකජු, ඉඟුරු, කව්පි, සෝයා බෝංචි, මිරිස්, කුරක්කන් සහ උඳු යන බෝග අන්තර් පළාත් ප්‍රදේශ 6ක වගා කරනු ලැබිණි. පිළිවෙලින් 2013/2014 මහ සහ 2014 යල කන්න වලදී වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කළ භූමි ප්‍රමාණය හෙක්ටයාර 37,569 සහ හෙක්ටයාර 15,807ක් විය.
- 2013/2014 මහ සහ 2014 යල කන්න වලදී වී වගා කළ භූමි ප්‍රමාණය පිළිවෙලින් හෙක්ටයාර 164,331 සහ හෙක්ටයාර 79,853 විය. 2014 යල කන්නයේදි පැවති වියළි කාලගුණය හේතුවෙන් 2013 යල කන්නයට සාපේක්ෂව අඩු අස්වැන්නක් ලැබිණි.

<u>කෘෂි ව්‍යවසායික සංවර්ධන සහ තොරතුරු සේවාව</u>

- හැකියාව සහිත ව්‍යවසායකයින් සඳහා වාණිජමය ගොවිතැන පිළිබඳ පුහුණු වැඩසටහන් 20 ක් (මිනිස් දින 1620) පවත්වනු ලැබිණි.
- නව වාණිජමය ගොවිතැන් තාක්ෂණ පිළිබඳව වාණිජමය ගොවීන් 328 දෙනකු සඳහා සහාය ලබාදුණි.
- ව්‍යවසායකයින් සඳහා ව්‍යාපාරික යෝජනා 200 ක් වැඩිදියුණු කරනු ලැබිණි.

## කාන්තා කෘෂිකාර්මික ව්‍යාවසායික කාර්යයන්

- දේශීය ආහාර අලෙවි කිරීමට පේරාදෙණිය " හෙළ බොජුන් අලෙවි පියස" සම්බන්ධවීමට අවස්ථාවක් ලබාදුන් අතර නව ව්‍යවසායකයින් **28** දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් පුහුණු කරනු ලැබිණි.





- ගෙවතු වගාව සහ මුළුතැන්ගෙයි ප්‍රවර්ධනයන් තුළින් ගෘහණියන් **1640** දෙනෙකුගේ ආහාර සැකසීම පිළිබඳ දැනුම වැඩිදියුණු කෙරිණි.

## කෘෂිකාර්මික පුහුණුව

- ගොවීන්, පාසල් සිසුන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ අනෙකුත් ආයතන වල නිලධාරීන් සඳහා සේවා සංස්කරණ පුහුණු ආයතන **3** කදී, දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන **04**ක දී සහ ගොවි යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානයේ දී පුහුණු වැඩසටහන් **847**ක් (මිනිස් දින **53,174**ක්) පවත්වනු ලැබිණි.

## කෘෂිකාර්මික අධ්‍යාපනය

- **2014** වර්ෂයේ සිට කුණ්ඩසාලේ, අඟුණකොළපැලැස්ස, වවුනියා, පැල්වෙහෙර සහ කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලවලින් ලබා දුන් ඩිප්ලෝමා පාඨමාලාව, ජාතික වෘත්තීය සුදුසුකම් **6** වන මට්ටමෙහි කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාවක් ලෙස සංශෝධනය කෙරිණි.

- කෘෂිකර්ම විද්‍යාවලින් ඩිප්ලෝමා සිසුන් ලෙස ශිෂ්‍යයන් **248** දෙනෙකු විසිර ගිය අතර, ශිෂ්‍යයින් **485** දෙනෙකු කෘෂිකර්ම නිෂ්පාදන සහ තාක්ෂණය පිළිබඳව උසස් ජාතික කෘෂිකර්ම ඩිප්ලෝමාව හදාරමින් සිටිනු ලබයි.

- කෘෂිකර්ම විද්‍යාල විෂය පද්ධතිය තුළට නිපුණතා පදනම් පුහුණු විෂය මාලාවක් හඳුන්වා දෙනු ලැබිණි.

- ජාතික වෘත්තීය සුදුසුකම් **5** වන මට්ටම සඳහා වූ කෘෂිකර්ම නිෂ්පාදන සහ තාක්ෂණය පිළිබඳව ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා නව කෘෂිකර්ම විද්‍යාල **5** ක් වාරියපොළ, ලබුදූව, බිබිල, පල්මුණෛයි සහ වඩ්ඩක්කච්චි යන ප්‍රදේශවලදී **2015** වර්ෂයේදී විවෘත කිරීමට නියමිතය. මෙම පාසල් සඳහා ශිෂ්‍යයින් **230** දෙනෙකු අනුයුක්ත කරනු ලැබිය හැක.

කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදනය

- රූපවාහිනී වැඩසටහන් 102ක් (ගොවිබිමට අරුණලු - 50, මිහිතක දිනුවෝ - 52) නිෂ්පාදනය කරනු ලැබ රූපවාහිනියෙන් විකාශනය කෙරිණි.
- "දැයට කිරුළ" කුලියාපිටිය,"ජාතික ගොවි සතිය" තෙලිජ්ජවිල යන ප්‍රදර්ශන සහ "Gram 200" යන පලතුරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනය හොරණ, පලතුරු ප්‍රවර්ධන සතියක් පවත්වනු ලැබිණි.
- දේශීය සහ විදේශීය සංචාරකයෝ 140,000 දෙනෙක් ගන්නෝරුව සහ බටඅත කෘෂි උද්‍යාන නැරඹීමට පැමිණියහ.
- කෘෂි කාර්මික තොරතුරු ලබාදීම උදෙසා වෙබ් අඩවි 2 ක් (www.goviya.lk / www.knowledgebank.irri.org/Sri Lanka) පවත්වා ගෙන යනු ලබයි.
- ගාස්තුවකින් තොර කෘෂිකාර්මික තොරතුරු පද්ධතිය (දු.අ 1920) තුළින් සිදුකළ විමසීම 33,638 ක් සඳහා සහාය ලබාදුණි.
- මිරිස්, කුකර්බිටේසයේ, බිම්මල් සහ පළා, එළවළු වගාකිරීම පිළිබඳ බහුමාධ්‍ය නව සංයුක්ත තැටි 4 ක් නිෂ්පාදනය කරනු ලැබිණි.
- ගොවි විකාශන සේවාව හරහා සම්පූර්ණ ගුවන් විදුලි වැඩසටහන් 32 ක් විකාශය කරනු ලැබිණි.

## 2014 වර්ෂයේ මූල්‍යමය ප්‍රගතිය

වගුව 2: 2014 වර්ෂයේ ප්‍රතිපාදන සහ වියදම්

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන (රු. මිලියන) | වියදම (රු.මිලියන) |
|---|---|---|
| ප්‍රාග්ධන | 1,517 | 1,428 |
| පුනරාවර්තන | 2,758 | 2,752 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වැය ශීර්ෂය යටතේ ව්‍යාපෘති | 1,012 | 981 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය වැය ශීර්ෂය යටතේ ව්‍යාපෘති | 78 | 42 |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ව්‍යාපෘති | 91 | 91 |
| එකතුව | **5,456** | **5,294** |

## 7.2 අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වනුයේ අපනයන පරිමාව හා නිෂ්පාදන ගුණාත්මය ඉහළ නැංවීම ඔස්සේ වැඩි විදේශ විනිමයක් උපයා ගැනීම සඳහා අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ උන්නතිය හා සංවර්ධනය වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. නිල වර්ගීකරණයට අනුව මුළු වාර්ෂික නිෂ්පාදනයෙන් 50%කට වැඩි ප්‍රමාණයක් අපනයනය කරනු ලබන බහු වාර්ෂික බෝග සහ ඊට අමතරව, සුළු අපනයන බෝග විෂයභාර අමාත්‍යවරයා විසින් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විෂය පථයට ඇතුළත් කරනු ලැබිය යුතු යැයි නිර්දේශ කරනු ලබන ඕනෑම බෝගයක් අපනයන කෘෂි බෝගයක් යනුවෙන් හඳුන්වනු ලබයි. (තේ, රබර්, පොල් හා කජු යන අපනයන කෘෂි බෝග මෙම වර්ගීකරණයට අයත් නොවේ.) උක්ත වර්ගීකරණයට අනුව කුරුඳු, ගම්මිරිස්, කරාබු, සාදික්කා, කරදමුංගු, කෝපි, කොකෝවා, බුලත්, පුවක්, වැනිලා, පැඟිරි, සේර, ගොරකා, කිතුල්, ඉඟුරු හා කහ ආදී සාම්ප්‍රදායික බෝග සංවර්ධනය කෙරෙහි අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලික අවධානය යොමු වී තිබේ. මූලික වශයෙන් තාක්ෂණික දෙපාර්තමේන්තුවක් වන අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන භූමිකාව අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාදාමයන් හා බැඳී පවතී.

### 1) <u>ප්‍රධාන ක්‍රියාකාරකම්</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ 1992 සැප්තැම්බර් 22 දිනැති, අංක 46 දරන අපනයන කෘෂිකර්ම ප්‍රවර්ධන පනත මඟින් පහතින් දක්වා ඇති කාර්යයන් හා සේවාවන් සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ව්‍යවස්ථාපිත බලය පවරා තිබේ.

- අපනයන කෘෂි බෝග වගාව, පිරිසැකසුම්කරණය, සංවිධානය හා ප්‍රවර්ධනය
- බෝග සංවර්ධනය, බෝග වගාව, බෝග ආරක්ෂණය, පසු අස්වනු කළමනාකරණය හා ඒ හා බැඳුණු සමාජ ආර්ථික ක්‍රියාකාරකම්
- ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම
- බෝග නිෂ්පාදනය, ඵලදායිතා ප්‍රවර්ධනය හා ගුණාත්මක සංවර්ධනය සඳහා අපනයන කෘෂි බෝග ආධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම
- බෝග ආරක්ෂණ උපදේශන සේවා සැපයීම
- ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය ප්‍රවර්ධනය
- ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණය ප්‍රවර්ධනය
- කාබනික වගා ප්‍රවර්ධනය
- අලෙවිකරණය, ගුණාත්මක ප්‍රමිතීන් හා මිල ආදී දත්ත නිකුත් කිරීම
- අපනයන කෘෂි බෝග නිෂ්පාදිත හා රෝපණ ද්‍රව්‍ය ආනයනය පාලනය
- අපනයන කෘෂි බෝග නිෂ්පාදනය, පිරිසැකසුම්කරණය හා අලෙවියෙහි යෙදී සිටින පාර්ශ්වකරුවන් පුහුණු කිරීම
- වැවිලි අංශය තුළ අපනයන කෘෂි බෝග ප්‍රවර්ධනය සඳහා උපදේශන සේවා සැපයීම.
- අපනයන කෘෂි බෝග ආශ්‍රිත කටයුතුවල නියැළී සිටින රාජ්‍ය හා පුද්ගලික සංවිධාන අතර සහසම්බන්ධතාව ශක්තිමත් කිරීම
- 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්ම පනත යටතේ විධායක බලය
- අපනයන කෘෂි බෝග ආශ්‍රිත ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් අනෙකුත් රාජ්‍ය සංවිධාන වෙත උපදෙස් සැපයීම
- අපනයන කෘෂි බෝග ආශ්‍රිත තාක්ෂණය ප්‍රචලිත කිරීම උදෙසා ආදර්ශන පවත්වාගෙන යාම.

## 2) සංවර්ධන අංශය

- නව/නැවත වගා වැඩසටහන
- පවතින වගා සඳහා ඵලදායිතා වර්ධන වැඩසටහන
- අපනයන කෘෂි බෝග වල ගුණාත්මක බව වැඩි දියුණු කිරීම
- පාර්ශවකරුවන් පුහුණු කිරිමේ වැඩසටහන

### 2.1. නව වගා වැඩසටහන

නව වගා සඳහා අපනයන කෘෂි ආධාර යෝජනා ක්‍රමය 1972 දී දෙපාර්තමේන්තුව පිහිටුවීමත් සමග ආරම්භ විය. ආරම්භයේ දී නොමිලේ රෝපණ ද්‍රව්‍ය ලබා දුන් අතර ඊට අමතරව තාක්ෂණික තොරතුරු සම්පාදනය, සාර්ථක වගා සඳහා තෝරාගත් කෘෂි අපනයන බෝග වගා කිරීම වෙනුවෙන් සෘජු මූල්‍ය ආධාර සැපයීම ආදිය ද සිදු කරන ලදී. නව වගා ආධාර යෝජනා ක්‍රමය දිගුකාලීන ආර්ථික වැදගත්කමක් ඇති තෝරා ගත් බෝග කිහිපයකට සීමා වී ඇත. ඉහත යෝජනා ක්‍රමය යටතේ 2014 වර්ෂයේ වගා කරන ලද වගා වපසරිය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| 2014 වර්ෂයේ නව වගා වැඩසටහන | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| භෞතික ප්‍රගතිය (හෙක්.) | 2,357 | 2,794.7 |
| මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 134.00 | 133.992 |

### 2.2. නව වගා සඳහා ආයෝජන ආධාර ලබාදිම

නව වගා සඳහා ආයෝජන ආධාර ලබාදිමේ වැඩසටහන යටතේ 2014 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි වේ.

| නව වගා සඳහා ආයෝජන ආධාර ලබාදිම | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| භෞතික ප්‍රගතිය (හෙක්.) | 1,600 | 977.8 |
| මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | 16.00 | 10.709 |

### 2.3. ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන

අපනයන කෘෂි බෝග වගා වපසරිය පුළුල් කිරීමේ අවස්ථා සීමාසහිත ය. මේ නිසා, අඩු බෝග ඝනත්වය හා දුර්වල බෝග කළමනාකරණය හේතුවෙන් අඩු නිෂ්පාදනයක් පෙන්නුම් කරන අපනයන කෘෂි වගාවන්ගේ වගා ඒකකයකින් ලැබෙන අස්වැන්න වැඩි කිරීම සඳහා ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන හඳුන්වා දෙන ලදී. දැනට පවතින ගම්මිරිස්, කුරුඳු, කොකෝවා, කෝපි, කරාබුනැටි, කරදමුංගු, කරාබු හා සාදික්කා වගාවන් වැඩි දියුණු කිරීම අරමුණු කොට ගනිමින් වගාකරුවන්ට තාක්ෂණික උපදෙස් ලබා දීම, පාළු සිටුවීම සඳහා නොමිලේ රෝපණ ද්‍රව්‍ය සැපයීම හා අවුරුදු තුනක කාලයක් සඳහා මූල්‍ය ආධාර පිරිනැමීම මෙමඟින් සිදු කෙරේ. මෙම ආධාර යෝජනා ක්‍රමයට සුදුසුකම් ලැබීම සඳහා වගා පාළු සිටුවීම, පාංශු සංරක්ෂණ ක්‍රම, වගා හා සෙවන කප්පාදුව, කාබනික පොහොර භාවිතය හා ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය ආදී නිසි කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කළ යුතු වේ. මෙම වැඩ සටහනේ ප්‍රගතිය පහත පරිදි වේ.

| ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| භෞතික ප්‍රගතිය (හෙක්.) | 1,990 | 1,980.2 |
| මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | 29.00 | 28.457 |

- <u>ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන සඳහා ආයෝජන ආධාර ක්‍රමය - 2014 ප්‍රගතිය</u>

| ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන සඳහා ආයෝජන ආධාර ක්‍රමය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| භෞතික ප්‍රගතිය (හෙක්.) | **5,040** | **4,456.1** |
| මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | **51.0** | **17.5** |

## 2.4 අපනයන පරිමාව

**2014** වර්ෂයේ අපනයනය කල අපනයන කෘෂි බෝග පරිමාව සහ අපනයන ආදායම පහත පරිදි වේ. **(2014.12.31 දක්වා)**

| | |
|---|---|
| අපනයන පරිමාව (මෙ.ටො.) | **59,827.3*** |
| අපනයන ආදායම (රු. මි.) | **43,223.5*** |

*යාවත්කාලීන

## 2.5 පශ්චාත් අස්වනු තාක්ෂණ උපදේශන සේවාව

අපනයන කෘෂි නිෂ්පාදනවල ගුණාත්මය ඉහළ නැංවීම අරමුණු කොටගෙන **1998** වසරේ දී පසු අස්වනු තාක්ෂණ උපදේශන සේවාව ආරම්භ කරන ලද අතර මෙම වැඩසටහන පසුගිය වර්ෂයේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි. පසු අස්වනු ක්‍රියාකාරකම් සඳහා වන ආධාර යෝජනා ක්‍රමය **2007** වසරේ ජූනි මාසයේ දී සංශෝධනයට ලක් කෙරිණි. මෙහි දී විවිධ මට්ටම්වල පාර්ශවකරුවන්ට ගැළපෙන පරිදි ආධාර යෝජනා ක්‍රම තුනක් හඳුන්වා දෙන ලදී. මෙම යෝජනා ක්‍රම ත්‍රිත්වය හඳුන්වා දීමේ ප්‍රධාන අරමුණ වූයේ විදේශ වෙළඳපොළෙහි තරඟකාරීත්වයට මුහුණ දිය හැකි පරිද්දෙන් නිෂ්පාදිතයන්ගේ ගුණාත්මය පවත්වා ගෙන යාම, නිෂ්පාදන විවිධාංගීකරණය හා අගය එකතු කිරීම හා අපනයන කෘෂි බෝග නිෂ්පාදන අලෙවිය සඳහා පහසුකම් සැපයීම යි. මෙම ආධාර යෝජනා ක්‍රම පිළිබඳ පැහැදිළි කිරීමක් පහතින් දක්වා ඇත.

### i. කණ්ඩායම් පිරිසැකසුම් ඒකක

මෙම ආධාර යෝජනා ක්‍රමයට සුදුසුකම් ලබන්නේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ගොවි සංවිධාන වන අතර, මේ යටතේ නිෂ්පාදන පිරිසැකසුම්කරණය සඳහා අවශ්‍ය වන යන්ත්‍රෝපකරණ නොමිලයේ ගොවි සංවිධාන වෙත සපයනු ලැබේ. මෙම සැකසුම් ඒකක පාලනය කිරීමේ හා යන්ත්‍රෝපකරණ පරිහරණය කිරීමේ වගකීම ගොවි සංවිධානය සතු ය. තව ද සියලුම යන්ත්‍රෝපකරණ රඳවා තැබීමට අවශ්‍ය පිරිසැකසුම් ගොඩනැගිලි ස්ථාපනය කිරීමට සුදුසු භූමියක් හඳුනා ගැනීමේ කාර්යය ද ගොවි සංවිධානය විසින් සිදු කළ යුතු ය. මෙම පිරිසැකසුම් මධ්‍යස්ථාන ක්‍රියාත්මක කරවීම හා නඩත්තු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දෙමින් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ගොවි සංවිධානවලට සහාය ලබා දේ.

### ii. මධ්‍යම පිරිසැකසුම් ඒකක

මෙම ආධාර ක්‍රමය හඳුන්වා දී ඇත්තේ පසු අස්වනු සැකසීමේ පහසුකම් ස්ථාපිත කර ගැනීම සඳහා රුපියල් මිලියනයකට ඉහළ ආයෝජනයක් කරමින් මහා පරිමාණ පිරිසැකසුම්කරණ වැඩපිළිවෙලක් ආරම්භ කිරීමේ හැකියාව ඇති අයදුම්කරුවන් සඳහා ය. මෙම ආධාර ක්‍රමය යටතේ රුපියල් මිලියන **0.5**ක උපරිමයකට යටත්ව මුළු ආයෝජනයෙන් **25%** ක් වන මුදල් ප්‍රදානයක් ආයෝජකයාට ලබා

ගත හැක. මධ්‍යස්ථානය නඩත්තුකිරීමේ හා ලාභය ප්‍රයෝජනයට ගැනීමේ සම්පූර්ණ බලය ආයෝජකයා සතු වේ.

**iii. ඒකපුද්ගල පිරිසැකසුම් ඒකක**

අපනයන කෘෂි බෝග පසු අස්වනු සැකසීම සඳහා පුද්ගලික සැකසුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට කැමති වැවිලිකරුවන් හෝ පිරිසැකසුම්කරුවන්හට මෙම ආධාර ක්‍රමය සඳහා ඉල්ලුම් කළ හැක.

2014 වර්ෂයේ පශ්චාත් අස්වනු යෝජනා ක්‍රමයේ ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ

| ඒකකය | 2014 වර්ෂය |
|---|---|
| පිරිසැකසුම් මධ්‍යස්ථාන | 55 |
| වාෂ්පශීලී තෙල් ආසවන ඒකක | 14 |
| ගම්මිරිස් බීජ වෙන්කරන යන්ත්‍ර | 27 |
| උණුදිය ප්‍රතිකාරක කට්ටල | 29 |
| වියළන යන්ත්‍ර | 7 |
| ආරක්ෂිත කමත් | 2 |
| ශ්‍රේණි කිරීමේ යන්ත්‍ර (Graders) | 1 |
| ශ්‍රේණි කිරීමේ යන්ත්‍ර (Shifters) | 1 |
| කෝපි පොතුගලවන යන්ත්‍ර | 3 |
| සුදු ගම්මිරිස් නිෂ්පාදන යන්ත්‍ර | 12 |
| වෙනත් | 7 |
| කුරුඳු තැලුම් කට්ටල | 1100 |

❖ විශේෂයෙන්ම කුරුඳු වගාව සම්බන්ධයෙන් ගැටළුවක්ව පවතින කුරුඳු තැලුම්කරුවන්ගේ හිඟතාවය අවම කර ගැනිම සඳහා කුරුඳු තැලුම්කරුවන් පුහුණු කිරිම සහ පුහුණු වන සියලු ගොවියන් සඳහා කුරුඳු තැලුම් උපකරණ කට්ටල ලබා දෙනු ලැබේ. ඒ අනුව 2014 වර්ෂයේ කුරුඳු තැලුම්කරුවන් 1008 ක් පුහුණු කර ඇත.

## 2.6 මානව සම්පත් සංවර්ධනය

යාවත්කාලීන කරන ලද තාක්‍ෂණික තොරතුරු මඟින් ගොවීන්ගේ හා වෙනත් පාර්ශ්වකරුවන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා හා අපනයන කෘෂි බෝග වගා කිරීමේ දී හා පිරිසැකසුම් කිරීමේ දී දියුණු කළ කෘෂිකාර්මික පිළිවෙත්වලට අනුගත වීම සඳහා ගොවීන්ව දිරි ගන්වනු පිණිස එක් එක් දිස්ත්‍රික්කය භාර සහකාර අධ්‍යක්ෂවරයා විසින් ඔහුගේ සහායක තාක්‍ෂණ නිලධාරි මණ්ඩලය හා සමඟ ගොවි පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම සිදු කරනු ලබයි. පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා අවශ්‍ය පරිදි පර්යේෂණ අංශයෙන් සම්පත්දායකයන් හා වෙනත් සේවා සැපයිණි. 2014 වර්ෂය තුළ පැවැත්වුණු පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත වගුවෙන් දැක්වේ.

පුහුණු වැඩසටහන් - 2014

| ක්‍රියාකාරකම | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| ගොවි පුහුණු හා ක්ෂේත්‍ර දින | **3,065** | **86,482** |
| නිලධාරි පුහුණු | **568** | **4,394** |

## 2.7 කාබනික වගා වැඩසටහන

ජාත්‍යන්තර වෙළෙඳපොළේ කාබනික ආහාර සඳහා පවතින ඉල්ලුම සලකමින් දෙපාර්තමේන්තුව විසින් **1998** වසරේ දී කාබනික ආහාර ප්‍රවර්ධනය ආරම්භ කරන ලදී. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන භූමිකාව වූයේ, කාබනික වගාව හා බැඳුණු මූලධර්ම පිළිබඳව වගාකරුවන් දැනුවත් කිරීම, වාර්තා තබා ගැනීම සඳහා ඔවුන් දිරිමත් කිරීම, කාබනික පොහොර භාවිතය හා සමෝධානික පළිබෝධ කළමනාකරණය, ප්‍රවර්ධනය, පිරිසිදු තත්ත්වයෙන් යුත් පිරිසැකසුම්කරණ සංචිත සඳහා උපකාර කිරීම, ගොවීන්ට සාධාරණ මිලක් ගෙවන අපනයනකරුවන් හා සම්බන්ධ කිරීම ආදිය යි. වර්ෂයේ කාබනික වගා සංවර්ධන වැඩසටහන රු.මි. **0.43**ක මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කරයි.

**2014** කාබනික වගා සංවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය

| බෝගය | හෙක්. |
|---|---|
| කුරුඳු | **44.5** |
| ගම්මිරිස් | **4.1** |
| කරාබු /සාදික්කා | **0.6** |
| එකතුව | **49.2** |

## 2.8 ජනසන්නිවේදන හා ප්‍රචාරණ කටයුතු

**2014** වර්ෂයේ පැවැත්වූ රූපවාහිනී, ගුවන්විදුලි වැඩසටහන් සහ ප්‍රදර්ශනවල ප්‍රගතිය පහත පරිදි වේ.

| වැඩසටහන | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|
| රූපවාහිනී වැඩසටහන් සංඛ්‍යාව | **20** | **4.57** |
| ප්‍රදර්ශන සංඛ්‍යාව | **1** | |

## 2.9 කුළුබඩු උද්‍යාන පවත්වාගෙනයාම.

| | | | |
|---|---|---|---|
| භෞතික ප්‍රගතිය | **4** | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | **3.74** |

## 2.10 ගෙවතු මට්ටමින් පැළ බෙදා දිම.

කුඩා පරිමාණ ඉඩම් හිමියන්ට ආර්ථික ඵලදායිතාවයකින් යුතු ගෙවත්තක් සකස් කර ගැනීම පිණිස තම ගෙවත්තට අවශ්‍ය කුරුඳු, ගම්මිරිස්, කෝපි, පුවක්, ගොරකා, සාදික්කා, කරාබු යන පැළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් බෙදා දෙනු ලැබේ. මේ යටතේ **2014** වසරේදී පැළ **580,246** ක් ගොවීන් අතර බෙදා දී ඇත.

## 2.11 වාණිජ අපනයන කෘෂිබෝග වගා ඒකක ස්ථාපනය

අපනයන කෘෂිබෝග වගාවන් තුළින් ගොවීන්ගේ ආර්ථික මට්ටම ඉහල නැංවීම අරමුණු කොට ගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. ඒ ඒ බෝගය සඳහා වැඩි විභවයක් පවතින ප්‍රදේශ වලින් අක්කර ½ සිට අක්කර 2 ½ ක් දක්වා ඉඩම් තෝරා ගෙන ඒ සඳහා දැරීමට සිදුවන වියදමින් 50% ක් , උපරිමය රු. 30,000 කට යටත්ව ප්‍රතිපූර්ණය කරනු ලැබේ. මෙම වැඩසටහන යටතේ වාණිජ වගා ඒකක 853 ක අක්කර 903 වගා වපසරියක් මෙම වසර තුළදී ස්ථාපනය කරන ලදි.

## 2.12 ගෘහස්ථ ආර්ථික ඒකක

ගුණාත්මක බවින් වැඩි අපනයන කෘෂි බෝග නිෂ්පාදන සැකසීම සහ අගය එකතු කල නිෂ්පාදන වෙළඳපලට ඉදිරිපත් කිරීමේ අරමුණින් පසුඅස්වනු තාක්‍ෂණික උපකරණ කට්ටල හා යන්ත්‍ර මෙම වැඩසටහන යටතේ ගොවීන්ට බෙදා දෙනු ලැබේ. ඒ අනුව ගෘහස්ථ ආර්ථික ඒකක 29ක් සඳහා රුපියල් මිලියන 0.815 ක මුදලක් ආයෝජන ආධාර ලෙස ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇත.

## 2.13 පැළ නිෂ්පාදනය සඳහා සෙවන දැල් මඩු සකස් කිරිම

උසස් තත්ත්වයේ පැළ නිෂ්පාදනය සඳහා සෙවන දැල් මඩු 10 ක් සකස් කිරිම සඳහා රු.මි.1.26 ක මුදලක් ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇත.

## 3) <u>පර්යේෂණ අංශය</u>

පර්යේෂණ අංශයේ තාක්‍ෂණික ක්‍රියාකාරීත්වය හා සංවිධානය අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ) ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර පර්යේෂණ අංශයට විෂයානුබද්ධ පර්යේෂණ ඒකකය, ආර්ථික පර්යේෂණ ඒකකය හා ශාක ආරක්ෂණ ඒකකය යන ප්‍රධාන ඒකක තුනක් අයත් වේ. ගොවි ගැටළු විසඳීම මඟින් අපනයන කෘෂි බෝගවල නිෂ්පාදනය, ඵලදායීතාවය හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරිම සඳහා යෝග්‍ය තාක්‍ෂණික ක්‍රම ප්‍රවර්ධනය කිරීම සඳහා මාතලේ මධ්‍යම පර්යේෂණ ආයතනය හා උපපර්යේෂණ ආයතන හයක් නිරන්තරයෙන් පර්යේෂණ කටයුතුවල නියැළී සිටී.

**2014 වසරේ ක්‍රියාත්මක වූ පර්යේෂණ වල ප්‍රගතිය**

| අනු අංකය | ක්‍රියාකාරකම | සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය | මුල්‍ය ඉලක්කය (රු.මි.) | මුල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 01 | වගා බිම් ප්‍රමාණය වැඩිකිරිම | 11 | 95% | 2.6 | 2.13 |
| 02 | නිෂ්පාදන වියදම අවම කිරිම | 20 | 95% | 5.5 | 4.51 |
| 03 | පැලෑටි සංරක්‍ෂණ පර්යේෂණ | 23 | 96% | 4.5 | 3.69 |
| 04 | ඵලදායිතාව වැඩිවිම | 54 | 95% | 24.3 | 19.93 |
| 05 | අගය එකතු කල නිෂ්පාදන | 05 | 97% | 1.6 | 1.31 |
| 06 | ගුණාත්මය වැඩිදියුණු කිරිම | 23 | 95% | 4.5 | 3.69 |
| 07 | සමාජ ආර්ථික හා අලෙවිකරණය පිළිබඳ පර්යේෂණ | 03 | 90% | 1.3 | 1.07 |

## 7.3 ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

**ග්‍රාමීය ආර්ථිකය නංවාලීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දායකත්වය**

**ගොවිබිම් ආශ්‍රිත වගා කළ හැකි සියලුම ඉඩම්, සඵලදායි ලෙස වගාවන් සඳහා යොදවා ග්‍රාමීය ගොවි ජනතාවගේ ආර්ථිකය නඟා සිටුවීමට හා රට තුළ තිරසාර සංවර්ධනයක් ඇති කිරීම උදෙසා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව 2014 වර්ෂය තුළ පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබිණ.**

**පුරන්කුඹුරු අස්වැද්දීමේ හා සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන**

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද සංවර්ධන වැඩසටහන් අතර පුරන්කුඹුරු අස්වැද්දීම හා සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ වැඩසටහන ප්‍රධානතම සංවර්ධන වැඩසටහන වේ. සහල් අපනයන ආර්ථිකයක් ඉලක්ක කර ගනිමින් දිවයින පුරා පවතින වී වගාව සඳහා යොදවා ගත හැකි සියලුම පුරන්වූ කුඹුරු ඉඩම් යලි අස්වැද්දීම මෙමඟින් අපේක්ෂා කරන අතර 2014 වර්ෂයේ දී මේ සඳහා රු. මිලියන 2,450 ක් මුදලක් වෙන් කරන ලදි. මෙම ප්‍රතිපාදන මඟින් දිස්ත්‍රික්ක 17 ක් ආවරණය වන පරිදි ව්‍යාපෘති 2,642 ක් ක්‍රියාත්මක කරනු ලැබ, ඉන් ව්‍යාපෘති 1937 ක වැඩ 2014 වර්ෂයේ දී සම්පූර්ණයෙන් නිම කරනු ලැබිණි. මේ සඳහා දරන ලද වියදම රු.මිලියන 1,197.8 කි. මෙමඟින් ප්‍රතිලාභ ලබන ගොවිපවුල් සංඛ්‍යාව 578,772 කි.**



ප්‍රතිසංස්කරණය කරන ලද මාතලේ හෙට්ටිපොළ රත්කරල් වැව



ප්‍රතිසංස්කරණය කරන ලද පොළොන්නරුව එකසයිස් වැව



ප්‍රතිසංස්කරණය කරන ලද රත්මල්ගොඩ කරගස්තැන්න අමුණ - පොල්ගහවෙල



ප්‍රතිසංස්කරණය කරන ලද කොල්ලුර අමුණ - පොල්ගහවෙල

## ගොවිජන සේවා මධ්‍යස්ථාන අළුත්වැඩියාව

සේවාවන් ලබා ගැනිමට පැමිණෙන ගොවිජනතාව අභිප්‍රේරණය වන පරිදි නවීන තාක්‍ෂණික වගා ක්‍රම උපයෝගි කර ගෙන ආදර්ශ වගාවන් සහිත නව සැලැස්මකට අනුව ගොවිජන සේවා මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරිම මෙමඟින් අපේක්‍ෂා කෙරේ. මේ සඳහා 2014 වර්ෂයේ රු.මි. 450 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර දිස්ත්‍රික් 25 ම ආවරණය වන පරිදි දිවයින පුරා පිහිටි සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරිම සඳහා ව්‍යාපෘති 677 ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.මි. 397 ක් වැය කරන ලදි. මෙමඟින් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව දළ වශයෙන් ගොවිපවුල් 646,594 කි.



අළුත්වැඩියා කරන ලද කිරිඇල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානය



කුරුවිට ගොවිජන සේවා මධ්‍යස්ථානයේ වැට හා ගේට්ටුව අළුත්වැඩියාව

## ගොවිජන සේවා මධ්‍යස්ථාන නව ඉදි කිරිම්

ගොවිජන සේවා මධ්‍යස්ථාන අළුතින් ඉදිකිරිම සඳහා 2014 වර්ෂයේ රු. මිලියන 150 ක ප්‍රතිපාදන වෙන් කරනලද අතර දිස්ත්‍රික් 13 ක් ආවරණය කරමින් නව ගොවිජන සේවා මධ්‍යස්ථාන 18 ක් ඉදිකරන ලදි. වැය කරන ලද මුළු මුදල රු. මිලියන 69 කි. මෙමඟින් ප්‍රතිලාභ ලබන ගොවිපවුල් සංඛ්‍යාව 12,731 කි.



අළුතින් ඉදිකරන ලද අම්පාර පානම ගොවිජන සේවා මධ්‍යස්ථානය



අළුතින්ඉදිකරන ලද කිළිනොච්චිය උරුත්තිපුරම් ගොවිජන සේවා මධ්‍යස්ථාන

## ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාල අළුත්වැඩියාව

**2014** වර්ෂයේ ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාල අළුත්වැඩියාව සඳහා රු. මිලියන **30** ක් වෙන්කරන ලද අතර දිස්ත්‍රික් **17** ක් ආවරණය වන පරිදි ව්‍යාපෘති **22** ක් සඳහා රු.මි. **25** ක් වැය කරනු ලැබිණි. මෙමගින් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව දළ වශයෙන් ගොවිපවුල් **419,381** කි.

## පොහොර ගබඩා ඉදිකිරීම්

ගබඩා ධාරිතාව ඉහල නැංවීම හා පොහොර බෙදා හැරීම ක්‍රමවත් කිරීමේ අරමුණින් දිවයින පුරා දිස්ත්‍රික් **22** ක් ආවරණය වන පරිදි පොහොර ගබඩා **25** ක් (නව කර්මාන්ත **24** ක් හා අවිච්ඡේද **01**) ඉදිකිරීම සඳහා **2014** වර්ෂයේ රු.මි. **50** ක් වෙන් කරන ලදි. පොහොර ගබඩා **22**ක ඉදිකිරීම් අවසන් කරන ලද අතර වැය කරන ලද මුදල රු. මිලියන **39.3** කි. මෙමගින් ප්‍රතිලාභ ලබන ගොවි පවුල් සංඛ්‍යාව දළ වශයෙන් **21,150** ක් පමණ වේ.



ඉදිකරන ලද වවුනියාව මඩුකන්ද පොහොර ගබඩාව



ඉදිකරන ලද මන්නාරම් දූපත පොහොර ගබඩාව

## දැයට කිරුළ සංවර්ධන වැඩසටහන 2014

දැයට කිරුළ සංවර්ධන වැඩසටහන සඳහා **2014** වර්ෂයේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට රු. මිලියන **24** ක ප්‍රතිපාදන වෙන් කරන ලදි. මේ යටතේ කුරුණෑගල, පුත්තලම, කෑගල්ල යන දිස්ත්‍රික්කයන් හි සංවර්ධන කටයුතු හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිර්මාණ කටයුතු වෙනුවෙන් වැය කරන ලද මුදල රු.මි. **4.32** කි.

## ගොවින්ගේ භාරකාර අරමුදල

ගොවින්ගේ භාරකාර අරමුදල මගින් පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබිණ.

- කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් මාතර දිස්ත්‍රික්කය සඳහා කෘෂිමාර්ග **36** ක් ඉදි කිරීම වෙනුවෙන් රු.මි: **12** ක මුදලක් දෙපාර්තමේත්තුව වෙත වෙන් කරන ලදුව ඉන් කෘෂිමාර්ග **13** ක් ඉදි කර අවසන් කර ඇති අතර වැය කළ මුදල රු.මි.**1.8** කි.

- එමෙන්ම දිස්ත්‍රික් **6** ක සුළු වාරිකර්මාන්ත **43** ක් වෙනුවෙන් රු.මි: **18.4** ක් වියදම් කර ඇත.

- මීට අමතරව වව්නියාව හා මොණරාගල දිස්ත්‍රික්කයන් හි පොහොර ගබඩා **2** ක් වෙනුවෙන් රු.මි. **2.5** ක වියදමක් දරා ඇති අතර ගොවිජන සංවර්ධන අරමුදල යටතේ දිස්ත්‍රික් **3** ක ව්‍යාපෘති **11** ක් වෙනුවෙන් රු.මි.**0.61** ක වියදමක් දරා ඇත.

## ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය

| වැඩසටහන | ප්‍රතිපාදන රු මි. | ව්‍යාපෘති සංඛ්‍යාව | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | ක්‍රියාත්මක මට්ටමේ පවතින ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම රු.මි. |
|---|---|---|---|---|---|
| 1. සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය හා පුරන් කුඹුරු අස්වැද්දීම | **2450** | **2642** | **1937** | **674** | **1197.8** |
| 2. පොහොර ගබඩා ඉදිකිරීම | **50** | **25** | **22** | **3** | **39.3** |
| 3. ගොවිජන සේවා මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම. | **450** | **677** | **676** | **1** | **397** |
| 4. දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාල අළුත්වැඩියාව | **30** | **34** | **34** | **0** | **25** |
| 5. ගොවිජන සේවා නව මධ්‍යස්ථාන ඉදිකිරීම. | **150** | **18** | **9** | **9** | **69** |
| 6. විශේෂ ව්‍යාපෘති ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය සුළු වාරි මාර්ග | **256.26** | **68** | **30** | **38** | **138** |
| 7. වනජීවී සංරක්ෂණ වැඩසටහන යටතේ ත්‍රිකුණාමලය අලිවැට ඉදිකිරීම | **46.94** | **43** | **-** | **43** | **11.4** |
| 8. දිවිනැගුම ජාතික වැඩසටහන | **55** | **-** | **-** | **-** | **51.4** |
| එකතුව | **3488.2** | **3507** | **2708** | **768** | **1928.9** |

## අලුත් සහල් මංගල්‍යය

ඈත අතීතයේ සිටම ශ්‍රී ලාංකීය ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වූ කෘෂි කර්මාන්තය මුල් කර ගත් වී ගොවිතැනින් ලබා ගන්නා ලද්දා වූ වී අස්වනු වලින් අග්‍ර ඵලය ජය ශ්‍රී මහා බෝධින්වහන්සේට පූජා කිරීම ගොවි ජනතාව එදා සිටම කර ගෙන ආ උතුම් කාර්යයකි.

මේ උතුම් කාර්යය ''අළුත් සහල් මංගල්‍ය'' නමින් තවදුරටත් ඔපනංවමින් ජාතික උත්සවයක් ලෙස රජයේ පූර්ණ අනුග්‍රහය ලබමින් වාර්ෂිකව පවත්වාගෙන යාමේ වගකීම ගොවිජන සංවර්ධන දෙපාර්තමේතුව ලැබූ මහඟු වරප්‍රසාදයක් බව පවසනුවේ ඉමහත් අභිමානයෙනි. ඒ අනුව ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා , නියෝජ්‍ය අමාත්‍යතුමා හා ලේකම්තුමාගේ උපදෙස් පරිදි ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් **2014** අප්‍රේල් මාසයේ **10** හා **11** දිනයන්හි අලුත් සහල් මංගල්‍යය **47** වන වරටත් ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බෞද්ධ ජනතාවගේ මුදුන්මල්කඩ වන ශ්‍රී මහා බෝධින්වහන්සේගේ අබියසදී උත්සවාකාරයෙන් පවත්වන ලදී.

සතර වාහල්කඩ කිරි ඉතිරවීමේ සිට අලුත් සහල් පෙරහැර ශ්‍රී මහා බෝධින්වහන්සේ අබියසට පැමිණ පූජා කිරීම දක්වා කටයුතු අභිමානවත් ලෙස ඉටු කරන ලදී. මී පැණි පූජාව හා ගිතෙල් පූජාව ආදිවාසි නායක ඌරුවරිගේ වන්නිල ඇත්තෝ ප්‍රමුඛ ආදිවාසී කණ්ඩායම විසින් පවත්වන ලදී. දිවයිනේ සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් එක් රැස් කර භාර දුන් සහල් මෙදින පූජා කරන ලද අතර සහල් සහ මුදල් ආධාර සැපයීම දිවයින පුරා පිහිටි ගොවි සංවිධාන විසින් සිදුකරන ලදී.

මෙවර අළුත් සහල් මංගල්‍යය සාර්ථක කර ගැනීමට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, අධිකාරි, මණ්ඩල, උතුරු මැද පලාත් සභාව හා පෞද්ගලික ආයතන ද විශාල දායකත්වයක් ලබා දෙන ලදී. මෙහි දී ''ජාතික අලුත් සහල් මංගල්‍යය'' නමින් සමරු කලාපයක් ද එළි දක්වන ලදී.

## *7.4 ශ්‍රී ලංකා හදබිම අධිකාරිය*

අංක 11 දරණ කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනතට අනුව 1975 වර්ෂයේ අධිකාරියක් ලෙස එවකට පැවති කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන ලද ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණ හා ජනාවාස සංවර්ධන අධිකාරිය (නැඩිසා ආයතනය) පිහිටුවීමේ මූලික අරමුණ වූයේ විදේශීය වැවිලි ආර්ථිකයකට හසුව ආන්තික තත්ත්වයට පත් ඉඩම් පද්ධති හේතුවෙන් හානියට පත්ව තිබූ මධ්‍යම කඳුකරයේ පරිසර පද්ධතිය නැවත ප්‍රතිනිර්මාණය කිරීම වූ අතර, මෙම ඉඩම් පාදකව ජීවත් වූ ගොවි ප්‍රජාවගේ ජීවන තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීමද ප්‍රමුඛ අරමුණක් විය. මෙම ඉලක්ක සපුරා ගනිමින් වසර 15 කට ආසන්න කාලයක් කෑගල්ල සහ මහනුවර දිස්ත්‍රික්ක වල ක්‍රියාත්මක වූ මෙම අධිකාරියේ සංවර්ධන වැඩසටහන් සඳහා ලෝක බැංකුව හා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය ආධාර ලබාදෙන ලදී.

1989 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සම්බන්ධව කරන ලද පාරිසරික, සමාජ හා ආර්ථික ශාක්‍යතා අධ්‍යයනයකින් පසුව මෙම අධිකාරියේ ව්‍යාපෘති බල ප්‍රදේශ ව්‍යාප්ත කිරීම හා ඒ සඳහා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (WFO) ආධාර ලබාදීමට තීරණය වූ අතර, ඒ සමගම අධිකාරියේ නිල නාමය ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරිය, ශ්‍රී ලංකා හදබිම අධිකාරිය ලෙස සංශෝධනය විය. එතැන් පටන් වසර 5 කට ආසන්න කාලයක් ක්‍රියාත්මක වූ අධිකාරියේ සංවර්ධන වැඩසටහන් සඳහා ලබාදෙන ලෝක ආහාර සංවිධානයේ කාල සීමාව අවසන් වූ අතර, පසුව මහා භාණ්ඩාගාර මූල්‍ය ප්‍රතිපාදන මත අධිකාරියේ සංවර්ධන කටයුතු අඛණ්ඩ ලෙස ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව මහා භාණ්ඩාගාරයේ වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන මත අධිකාරියේ වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කරනු ලබන අතර, 2014 වර්ෂයේ මහා භාණ්ඩාගාරයෙන් දෙන ලද මුදල රුපියන් මිලියන 70 ක් වන අතර, මෙම මුදල් ප්‍රමාණය උපයෝගී කරගනිමින් හෙක්ටයාර් 4,000 ක භූමි ප්‍රමාණයක් සංරක්ෂණය කර සංවර්ධනය කිරීම සඳහා ඉලක්ක ගත ප්‍රදේශ වල ගොවි පවුල් 12,500 ක් සහභාගී කරගන්නා ලදී.

ප්‍රජාවගේ සහභාගීත්වය උපරිම ලෙස ලබාගනිමින් දිස්ත්‍රික්ක 6 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 40 ක ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් තුළින් 2014 වර්ෂයේ ලබාගත් කාර්ය සාධනය පිළිබඳ සංක්ෂිප්ත සටහනක් මේ සමඟ ඉදිරිපත් කරමි.

## <u>සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ කාර්යසාධනය</u>

සංවර්ධන වැඩසටහන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායීතාවයක් තුළ ක්‍රියාත්මක කිරීම අරමුණු කරගනිමින් ප්‍රධාන හා උප සංවර්ධන ක්‍රියාකාරකම් ලෙස හඳුනාගෙන ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව අදාළ ක්‍රියාකාරකම් සහ උප ක්‍රියාකාරකම් තුලින් මෙම කාර්ය සාධනය ලබාගෙන ඇත.

### 1. ප්‍රජා සවිය සහභාගීත්ව වැඩසටහන

#### i. <u>ප්‍රජා සවිය සහභාගීත්ව සංවර්ධන සැලසුම්කරණය</u>



ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සංවර්ධන වැඩසටහන් සඳහා හඳුනාගනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් ගම්මානවලට කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම හා ඊට අදාළ සංවර්ධනාත්මක ක්‍රියාකාරකම් පිළිබඳ කාලරාමුව සකස්කිරීම හා මෙම ගම්මාන වල මානව හා භෞතික සම්පත් හඳුනාගැනීම සඳහා වූ ක්ෂේත්‍ර වැඩසටහන් ගම්මාන මට්ටමින් ක්‍රියාත්මක කිරීමට 2015 වර්ෂයේදී අපේක්ෂිතය.

| ඉලක්කය | | ප්‍රගතිය | | ප්‍රථිඵල | ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය රු.මි. | | |
| වැඩසටහන් 80<br>සහභාගීත්වය 12,500 | 0.4 | වැඩසටහන් 80<br>ගොවි පවුල් 11,400 | 0.381 | සමස්ත වැඩසටහන තුළ ගොවීන් 11,400 කගේ සහභාගීත්වයෙන් සංවර්ධන සැලසුම් සකස් කිරිම | • සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රජා දායකත්වය ලබාගැනීම.<br>• ගම්මාන තුල මානව සම්පත උපයෝජනය<br>• ග්‍රාමීය සමාජය සංවර්ධනයේ කොටස් කරුවන්වීම. |

## ii. <u>නායකත්ව පුහුණු වැඩසටහන</u>

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සංවර්ධන වැඩසටහන සඳහා හඳුනාගනු ලබන ගම්මාන තුළ වූ තරුණ තරුණියන්ගේ කුසලතාවයන් හා හැකියාවන් සංවර්ධන කාර්යයන් සඳහා නතු කර ගැනීම අරමුණු කරගනිමින් ඉලක්ක ගත ගම්මාන වල ප්‍රජා සහභාගීත්ව සංවර්ධන සංකල්ප පිළිබඳ වඩාත් උනන්දුවක් හා විශ්වාසයක් තබා ඇති තරුණ තරුණියන් පිරිසක් හඳුනාගෙන ඔවුන් සඳහා මෙම විෂය කරුණු පිළිබඳ මනා පුහුණුවක් ලබාදීමෙන් අනතුරුව ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සංවර්ධන වැඩසටහන් ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රජා සම්බන්ධීකාරකයන් ලෙසට කටයුතු කිරිම සඳහා යොමුගත කරනු ලබයි.

| ඉලක්කය | | ප්‍රගතිය | | ප්‍රතිපල | ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය රු.මි. | | |
| වැඩසටහන් 07<br>ප්‍රජා නියාමකයින් 400 | 0.91 | වැඩසටහන් 07<br>ප්‍රජා නියාමකයින් 360 | 0.906 | ග්‍රාමීය තරුණ තරුණියන් 360 ක් සඳහා නායකත්ව පුහුණුව ලබාදීමට හැකිවීම. | • තාරුණ්‍යයේ නිර්මාණශීලීත්වය සංවර්ධන ප්‍රවාහයට යොමු කිරිම.<br>• තරුණ තරුණියන් පුරවැසියන් ලෙස සමාජගතවීම.<br>• හදබිම සංවර්ධන වැඩසටහන වඩාත් කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරිම. |





## 2. පාංශු සංරක්ෂණය හා දියබෙත්ම කළමණාකරණය

### i. පාංශු සංරක්ෂණය පිළිබඳ තාක්ෂණික පුහුණුව

තම ඉඩම් පද්ධතිය තුළ පවතින සම්පත් භූ විෂමතාවයට අනුව සුදුසු පාංශු සංරක්ෂණ ක්‍රම විද්‍යාත්මක පදනමක් මත සකස් කිරීම සඳහා ගොවි ප්‍රජාව හට නව තාක්ෂණය හඳුන්වාදීම අරමුණු කර ගනිමින් ක්ෂේත්‍ර මට්ටමින් මෙම තාක්ෂණික පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී.



| ඉලක්කය | | ප්‍රගතිය | | ප්‍රතිඵල | ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය රු.මි. | | |
| වැඩසටහන් 80<br><br>ගොවි පවුල් 12,500 | 0.4 | වැඩසටහන් 80<br><br>ගොවි පවුල් 10,250 | 0.359 | • පුහුණු වැඩසටහන් 80 ක් තුලින් ගොවීන් 10,250 ක් සඳහා නව තාක්ෂණික පාංශු සංරක්ෂණ ක්‍රම හඳුන්වා දීම. | • නව තාක්ෂණය ගොවීන් අතරට ගෙන යාමට හැකිවීම.<br>• පාංශු ඛාදනය අවම කිරීම සඳහා දැනුවත් ගොවි ප්‍රජාවක් බිහි කිරීමට හැකිවීම. |

### ii. පාංශු සංරක්ෂණ කටයුතු සඳහා කෘෂි උපකරණ ලබා දීම.

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සංවර්ධන වැඩසටහන් සඳහා හඳුනාගනු ලබන ගොවි ප්‍රජාව බහුතරයක් අඩු ආදායම් ලබන හෝ එම සීමාවන් නියෝජනය කරනු ලබන අතර, මෙම ගොවි ප්‍රජාව නිශ්චිත වූ ව්‍යාපෘති කාල රාමුවකට යොමුගත කිරීම සඳහා කිසියම් දිරි දීමනාවක් ලබාදීම කළ යුතුව ඇති බැවින්, ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සංවර්ධන වැඩසටහන් සඳහා හඳුනාගනු ලබන මෙන්ම සාර්ථක ලෙස පාංශු සංරක්ෂණ කටයුතු නිම කරන ලද ගොවීන් සඳහා කෘෂි උපකරණයක් ලෙස උදලු තලයක් ලබාදීමට පියවර ගන්නා ලදී.



| ඉලක්කය | | ප්‍රගතිය | | ප්‍රතිඵල | ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය රු.මි. | | |
| ගොවි පවුල් 12,500<br><br>උදළු තල 12,500 | 8.45 | ගොවි පවුල් 10,000<br><br>උදලු තල 10,000 | 6.098 | • 2014 වර්ෂය තුළ ගොවි පවුල් 10,000 ක් සඳහා උදළු තල 10,000 ක් ලබාදීමට හැකිවීම. | • ඉලක්ක ගත ගොවි ප්‍රජාව නිශ්චිත වූ ව්‍යාපෘති කාල රාමුවකට යොමුගත කිරීම තුළ පාංශු සංරක්ෂණ කටයුතු විධිමත්ව ඉටු කිරීමට හැකිවීම. |

### iii. පාංශු සංරක්ෂණ කටයුතු සඳහා ගෙවීම

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සතු මූලික හා ප්‍රමුඛතම වූ කාර්ය වන්නේ හඳුනාගත් ප්‍රදේශ වල දැනට සිදුවෙමින් පවතින පාංශු ඛාදන තත්ත්වය අවම කරමින් ඉඩම් සංරක්ෂණය කිරීමය. මේ අනුව 2014 වර්ෂයේ මෙලෙස සංවර්ධනය කිරීම සඳහා හඳුනාගත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 4000 කි. මෙම ප්‍රමාණයෙන් හෙක්ටයාර් 3925.5 ක ප්‍රමාණයක් විධිමත් සංරක්ෂණ ක්‍රම යොදා සංරක්ෂණය කිරීමට සමත්ව ඇත. මේ සඳහා වාර්ෂික අයවැය මඟින් වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 30 ක් වූ අතර, වැය කරන ලද මුදල රුපියල් මිලියන 29.4 කි.



| ඉලක්කය | | ප්‍රගතිය | | ප්‍රතිඵල | ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය රු.මි. | | |
| හෙක්. 4,000<br><br>ගොවි පවුල් 12,500 | 30.0 | හෙක්. 3,925.2<br>ගොවි පවුල් 10,000 | 29.439 | • හෙක්. 3,925.2 ක පමණ භූමි ප්‍රදේශයක් සංරක්ෂණය කර සංවර්ධනය කිරීමට හැකිවීම. | • පාංශු ඛාදන තත්ත්වය අවම වීම<br>• ඉඩම් ඵලදායිතාවය ඉහළ යාම<br>• පාරිසරික අසමතුලිතතාවය අවමවීම<br>• මධ්‍යම කඳුකරයේ සංවේදී පාරිසරික කලාප සංරක්ෂණය වීම |

## 3. පාංශු පුනරුත්ථාපන වැඩසටහන

පාංශු සංරක්ෂණ කටයුතු විධිමත් ලෙස නිම කරන ලද මෙම ඉඩම් පද්ධති වගා කටයුතු සඳහා සුදුසු තත්ත්වයට පත් කිරිම පිණිස පසෙහි, නැතිවී ගොස් ඇති පාංශු සරු බව නැවත ඇති කළ යුතුය. මේ සඳහා වඩාත් සුදුසුම ක්‍රියාමාර්ගය නම් පසට කාබනික කොටස් එකතු කිරිමය. මේ පිළිබඳව අවධානය යොමු කළ අධිකාරිය 2014 වර්ෂයේ කාබනික පොහොර භාවිතය නිෂ්පාදනය දිරි ගැන්වීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

### i. තාක්ෂණික පුහුණු වැඩසටහන්

කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය වඩාත් විද්‍යානුකූල පසුබිමක් යටතේ සිදුකිරීම සඳහා ඉලක්ක ගත ගොවි ප්‍රජාව සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් 2014 වර්ෂයේ ක්ෂේත්‍ර මට්ටමින් සිදුකරන ලදී.

| ඉලක්කය | | ප්‍රගතිය | | ප්‍රතිඵල | ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය රු.මි. | | |
| වැඩසටහන් 80<br>ගොවි පවුල් 6,500 | 0.4 | වැඩසටහන් 80<br>ගොවි පවුල් 7,139 | 0.326 | පුහුණු වැඩසටහන් 80 ක් තුලින් ගොවීන් 7,139 ක් සඳහා නව තාක්ෂණික පුහුණුව ලබාදීම. | ගොවි පවුල් 7139 ක් සඳහා නව තාක්ෂණික පුහුණුව ලබාදීම තුළ වඩාත් විද්‍යාත්මක පදනමක් මත කාබනික පොහොර නිෂ්පාදනය කිරිමට හා භාවිතයට හැකිවීම. |

### ii. අවශ්‍ය යෙදවුම් ලබාදීම

කාබනික පොහොර නිෂ්පාදන සඳහා ඉලක්ක ගත ගොවි ප්‍රජාව දිරිමත් කිරිම සඳහා මෙම ගොවීන්ට කාබනික පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය මූලික උපකරණ ලබාදීම 2014 සංවර්ධන වර්ෂය තුළ සිදුකරන ලදී.

| ඉලක්කය | | ප්‍රගතිය | | ප්‍රතිඵල | ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය රු.මි. | | |
| ගොවි පවුල් 6500<br>යෙදවුම් 6500 | 4.575 | ගොවි පවුල් 6500<br>සවල් 6500 | 3.195 | ගොවීන් 6500 ක් සඳහා කෘෂි උපකරණයක් ලෙස සවල් 6500 ක් ලබාදීම. | ගොවි පවුල් 6500 ක ප්‍රමාණයක් කාබනික පොහොර නිෂ්පාදනයට හා භාවිතයට යොමුගත කිරිමට හැකියාව ලැබීම. |

### iii. කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය

ඉහත තාක්‍ෂණික පුහුණුව හා අවශ්‍ය යෙදවුම් ලබාදීමෙන් අනතුරුව කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ගොවි ප්‍රජාව යොමුගත කරන ලදී. ඒ අනුව පහත සඳහන් ප්‍රතිලාභ ලබාගන්නා ලදී.




| ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිඵල | ප්‍රතිලාභ |
|---|---|---|---|
| භෞතික | භෞතික | | |
| ගොවි පවුල් 6500<br>මෙ.ටො. 6500 | ගොවි පවුල් 6500<br>මෙ.ටො. 6500 | • ගොවි පවුල් 6500 කගේ ප්‍රජා සහභාගීත්වය ලබාගනිමින් කාබනික පොහොර මෙ.ටො. 6500 ක් නිෂ්පාදනය කිරිම. | • ඉලක්ක ගත ගොවි ප්‍රජාව නිශ්චිත වූ ව්‍යාපෘති කාල රාමුවකට යොමුගත කිරිම තුළ පාංශු සංරක්‍ෂණ කටයුතු විධිමත්ව ඉටු කිරිමට හැකිවීම. |

## 4. ඉඩම් සංවර්ධන හා බෝග ඵලදායිතා වැඩසටහන

පාංශු සංරක්‍ෂණ හා පාංශු ප්‍රතිනිර්මාණ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම තුළ බෝග වගා කටයුතු සඳහා සුදුසු තත්ත්වයට පත් ඉඩම් සඳහා ඊට ගැලපෙන වගා වැඩසටහන් හඳුන්වා දීම සඳහා 2014 සංවර්ධන වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදී.

### i. තාක්‍ෂණික පුහුණු වැඩසටහන්

වඩාත් විද්‍යානුකූල වූ ක්‍රමවේදයන් අනුව තම ඉඩම තුළ බෝග වගා වැඩසටහන ක්‍රියාත්මක කිරිම සඳහා ගොවි ප්‍රජාව යොමුගත කිරිම අරමුණු කර ගනිමින් ක්ෂේත්‍ර මට්ටමින් පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී.

| ඉලක්කය | | ප්‍රගතිය | | ප්‍රතිඵල | ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|
| භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය රු.මි. | | |
| වැඩසටහන් 80<br>ගොවි පවුල් 6500 | 0.4 | වැඩසටහන් 68<br>ගොවි පවුල් 5422 | 0.342 | පුහුණු වැඩසටහන් 68 ක් තුලින් ගොවීන් 5422 ක් සඳහා බෝග වගාව හා ඉඩම් කළමනාකරණය පිළිබඳ පුහුණුව ලබාදීම. | තම සීමිත භූමි ප්‍රමාණයන් සහිත ඉඩම් ඒකකය වඩාත් තාක්‍ෂණික පදනමක් මත සංවර්ධනය කර ඵලදායී නිෂ්පාදන ඒකකයක් බවට පරිවර්තනය කිරිම සඳහා ගොවි ප්‍රජාව යොමුගත කිරිමට හැකිවීම. |

### ii. <u>රෝපණ ද්‍රව්‍ය ලබාදීමේ වැඩසටහන</u>

**2014 සංවර්ධන වර්ෂය තුළ ගොවි ප්‍රජාව සඳහා පහත සඳහන් බීජ හා රෝපණ ද්‍රව්‍ය බෙදා හැර ඇත.**

| බීජ වර්ගය | ප්‍රමාණය කි.ග්‍රෑ. | වැය කරන ලද මුදල |
|---|---|---|
| මිරිස් | 161 | 531,300.00 |
| කුරක්කන් | 141 | 28,200.00 |
| කව්පි | 823 | 222,210.00 |
| උඳු | 66 | 16,500.00 |
| හවරි මෑ | 809 | 2,168,120.00 |
| බණ්ඩක්කා | 216 | 237,600.00 |
| වම්බටු | 79 | 322,320.00 |
| දඹල | 70 | 147,000.00 |
| කහ | 14425 | 1,065,370.00 |

**<u>ප්‍රතිඵලය</u> - රු. මි. 5.71ක පමණ මුල්‍ය ප්‍රතිපාදන වැයකොට ගොවි පවුල් 5720 ක් සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය ඉහත පරිදි ලබාදීමට හැකිවීම.**

**<u>ප්‍රතිලාභ</u> - ඉලක්ක ගත ගොවි ප්‍රජාව විසින් සංරක්ෂණය කරන ලද ඉඩම් ඒකක ඵලදායී කෘෂි නිෂ්පාදන ඒකකයක් බවට පරිවර්තනය කිරීමේ මූලික පියවර ආරම්භ කිරිමට මැදිහත්වීම තුළ තම ඉඩම තිරසාර ලෙස සංවර්ධනය කිරිම සඳහා ගොවි ප්‍රජාව යොමුගත කිරිමට හැකිවීම.**




## 5. පාසල් පාදක ආදර්ශන වැඩසටහන

තමා ජීවත් වන පරිසර වටපිටාව පිළිබඳවත් පරිසර සංරක්ෂණ කාර්යභාරය පිළිබඳවත් පාසල් ප්‍රජාව දැනුවත් කිරිම අරමුණු කරගනිමින් පාසල් ප්‍රජාව දායක කරගනිමින් හඳුනාගත් පාසල් තුළ පාරිසරික සංරක්ෂණ ආදර්ශන ස්ථාපිත කිරිමට 2014 සංවර්ධන වර්ෂය තුළ ශ්‍රී ලංකා හදබිම අධිකාරිය පියවර ගන්නා ලදී.

### i. <u>දැනුවත් කිරිමේ වැඩසටහන</u>

පරිසර සංරක්ෂණය හා ඉඩම් කළමනාකරණය පිළිබඳ මෙන්ම පරිසරය හා ස්වාභාවික සම්පත් කාලීන අවශ්‍යතාවය පිළිබඳ පාසල් ප්‍රජාව වෙත දැනුම ලබාදීම අරමුණු කරගනිමින් පාසල් ප්‍රජාව සඳහා දැනුවත් කිරිමේ වැඩසටහන් 50 ක් සැළසුම් කර එම පාසල් තුළම ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන ලදී.

## ii. ආදර්ශ ඒකක ස්ථාපිත කිරීම

ඉහත පරිදි අවශ්‍ය පුහුණුව හා අවශ්‍ය කෘෂි උපකරණ කට්ටලයක් ලබාදීමෙන් අනතුරුව පාසල් ප්‍රජාව ආදර්ශ ඒකක ස්ථාපිත කිරීම සඳහා යොමුගත කරනු ලබයි. මේ සඳහා එම පාසල සඳහා අවශ්‍ය කෘෂි උපකරණ මෙන්ම වගාව සඳහා අවශ්‍ය පැළ සුළු ප්‍රමාණයක්ද එම පාසල් වලට ලබාදීමට පියවර ගෙන ඇත. මෙම වැඩසටහන සඳහා පාසල් 50 ක් හඳුනාගෙන ආදර්ශ ඒකක ස්ථාපිත කිරීමේ ක්‍රියාවලිය සිදුකර ඇත. මේ සඳහා 2014 සංවර්ධන වර්ෂය තුළ වැය කරන ලද මුදල රු.මි. 0.344 කි. පාසල් 50 ක් සඳහා ලබාදෙන ලද ද්‍රව්‍ය සහ උපකරණ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ද්‍රව්‍ය / උපකරණ වර්ගය | ප්‍රමාණය |
|---|---|
| උදලු | 150 |
| අලවංගු | 100 |
| උදලු මුල්ලු | 100 |
| මල් බාල්දි | 100 |
| රබර් හෝස් අඩි 100 | 50 |
| ගෙවතු වගා බීජ කට්ටල | 50 |

<u>ප්‍රතිඵලය</u> - මෙම වැඩසටහන මඟින් හඳුනාගත් පාසල් 50 ක පාංශු සංරක්ෂණ බෝග වගා හා පරිසර සංරක්ෂණ ආදර්ශන ඒකක 50 ක් ස්ථාපිත කිරීම සඳහා කටයුතු කර ඇත. එය මෙම වැඩසටහන තුලින් ලබා ගැනීමට හැකි වූ සෘජු ප්‍රතිඵලයකි.

<u>ප්‍රතිලාභ</u> - පාංශු බාදනය හා පාංශු හායනයෙහි අයහපත් ප්‍රතිඵල හා එම තත්ත්වය අවම කරමින් පරිසර සමතුලිතතාවය තිරසාර ලෙස පවත්වා ගැනීම පිළිබඳ දැනුම සහ ආකල්ප සහිත පුළුල් ප්‍රජාවක් බිහි කිරීමට හැකිවීම.

## 06. ගෘහස්ථ පෝෂණ සංවර්ධන වැඩසටහන

සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඉලක්ක ගත ප්‍රදේශ වල ග්‍රාමීය ප්‍රජාවගේ පෝෂණීය තත්ත්වයේ වර්ධනයක් ඇති කරමින් එම ප්‍රජාවගේ රැකියා උත්පාදනය කරමින් ගෘහස්ථ ආර්ථිකයට ශක්තියක් වීම අරමුණු කරගනිමින් අර්ධ නිදැලි ක්‍රමයට නඩත්තු කළ හැකි ලෙස අභිජනනය කරන ලද අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පැටවුන් හඳුනාගත් ගොවි ප්‍රජාව සඳහා ලබාදීම 2014 වර්ෂයේද ක්‍රියාත්මක කරන ලදී. මේ වැඩසටහන සඳහා 2014 වර්ෂයේ වෙන් කළ මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය රු.මිලියන 3.755 ක් වන අතර, එම මුදලින් රු. මිලියන 3.550 ක් පහත සඳහන් පරිදි බෙදා දෙන ලදී.

| දිස්ත්‍රික්කය | බෙදා දෙන ලද පැටවු ගණන |
|---|---|
| මහනුවර | 1370 |
| මාතලේ | 2290 |
| නුවරඑළිය | 1070 |
| බදුල්ල | 800 |
| කෑගල්ල | 1230 |
| රත්නපුර | 1120 |
| කුරුණෑගල | 740 |
| මාතර | 540 |
| කළුතර | 360 |



ව්‍යාපෘතියේ ප්‍රතිඵල - අඩු පෝෂණ මට්ටමක හා අඩු ආර්ථික මට්ටමක පසු වූ ග්‍රාමීය පවුල් සඳහා කුකුල් පැටවුන් ලබාදීමට හැකිවීම.

ව්‍යාපෘතියේ ප්‍රතිලාභ - ගොවි පවුල් 10,000 ක් ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය තුලින් ග්‍රාමීය ඊකියා උත්පාදනය කිරිම සඳහා ඉඩකඩ සැලසීමත්, ග්‍රාමීය ප්‍රජාවගේ පෝෂණීය තත්ත්වයේ වර්ධනයක් ඇති කිරීමටත් හැකිවිය. මේ සඳහා වැඩි නැඹුරුතාවයක් දක්වන ලද ගොවි පවුල් වාණිජ මට්ටම දක්වා වර්ධනය කිරිමට හැකිවීමත් මෙම ව්‍යාපෘතිය තුලින් ලබාගත් ප්‍රතිලාභයන්ය.

## 07. කෘෂි නිෂ්පාදන අලෙවි ජාල ප්‍රවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය විසින් සංවර්ධනය කරනු ලබන ගම්මාන තුළ නිෂ්පාදිත නිෂ්පාදන මැදිහත්කරුවන්ගේ මැදිහත්වීමකින් තොරව අලෙවි කර ගැනීම, මෙම ග්‍රාමීය ප්‍රජාව මුහුණ පාන විශේෂ ගැටළුවකි. එම තත්ත්වයට පිළියමක් ලෙස 2005 වර්ෂයේ ආරම්භ කරන ලද ශ්‍රී ලංකා හඳබිම අධිකාරියේ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන විවිධ විකාශන අවධීන් පසුකර මේ වන විට ශ්‍රී ලංකා හඳබිම අධිකාරියේ ප්‍රධාන ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් බවට පත්ව ඇත.



මෙම ව්‍යාපෘතිය තවදුරටත් පුළුල් කිරිම අරමුණු කර ගනිමින් නව අලෙවි ඒකකයක් ඉංගිරිය ප්‍රදේශයේ ස්ථාපිත කිරිම සඳහා රු. මි. 5.586 ක මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරන ලද අතර, මෙම මුදල් ප්‍රතිපාදන වලින් රු. මි. 5.585 ක් වැයකර එකී අලෙවි ඒකකය ස්ථාපනය කර ඇත.

## 08. මානව සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා හඳබිම අධිකාරියේ සේවයේ නියුතු කාර්යාල කාර්ය මණ්ඩලය මෙන්ම ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේද කුසලතාවයන් වර්ධනය කිරිම අරමුණු කරගනිමින් කාර්ය බද්ධ පුහුණු ආයතන හා සම්බන්ධීකරණයෙන් විශේෂ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව රු.මි. 0.137 ක මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් වැය කොට නිලධාරින් 50 දෙනෙකු සඳහා පුහුණුව ලබාදී ඇත.

## 09. මාධ්‍ය හා ප්‍රචාරණ ප්‍රවර්ධනය

මහා භාණ්ඩාගාර මූල්‍ය ප්‍රතිපාදන හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය විසින් දීප ව්‍යාප්ත ලෙස සිදුකරන ලද සංවර්ධන වැඩසටහන් පිළිබඳව ජාතික තලය දැනුවත් කිරිම අරමුණු කරගනිමින් විවිධ ප්‍රචාරක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, මෙයට අමතරව කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කාලීන ලෙස ක්‍රියාත්මක කරනු ලබන ජාතික තලයේ සංවර්ධන වැඩසටහන්හි මාධ්‍ය කටයුතු ද ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලදී.

| වැඩසටහන | වැයකළ මුදල (රු.මි) |
|---|---|
| 1.දැයට කිරුළ ප්‍රදර්ශනය | 0.381 |
| 2.ජාතික ගොවි සතිය ප්‍රදර්ශනය | 0.748 |
| 3.අනෙකුත් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සඳහා | 0.799 |

## 10. ප්‍රගති මෙහෙයුම් කටයුතු

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සමස්ත සංවර්ධන කටයුතු පිළිබඳව මාසිකව ප්‍රගතිය සමාලෝචනය කරනු ලබන අතර, අදාළ ප්‍රගති වාර්තා මාසිකව කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කරනු ලබයි. ඒ අනුව 2014 වර්ෂයේද ප්‍රගති සමාලෝචන රැස්වීම් 12 ක් සංවිධානය කර පවත්වා ඇති අතර, ඒ සඳහා රු.මිලියන 0.246 ක මුදලක් වැය කර ඇත.

## 11. විශේෂ සංවර්ධන ව්‍යාපෘති

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය වෙත මහා භාණ්ඩාගාරය වෙතින් වාර්ෂිකව නිදහස් කරනු ලබන වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන වලට අමතරව ජාතික ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරමින් දේශීය ආහාර නිෂ්පාදනය වර්ධනය කිරිම සඳහා වන ව්‍යාපෘති වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන වෙන්කරනු ලබන අතර, 2014 වර්ෂය සඳහා මෙලෙස අධිකාරිය වෙත ලබාදෙන ලද මුදල රුපියල් මිලියනකි. මෙම මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය උපයෝගී කරගනිමින් 2014 වර්ෂය තුළ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

### *11.1 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව කුරුණෑගල දිස්ත්‍රික් ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන - අතිරේක ආහාර බෝග සුලභ කිරිමේ ව්‍යාපෘතිය*

දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා එම දිස්ත්‍රික්කයේ ගනේවත්ත හා ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙක තුළ අක්කර 1000 ක අතිරේක ආහාර බෝග වගා කිරිම ඉලක්ක ගත විය. ඒ අනුව මෙම ව්‍යාපෘතිය තුලින් ලබාගත් ප්‍රගතිය පහත සඳහන් වේ.





| ක්‍රියාකාරකම | | ඒකකය | ඉලක්කය | වෙන් කර ඇති ප්‍රතිපාදන රු. | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| 1 | මූලික දැනුවත් කිරීම | පුහුණු පන්ති | 10 | 75,000.00 | 9 | 64,390.00 |
| 2 | බිම් සකස් කිරීම | අක්කර | 1000 | - | 1000 | - |
| 3 | අතිරේක ආහාර බෝග බීජ සැපයීම | අක්කර | 1000 | 1,125,000.00 | 1000 | 1,004,650.00 |
| 4 | පරිපාලන වියදම් | | | 36,000.00 | | 35,861.75 |
| එකතුව | | | | 1,236,000.00 | | 1,104,901.75 |

## 11.2. මානුෂීය කෘෂි සත්කාරය - අතිරේක ආහාර බෝග සංවර්ධන ව්‍යාපෘතිය
*(පියවර 3 - ගොවි පවුල් 1000)*

මානුෂීය මෙහෙයුම අවසන් වූ පසු වවුනියාව දිස්ත්‍රික්කයේ කැලෑබෝගස්වැව ගම්මානය තුළ නැවත පදිංචි කරන ලද ගොවි ප්‍රජාව ඉලක්ක කරගනිමින් එම ප්‍රදේශයේ අතිරේක ආහාර බෝග වගාව සුලභ කිරිමේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. එම ව්‍යාපෘතිය තුලින් ලබාගත් ප්‍රගතිය පහත පරිදි වේ.




| අනු අං. | ක්‍රියාකාර කම් | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන 2014 (රු.මි.) | 2014-12-31 දිනට සමස්ත වියදම රු. | භෞතික ඉලක්කය | | භෞතික ප්‍රගතිය | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|
| 1 | දැනුවත් කිරිමේ වැඩසටහන් | 55,000.00 | 44,000.00 | පුහුණු සැසි ගණන | 5 | 4 | වැඩසටහන් 04 ක් පැවැත්වීමෙන් ගොවීන් 1000 දැනුවත් කිරීමේ කටයුතු සිදුකර ඇත. |
| | | | | සහභාගීත්වය | 1000 | 1000 | |
| 2 | කෘෂි උපකරණ බෙදා දීම | 2,500,000.00 | 2,036,680.00 | ගොවි පවුල් ගණන | 1000 | 1000 | කට්ටල 1000 ක් ක්ෂේත්‍රයට නිකුත් කර ඇත. ( බෝගස්වැව 01 - 112, බෝගස්වැව 02 - 260, සැළලිහිණිගම - 234, නන්දිමිත්‍රගම - 143, නාමල්ගම - 251 ) |
| | | | | කට්ටල ප්‍රමාණය | 1000 | 1000 | |
| 3 | අතිරේක ආහාර බෝග බීජ ලබාදීම | 1,325,000.00 | 1,324,820.00 | බීජ කි.ග්‍රෑ. | 3600 | 3548 | මිරිස් කි.ග්‍රෑ. 100 , කව්පි කි.ග්‍රෑ. 1250, රටකජු කි.ග්‍රෑ. 1000, මුං කි.ග්‍රෑ. 1198 ක් ක්ෂේත්‍රය වෙත නිකුත් කර ඇත. |
| | | | | අක්කර ගණන | 1000 | 1000 | |
| 4 | පරිපාලන වියදම් | 120,000.00 | 119,946.40 | | | | |
| | මුළු එකතුව | 4,000,000.00 | 3,525,446.40 | | | | |

## 11.3. මානුෂීය කෘෂි සත්කාරය - අතිරේක ආහාර බෝග සංවර්ධන ව්‍යාපෘතිය (පියවර 3 - ගොවි පවුල් 300)

**ඉහත ව්‍යාපෘතියට සමගාමීව එම ප්‍රදේශයේ ගොවි ප්‍රජාවගේ විශේෂ ඉල්ලීම මත කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදේශකත්වය මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.**

| අනු අං. | ක්‍රියාකාරකම් | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන 2014 (රු.) | 2014-12-31 දිනට සමස්ත වියදම(රු.) | අවසන් නිමැවුම (ඒකක වශයෙන්) | | | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | |
| 1 | මූලික දැනුවත් කිරීම | 15,000.00 | 15,000.00 | ක්ෂේත්‍ර ගොවි හමු | 2 | 2 | ක්ෂේත්‍ර ගොවි හමු දෙකක් පවත්වා ගොවීන් 300 ක් දැනුවත් කර ඇත. |
| 2 | කෘෂි උපකරණ ලබාදීම | 750,000.00 | 507,855.00 | උපකරණ කට්ටල | 300 | 300 | උපකරණ කට්ටල 300 ක්ෂේත්‍රයට නිකුත් කර ඇත. අත්සන් ලේඛන ලැබී ඇත. |
| 3 | බිම් සකස් කිරීමේ කටයුතු | - | - | අක්කර | 300 | 300 | බිම් සකස් කිරීමේ කටයුතු සිදුකර අවසන් කර ඇත. |
| 4 | අතිරේක ආහාර බෝග බීජ ලබාදීම | 450,000.00 | 415,660.00 | අක්කර | 300 | 300 | මුං බීජ කි. 652, කව්පි කි. 524 , මිරිස් කි. 15 ක්ෂේත්‍රයට නිකුත් කර ඇත. අත්සන් ලේඛන ලැබී ඇත. |
| 5 | පරිපාලන වියදම් | 36,450.00 | 36,255.40 | අක්කර ගණන | | | |
| | මුළු එකතුව | 1,251,450.00 | 974,770.40 | | | | |





## 7.5 හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**කෘෂිකර්මය හා ගොවිජන (ග්‍රාමීය) සංවර්ධනයට සම්බන්ධ සමාජ-ආර්ථික ගැටළු පිළිබඳව අධ්‍යයනය කිරීම හා ඒ පිළිබඳව සොයා ගැනීම් මෙන්ම නිර්දේශ පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කිරීම, රට තුළ ආහාර මිල ගණනන් එකතු කිරීම හා බෙදා හැරීම, පර්යේෂණ ආශ්‍රයෙන් ජනනය කරනු ලබන දැනුම වැඩමුළු, සම්මන්ත්‍රණ හා ප්‍රකාශන මාර්ගයෙන් අදාළ පාර්ශවයන් සමග හුවමාරු කරගැනීම මෙන්ම පුහුණු වැඩසටහන් මඟින් නිලධාරීන් හා ගොවීන් තුළ සංවර්ධනයට අදාළ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම ආයතනයේ මූලික අරමුණු වෙති.**

වර්ෂය තුළ දී ක්‍රියාත්මක මුළු පර්යේෂණ සංඛ්‍යාව **18** ක් වූ අතර පුහුණු වැඩසටහන් සංඛ්‍යාව **56** කි. පර්යේෂණ හා පුහුණු කටයුතු සඳහා භාණ්ඩාගාරයෙන් වෙන් කල මුදල රු. මි. **19.85**ක් වූ අතර රු.මි. **4.24** ක් වෙනත් ආයතනවලින් ලබා ගැණුනි. (මූල්‍ය ප්‍රගතිය වගුව **2** මඟින් දැක්වේ.) සැලසුම් කළ අධ්‍යයනවලින් දෙකක් හැරුණු කොට ඉතිරිය සැලසුම් කළ පරිදි වර්ෂය තුළ දී ම නිම කිරීමට හැකි විය.

වගුව **1:** භෞතික ප්‍රගතිය- පර්යේෂණ **2013-2014**

| පර්යේෂණ සංඛ්‍යාව | 2013 | 2014 |
|---|---|---|
| මුළු අධ්‍යයන සංඛ්‍යාව | 27 | 18 |
| අවසන් කළ අධ්‍යයන | 26 | 16 |
| 75% අවසන් කළ | - | 2 |
| 75% අඩු | 01 | - |

වගුව **2:** මූල්‍ය ප්‍රගතිය (රු.මි) - පර්යේෂණ හා, පුහුණු

| මුදල් සැපයුම් මාර්ගය | 2013 | 2014 |
|---|---|---|
| භාණ්ඩාගාර වෙන් කිරීම් | 25.76 | 19.85 |
| වෙනත් ආයතන මඟින් ලැබීම් | 1.42 | 4.24 |
| එකතුව | 27.18 | 24.09 |
| වියදම | | |
| භාණ්ඩාගාරයෙන් වෙන් කිරීම | 20.6 | 15.36 |
| වෙනත් ආයතන මඟින් ලැබීම | 1.00 | 3.54 |
| එකතුව | 21.60 | 18.0 |

**වර්ෂයේ ක්‍රියාත්මක පර්යේෂණ බොහොමයක් විවිධ ආයතන විසින් සංවර්ධන කටයුතු කිරීමේ දී මුහුණ පෑ ගැටළු පදනම් කරගෙන ඔවුන් විසින් කරනු ලැබූ ඉල්ලීම් පදනම් කරගත් ඒවා වූහ. එබැවින් ඒවායේ සොයාගැනීම් හා නිර්දේශ ඍජුවම ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා භාවිතයට ගැනිණි.**

**සාර්ථකව නිමකල පර්යේෂණ ව්‍යාපෘති කිහිපයක සොයා ගැනීම් හා නිර්දේශ පහත දැක්වේ.**

**I. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ලබාදුන් ඉඩම් සඳහා නිදහස් අයිතිය ලබාදීමෙන් කෘෂිකර්මයට වන බලපෑම**

**ජනපදිකයින් අතරින් වැඩි ප්‍රමාණයක් (65%) දැනටමත් ඔවුන්ගේ ඉඩම් සඳහා නිදහස් අයිතිය ඇතැයි විශ්වාස කරති. ජනපදිකයින්ගෙන් 60% කට ආසන්න ප්‍රමාණයක් වගාව මඟින් ද තවත් එවැනිම ප්‍රමාණයක් වෙනත් මාර්ග මඟින් ද ආදායම් ඉපයිය හැකිය යන්න විශ්වාස කරති. දැනට පවත්නා ආකාරයට ඉඩම් අයිතිය**

ආරක්ෂාවීම සඳහා අයිතිය පැවරීම සම්බන්ධව පවත්නා නීතිමය අවහිරකම් හේතු වී ඇති බැවින් ඒවා ඒ ආකාරයෙන් ම පවත්වා ගැනීම ගැටලුවක් නොවන බව අධ්‍යයනය පෙන්වා දෙයි.

**II.** අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී ගොවීන්ගේ ආදායම් විවිධාංගීකරණය සඳහා ඇති අවස්ථා සහ බාධක හඳුනාගැනීම

වී ගොවීන්ගෙන් 90% කට පමණ අමතර ආදායම් මාර්ගවල යෙදීමට කාලය ඇති බව නිරීක්ෂණය විය. නමුත් 98%ක් ම ගොවිතැන ආශ්‍රිතව හෝ ඉන් බාහිරව කිසියම් ආදායම් උත්පාදන කටයුත්තක නිරතව සිටිති. පසුගාමී ආකල්ප හා වෙළඳපොළ අස්ථාවරත්වය වැනි කරුණු මේ සඳහා වන බාධාකාරී ඒවා වූහ. ආදායම් විවිධාංගීකරණය සඳහා පුහුණු කිරීම් මඟින් ආකල්ප වෙනස් කිරීම හා හැකියා වර්ධනය ඔස්සේ දිරිගැන්වීම් කළ යුතුය යන්න නිර්දේශ කර ඇත.

**III.** පාරම්පරික සහල් වර්ග නිෂ්පාදනය හා අලෙවිය; වර්තමාන තත්ත්වය සහ අනාගත විභවතා

විවිධ වර්ග ප්‍රචලිත වුවත් වඩාත් ජනප්‍රිය පාරම්පරික සහල් වර්ග වන්නේ, සුවඳැල්, කුරුළුතුඩ, හීනැටි, පච්චපෙරුමාල් හා කහවනු යනා දී ඒවා ය. මෙම සහල් නිපදවීමේ දී ගොවීන්ගෙන් 87% ක්ම රසායනික පොහොර භාවිතා නොකළ අතර කොම්පෝස්ට් (55%) පිදුරු (50%), ගොම (41%) හා කොළ වර්ග (40%) භාවිතා කළහ. දේශීය මෙන්ම විදේශීය වශයෙන් ද ඉහළ ඉල්ලුමක් පවතින නිසා එම සහල් අලෙවියේ දී වෙළඳපොළ තුළ පවතින කලවම් කිරීම් වැනි දූෂණ නැති කිරීම සඳහා පියවර ගත යුතුය.

**IV.** තෙත් කලාපය තුළ පිහිටි කුඹුරු ඉඩම් ගොඩ කිරීම සඳහා හේතු සහ එහි බලපෑම

ගොඩ කරන ලද කුඹුරු ඉඩම් වලින් 70% ක් පමණ අත්හරින ලද කුඹුරු ඉඩම් වන අතර ගොඩ ඉඩම් සඳහා ඉහළ ඉල්ලුමක් පැවතීම (57%) හා රැකියාවන් සඳහා කෘෂිකර්මයෙන් වෙනත් කටයුතුවලට සංක්‍රමණය වීම (12%) යනාදිය කුඹුරු ඉඩම් ගොඩ කිරීම සඳහා හේතු වී තිබේ. අතහැර ඇති කුඹුරු ඉඩම් වගාවට යොමු කිරීම හා වගා කළ නොහැකි කුඹුරු ඉඩම් විකල්ප කටයුතු සඳහා භාවිතයට ගැනීමේ මාර්ගයන් සැලසීම මේ ගැටළුව සඳහා ප්‍රතිකර්ම ලෙස අධ්‍යයනයෙන් නිර්දේශ කර ඇත.

### 01. අලෙවි තොරතුරු ව්‍යාපෘතිය හා එහි ප්‍රගතිය

ආහාර ද්‍රව්‍යයන් හි තොග හා සිල්ලර මිල ගණන් කොළඹ හා දිවයින පුරා පිහිටි වෙළඳසැල් වලින් දිනපතා එකතු කිරීමත් එම තොරතුරු භාවිතයෙන් තීරණ ගන්නා ප්‍රතිපත්ති සම්පාදකයින්, වෙළඳුන්, ගොවීන් හා පාරිභෝගිකයින් වෙත ඒවා ලබාදීමත් මෙම ව්‍යාපෘතිය යටතේ තවදුරටත් සිදුවිණි. අදාළ තොරතුරු විශ්ලේෂණය කරමින් සැකසූ සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාවන් 52 ක්ද, මාසික ආහාර

### 02. පුහුණු වැඩසටහන් හා ඒවායේ ප්‍රගතිය

මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය විසින් මානව සම්පත් සංවර්ධනය සඳහා දිවයිනේ බොහෝ ප්‍රදේශ පදනම් කරගෙන ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 56 ක් වූ අතර ඒ යටතේ පුහුණුලාභීන් 4,713 කට පුහුණු අවස්ථා සැලසුණි. ඒ ඒ පුහුණු වැඩසටහනෙහි ප්‍රගතිය පහත දක්වා ඇත.

i. ග්‍රාමීය/ප්‍රජා සංවර්ධන සැලසුම් සැකසීම හා කලමනාකරණය සඳහා සහභාගීත්ව ක්‍රමෝපායන් **(RRA/PRA/PCM)** භාවිතා කිරීමේ පුහුණු වැඩසටහන



සහභාගී වන්නන්ට සහභාගීත්ව සංවර්ධනයේ වැදගත්කම පිළිබඳව ඒත්තු ගැන්වීමට අමතරව ඒ සඳහා භාවිතා කළ හැකි විවිධ ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුම මෙන්ම භාවිත හැකියාව ලබාදීම මෙහි අරමුණ වූ අතර එක් වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර 30 දෙනෙකු පුහුණු කළහ.

ii. ග්‍රාමීය සංවර්ධන සැලසුම් සැකසීම සඳහා සහභාගීත්ව ක්‍රම භාවිතය පිළිබඳ එක් දින පුහුණු වැඩසටහන



සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වාණිජ අඹ වගාව ප්‍රචලිත කිරීම සඳහා වූ නියමු ව්‍යාපෘතියක් වෙනුවෙන් තෝරාගත් ගම් වැසියන් 77 දෙනෙකු පුහුණු කිරීම සඳහා මෙය ක්‍රියාත්මක කෙරිණි. අවසානයේ ඒ සඳහා සැලසුමක් ද සැකසූ අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය දේශපාලන අධිකාරියට භාරදෙනලදී.

iii. අලෙවි ව්‍යාප්තිකරණය පිළිබඳ පුහුණු වැඩසටහන



අලෙවිකරණ ව්‍යාප්තිය පිළිබඳව හා ව්‍යාපාරසැලසුම් සැකසීම යනාදී වූ අරමුණ සඵල කරගැනීම අපේක්ෂාව කරගත් මෙම වැඩසටහන් දෙකක් යටතේ වයඹ පළාත් කෘෂිකර්ම නිලධාරීන් 60 දෙනෙකු පුහුණු කෙරිණි.

iv. සමාජ සජීවීකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව



සමාජ සජීවීකරණය හා අදාළ සංකල්ප හා ශිල්පීය ක්‍රම පිළිබඳ සහභාගී වන්නන්ට දැනුමක් ලබා දීම අරමුණු කරගත් මේ හා අදාළ වැඩසටහන් හතරක් යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ සංවර්ධන නිලධාරීන් 144 දෙනෙකු පුහුණු කරනු ලැබින.

v. ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සඳහා නායකත්ව පුහුණුව



මාතර දිස්ත්‍රික්කයේ පැවති ගොවි සතියට සමගාමීව ගොවි නායකයින්ගේ නායකත්ව හැකියා වර්ධනය කිරීම අරමුණු කරගත් මෙවැනි වැඩසටහන් 22ක් ඇසුරින් ගොවි නායකයින් 2,372ක් පුහුණු කරනු ලැබිණි.

**vi.** ගොවි සංවිධාන බලගැන්වීම සඳහා වූ පුහුණු වැඩසටහන

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැවති "දැයට කිරුළ" වැඩසටහනට සමගාමීව පුහුණු වැඩසටහන් 26ක් යටතේ ගොවීන් 2,037 දෙනෙකුට නායකත්ව පුහුණුව දෙනු ලැබිණි.

## 03. වැඩමුළු, සම්මන්ත්‍රණ හා උපාධි පාඨමාලා

බංගලාදේශයේ පිහිටි ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ ආසියා හා පැසිෆික් කලාපීය මධ්‍යස්ථානය හා ඒකාබද්ධව මෙම ආයතනය විසින් 2014.03.17 සිට 20 දක්වා "එළවළු හා පලතුරු අලෙවි කරණයේ දී වන පසු අස්වනු හානිය අවම කිරීමේ ක්‍රම" යන මැයෙන් පුහුණු පාඨමාලාවක් පැවැත්වීම ජාත්‍යන්තර වශයෙන් ගත් වැදගත් පියවරකි. මේ සඳහා දෙස්-විදෙස් නියෝජිතයෝ 34ක් සහභාගී වූහ.

"කෘෂි ආර්ථික විද්‍යාව" මැයෙන් වූ ඒකාබද්ධ උපාධි පාඨමාලාවක් පැවැත්වීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹීම ද වර්ෂය තුළ දී ආයතනය විසින් ශාස්ත්‍රීය අංශයෙන් තැබූ ඉදිරි පියවරකි.

## *7.6 ශ්‍රී ලංකා සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය*

ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය 2014 වසරේ දී ව්‍යාපෘති 14 ක් සිදු කර ඇති අතර මෙම ව්‍යාපෘති වල සංක්ෂිප්ත විස්තර පහත දැක්වේ.

### 1 "සුවපෝෂ" පෝෂණීය ආහාරය හඳුන්වාදීමේ ව්‍යාපෘතිය-

**වෙන් කල ප්‍රතිපාදන:-රු.මි.7.16 ආදායම:-රු.මි.8.49**




සුවපෝෂ ධාන්‍යමය ආහාරය නිෂ්පාදන කර්මාන්තශාලාව ගන්නෝරුව ආහාර පර්යේෂණ ඒකකයේ පිහිටා ඇත. මේ වසර තුළ "සුවපෝෂ" (ග්‍රෑම 200) පැකට 157,466 ක් නිෂ්පාදනය කරන ලදි.

### 2 අඩුබර ගර්භනී මව්වරුන් හට "මව්පෝෂ" පෝෂණීය ආහාරය හඳුන්වාදීමේ ව්‍යාපෘතිය

**වෙන් කල ප්‍රතිපාදන :-රු.මි. 15.34 ආදායම :-රු.මි.19.2**




මව්පෝෂ නිෂ්පාදන කර්මාන්තශාලාව ගන්නෝරුව ආහාර පර්යේෂණ ඒකකයේ පිහිටා ඇත. මේ වසර තුළ මව්පෝෂ පැකට 78,733 නිෂ්පාදනය කර ඇති අතර ඒ සඳහා වියදම රු.මි. 15.34 වැය වූ අතර ආදායම රු.මි.19.2 කි.

### 3 වතුකරයේ සහල් පිටි භාවිතය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය

**වෙන් කල ප්‍රතිපාදන :- රු.මි. 12.8 ආදායම :- රු.මි. 14.37**




මෙම ව්‍යාපෘතිය මඟින් විශේෂ සහල් පිටි මිශ්‍රණයක් සහ විශේෂ තෝසේ පිටි මිශ්‍රණයක් අප ආයතනය මඟින් නිෂ්පාදනය කර ඇත. මෙම නිෂ්පාදන කලංකුට්ටිය කර්මාන්තශාලාව තුළ නිෂ්පාදනය කරන අතර විශේෂ සහල් පිටි මිශ්‍රණය සහ විශේෂ තෝසේ පිටි මිශ්‍රණය පැකට 157,466 නිෂ්පාදනය කර ඇත.

### 4 "සිසුපෝෂ" ධාන්‍යමය ව්‍යාපෘතිය හඳුන්වාදීම

මෙය උතුරුමැද පළාත් පාසල් සිසුන්ගේ පෝෂණීය තත්ත්වය ඉහල නැංවීම සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත නවතම ව්‍යාපෘතියකි.



## 5. බුත්තල ගොවිපල සංවර්ධනය (අක්කර 10)



2014 වසරේ මුල් මාස 6 තුළ ආයතනයේ වියදමින් සුළු ප්‍රමාණයෙන් වගා කටයුතු සිදු කරන ලදි. අගෝස්තු මස සිට අමාත්‍යාංශයේ මුදල් ලැබුන නිසාවෙන් ක්‍රියාත්මක සැලැස්මක් අනුව වගා කටයුතු ආරම්භ කරන ලදි. ගොවිපල සතු කෘෂි ළිං දෙක ගැඹුරු කර අලුත්වැඩියා කිරීම සඳහා රු. මි. **0.473** ක වියදමක් දරා ඇත. ගොවිපල වටා විදුලි අලි වැටක් ඉදි කර ඇති අතර ඒ සඳහා රු. මි. **1.017** ක මුදලක් වැය කර ඇත.



ගොවිපල උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව සඳහා රු. මි. **0.187** මුදලක් වැය කර ඇත. මෙහි බඩ ඉරිඟු අක්කර **3.5** ක ප්‍රමාණයක වගා කර ඇති අතර ඒ සඳහා රු .මි. **0.035** ක මුදලක් වැය කර ඇත. එළවළු වගාව සඳහා රු.මි. **0.057** මුදලක් වැය කර ඇති අතර එයින් පලමු වටයේ ආදායම ලෙසරු.මි 0.016 ක මුදලක් ලබා ඇත. නැවත වාර කිහිපයක් අස්වනු නෙළිය හැක.



ස්ථිර බෝග ලෙස අඹ, දොඩම්, කෙසෙල් සහ පොල් වගාව පවත්වාගෙන යන අතර ඒවා නඩත්තු කිරිම සඳහා රු.මි.**0.**124ක වියදමක් දරා ඇත. ඒවා තවමත් එල නොදරන අවධියේ බැවින් එයින් ආදායමක් ලබා ගත නොහැක. මෙම ගොවිපලේ ස්ථිර සේවකයින් **3**ක් සිටින අතර**,** මුරකරු දෛනික පදනම මත සේවය කරයි. ගොවිපල අවශ්‍යතාවයට අනුව දෛනික පදනම මත තවදුරටත් කම්කරුවන් ලබා ගැනීම සිදු කරයි. පසුගිය වසරේ අගෝස්තු සිට මේ දක්වා ගොවිපල වෙනුවෙන් රු.මි. 1.944 ක
වියදමක් දරා ඇත.

## 6. තණමල්විල ගොවිපල සංවර්ධනය (අක්කර 16)

2014 වසරේ මුල් මාස 6 තුළ ආයතනයේ වියදමින් සුළු පරිමාන වගා කටයුතු සිදු කරන ලදි. අගෝස්තු මස සිට අමාත්‍යාංශයේ මුදල් ලැබුන නිසාවෙන් ක්‍රියාත්මක සැලැස්මක් අනුව වගා කටයුතු ආරම්භ කරන ලදි. වී වගාවට අක්කර **8**ක් වෙන් කල හැකි නමුත් වැවේ ජලය ප්‍රමාණවත් නොවන නිසා මෙවර අක්කර **4.5** ක ප්‍රමාණයක් වගා කරන ලදි. සුවදැල් වී වර්ගය වගා කර ඇති අතර රු.මි. 0.14 මුදලක් වියදම් දරා ඇත. මෙ.ටො. **5000**ක අස්වැන්නක් බලාපොරොත්තු වේ. මුරුංගා පැළ 100 ක් සිටුවා ඇති අතර රු.මි 0.012 වියදම් කර ඇත. මෙම පැළ මාස 2ක් පමණ වයස වේ. මෙහි මීටි මුරුංගා විශේෂය වගාකර ඇත. බඩඉරිඟු අක්කර **1** ක වගා කර ඇති අතර සී.අයි.සී. ආයතනයෙන් බීජ ලබාගෙන ඇත. මේ සඳහා රු.මි. **0.005** මුදලක් වැය කර ඇත. වට්ටක්කා හා මෑ කරල් අක්කර 0.25 බැගින් වගා කර ඇත. මේ සඳහා රු.මි 0.002 ක් වැය කර ඇත. බටු පැළ තවාන් දමා ඇත. මීට

අමතරව අඹ පැළ 100 ක් සිටුවා ඇත. යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියාව යටතේ බී.ජී. 5040 ට්‍රැක්ටරය සම්පූර්ණයෙන් අළුත්වැඩියාකොට ඇත. මේ සඳහා රු.මි 0.220 මුදලක් වියදම් වී ඇත.






වී වගාව | කෘෂි ළිඳ | අළුත්වැඩියා කරන ලද ගොඩනැගිල්ල | බඩ ඉරිගු

කෘෂි ළිඳක් සදා ඇති අතර ඒ සඳහා රු.මි. 0.542 මුදලක් වැයවිය. ගොවිපල තුළ ගොඩනැගිල්ලක් අළුත්වැඩියා කරඇති අතර ඒ සඳහා රු.මි 0.468 වියදම් වී ඇත.

**7. ගොවි සතිය : වෙන් කල ප්‍රතිපාදන :- රු.මි.0.8 වියදම :- රු.මි. 1.036**

**8. දැයට කිරුළ 2014 :** මුළු වියදම රු මි.0.1

**9. පැළ තවාන –** නාරාහේන්පිට

නාගරික වැසියන්ට අවශ්‍ය සියලුම ගෙවතු සංවර්ධන පැළ,පොහොර,මෙවලම් ආදිය මෙහිදී සපයා දී ඇත. මෙම වසරේ වියදම රු.මි. 6.102 ක් වූ අතර ආදායම රු.මි. 6.128 ක් විය.

**10 ගොවි නිෂ්පාදන අලෙවි සැල –** දෙහිවල : වියදම රු.මි.42.87 ක්

මෙහි සේවකයන් 18 ක් සේවය කරන අතර රු.මි. 45.144ක ආදායමක් උපයාගෙන තිබුණි.

**11. හෙල්දිි ඵුඩ් භෝජනාගාරය –** නාරාහේන්පිට

මෙහි වියදම රු.මි.18.09 ක් වූ අතර ආදායම රු.මි 16.40 කි. මෙහි දේශිය ආහාර අලෙවි කරන අතර සහල් පිටි නිෂ්පාදන උදැසන ආහාර වෙනුවෙන් සකස් කරයි.

**12. <u>දේශීය ආහාර ප්‍රවර්ධන වැඩසටහන (දිස්ත්‍රික් හා ප්‍රාදේශිය වැඩසටහන්)</u>**

මෙම වැඩසටහන් මාලාව දිවයින පුරා දිස්ත්‍රික්ක 05 ක් ආවරණය වන පරිදි පැවැත්වනු ලැබීය. මෙම වැඩසටහන් මාලාව මඟින් දේශීය ආහාර රට තුළ ප්‍රචලිත කිරීම මඟින් මන්දපෝෂණය සහ කෘත්‍රීම ආහාර භාවිතය අවම කිරීම, දේශීය කෘෂිකර්මාන්තය දිරිමත් කිරීම, දේශීය ආහාර වල ඇති සෞඛ්‍යාරක්ෂිත බව හා ගුණාත්මකභාවය පිළිබඳ ගෘහණියන් දැනුවත් කිරීම, බෝ නොවන රෝග පිටු දැකීමට අවශ්‍ය පසුබිම අවබෝධ කරවීම, ගෙවතු වගාවට කාන්තාවන් නැඹුරු කරවීම හා ස්වයං රැකියා සඳහා කාන්තාවන්ට අවශ්‍ය මූලික අවශ්‍යතා සපයාදී ඒ සඳහා ඔවුන් යොමු කිරීම ප්‍රධාන අරමුණු ලෙස සිදු කරනු ලැබීය.

මෙහි ක්‍රියාකාරකම් ලෙස සහභාගීවන්නන්ට සුවපෝෂ හා සහල් පිටි පැකට් බෙදා දීම, දේශීය ආහාර පාන ප්‍රායෝගිකව සකස්කිරීම, ආහාර වට්ටෝරු ඇතුළත් පොත් පිංච පිළියෙල කිරීම, ප්‍රවාහනය, සංවිධාකයින්ගේ ආහාර පාන සහ නවාතැන් පහසුකම්, බාහිර දේශකවරුන්ගේ දේශන පැවැත්වීම හා උදව් කරුවන්ගේ ගෙවීම් ආදිය ඇතුළත් වේ. 2014 වසරේ දරා ඇති මුළු වියදම රු.මි. 5.23 ක් වන අතර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 20,750 ක් වේ. මෙම වැඩසටහන් මාලාව මාතර, හම්බන්තොට, කිලිනොච්චි, පොළොන්නරුව හා කොළඹ යන දිස්ත්‍රික්කයන් තුළ, දිස්ත්‍රික් වැඩසටහන් 34 ක් හා ප්‍රාදේශිය වැඩසටහන් 105 ක් ලෙස පවත්වනු ලැබීය.

## 7.7 පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය.

**1. මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත කළ පර්යේෂණ ව්‍යාපෘති**

| වැඩසටහන | වෙන් කළ ප්‍රතිපාදන (රු.) | සත්‍ය වියදම (රු.) | පර්යේෂණ සොයා ගැනීම් |
|---|---|---|---|
| එළවළු හා පළතුරුවල ද්විතීයික නිෂ්පාදන තාක්ෂණය එනම් අධිශීතකරණ හා විජලනය වැඩි දියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම. | 1,000,000.00 | 1,031,187.00 | එළවළු හා පළතුරු වල ද්විතීයික නිෂ්පාදන තාක්ෂණ එනම්, අධිශීතකරණය සහ විජලනය වැඩි දියුණු වීම. එමඟින් නව තාක්ෂණික නිෂ්පාදන ගොවියාට හඳුන්වා දීම සහ පසු අස්වනු හානිය අවම කිරීම සිදු වේ. |
| සහල්, ධාන්‍ය සහ රනිල බෝග ආශ්‍රිත එක්ස්ට්‍රූඩර් නිෂ්පාදන වැඩි දියුණු කිරීම. | 300,000.00 | 75,900.00 | සහල් වලින් එක්ස්ට්‍රූඩර් නිෂ්පාදන හඳුන්වා දීමෙන් නව නිෂ්පාදන රටට හඳුන්වා දීම. |
| වකුගඩු රෝග ආශ්‍රිත ප්‍රදේශ වල ජීවත් වන ජනතාවගේ ආහාර රටා හා ආහාර පිළිබඳ කෙරෙන පරීක්ෂණය | 140,000 | 129,219 | සමීක්ෂණ වාර්තා 484 ක් පමණ අවසන් කර ඇත. එමඟින් වකුගඩු රෝග ආශ්‍රිත ප්‍රදේශ වල ජීවත් වන ජනතාවගේ ආහාර රටා පිළිබඳ දැනීමක් ලබාගත හැක. |
| අඹ, පැපොල් සහ අන්නාසි පල්ප නිස්සාරණය සඳහා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ පල්ප යන්ත්‍රය ඇගයීම. | 133,000.00 | 48,450.00 | අඹ, පැපොල් සහ අන්නාසි පල්ප නිස්සාරණයට සුදුසුය. |
| මීතයිල් සයික්ලෝ ප්‍රොපේන් භාවිතයෙන් ඇඹුල් කෙසෙල් ගෙඩි වල පසු අස්වනු ජීව කාලය දීර්ඝ කිරීම. | 365,000 | 30,608 | ඇඹුල් කෙසෙල් වලට මීතයිල් සයික්ලෝ ප්‍රොපේන් භාවිතය සුදුසු බව. |
| ප්‍රධාන ලෙස වී නිෂ්පාදනය කරන ප්‍රදේශ වල වී ගබඩාකරණයේ වර්තමාන තත්ත්වය ඇගයීම. | 150,000 | 84,245 | අනුරාධපුර, පොළොන්නරුව දිස්ත්‍රික්ක වල සහල් මෝල් හිමියන්ගෙන් හා වී ගබඩා කරන්නන්ගෙන් ප්‍රශ්නාවලි 105 ක් පුරවා ඇත. |
| කුරක්කන් වල ගල් හා වැලි ඉවත් කිරීමේ යන්ත්‍රයක් නිර්මාණය කිරීම. | 200,000 | 151,155 | කුරක්කන් වල ගල් හා වැලි ඉවත් කිරීමේ යන්ත්‍රයක් තනා ඇත. මෙමඟින් කුරක්කන් නිෂ්පාදකයන්ගේ ප්‍රධාන ප්‍රශ්නයක් වන අපද්‍රව්‍ය ඉවත් කිරීම පහසු වී ඇත. |
| වී පෙහවීමේදී බොල් ඉවත් කිරීම යාන්ත්‍රීකරණය කිරීම. | 155,000 | 61,905 | බොල් ඉවත් කිරීමේ යන්ත්‍රයක් තනා ඇත |
| එක්ස්ට්‍රූඩර් වර්ගයේ තෙල් නිස්සාරණ යන්ත්‍රය මඟින් මී ඇට වලින් තෙල් නිස්සාරණය සොයා බැලීම. | 130,000 | 74,385 | එක්ස්ට්‍රූඩර් වර්ගයේ යන්ත්‍රය මී ඇට වලින් තෙල් නිස්සාරණයට සුදුසුය. |
| ශ්‍රී ලංකාවේ අඹ වල පසු අස්වනු ගැටළු හඳුනා ගැනීමේ ක්ෂේත්‍ර සමීක්ෂණ පරීක්ෂණය. | 300,000) | 79,074 | ප්‍රශ්නාවලි 75 ක තොරතුරු අවසන් කර ඇත. |

## 2. *පුද්ගලික ආධාර මත කෙරෙන ව්‍යාපෘති*

| වැඩසටහන | වෙන් කළ ප්‍රතිපාදන (රු.) | සත්‍ය වියදම (රු.) | පර්යේෂණ සොයා ගැනීම් |
|---|---|---|---|
| කෘමිනාශක වලින් ප්‍රතිකාර කරන ලද ධාන්‍ය ඇසුරුම් කවර වල යෝග්‍යතාවය ශ්‍රී ලාංකික තත්ත්ව යටතේ පරීක්ෂා කිරීම. | **105,000** | **64,600** | ධාන්‍ය ඇසුරුම් කවර වල ගබඩා කිරීම යෝග්‍යය. |
| සකසා පිළියෙල කළ පළතුරු ආශ්‍රිත අතුරුපසක තත්ත්වය වැඩි දියුණු කිරීම හා කල් තබා ගැනීමේ කාලය දීර්ඝ කිරීම. | **121,000** | **12,000** | පළතුරු ආශ්‍රිත අතුරුපසක තත්ත්වය දියුණු කිරීමෙන් මාස 03 ක කල්තබා ගැනීමට හැකිය. |
| අළුතින් අස්වැන්න නෙළන ලද තෙත් වී වියලීම සඳහා ජංගම වී වියලනයක් නිර්මාණය කිරීම. | **1,085,000** | **690,410** | යන්ත්‍රයේ නිෂ්පාදන කටයුතු අවසන් අදියරේ පවතී. මෙමඟින් සුනාමි යන්ත්‍රයෙන් කපා ගැනෙන වී අස්වැන්න වියලීම සිදු කර හැක |

## 3. *පර්යේෂණ වාර්තා සඳහා ඇගයීම්*

ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය බී.එම්.කේ. ස්වර්ණශිඛා තිලකරත්න මහත්මිය 2010 වසරේ සිදු කරන ලද පර්යේෂණ ව්‍යාපෘතිය අන්තර්ජාතික පර්යේෂණ සඟරාවේ පළවීම හේතුවෙන් ඇගයීමේ සහතිකයක් ජාතික පර්යේෂණ සභාව විසින් පිරිනමා ඇත. මෙය 2010 කාර්ය සාධන වාර්තාවේ පළ වුණු පර්යේෂණ ව්‍යාපෘතියකි.

## 4. *2014 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති*

| | ව්‍යාපෘතිය | පුහුණු පාඨමාලා ගණන | පුහුණුලාභීන් ගණන | ව්‍යාපෘතියේ ඉලක්ක |
|---|---|---|---|---|
| **4.1** | සහල් පිටි ආශ්‍රිත ආහාර පාසල් ළමුන් තුළ භාවිතය ප්‍රචලිත කිරීම සඳහා පාසල් වල අලෙවිසල් භාරකරුවන් දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය (වෙන් කළ ප්‍රතිපාදන රු. 200,000) | **10** | **498** | **-** |
| **4.2** | උසස් තත්ත්වයේ දේශීය සහල් පරිභෝජනය ප්‍රචලිත කිරීම සඳහා ප්‍රධාන නගර ආශ්‍රිතව අලෙවිසල් දියුණු කිරීමේ ව්‍යාපෘතිය (වෙන් කළ ප්‍රතිපාදන රු. 100,000) | **01** | **30** | **-** |
| **4.3** | සහල් මෝල් නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (වෙන් කළ ප්‍රතිපාදන රු. 90,000) | **05** | **134** | **13** |

| | | | | |
|---|---|---|---|---|
| 4.5 | සහල් පිටි මෝල් ආරම්භ කිරීමේ / නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (වෙන් කළ ප්‍රතිපාදන රු. 100,000) | 04 | 115 | 11 |
| 4.6 | ආහාර සුරක්ෂිතතාවය සඳහා ධාන්‍ය ගබඩා කිරීමේ ව්‍යාපෘතිය (වෙන් කළ ප්‍රතිපාදන රු. 200,000) | 10 | 466 | - |
| 4.7 | කුළුබඩු සකස් කිරීමේ මධ්‍යස්ථාන ඇති කිරීමේ ව්‍යාපෘතිය (වෙන් කළ ප්‍රතිපාදන රු. 100,000) | 08 | 314 | 03 |
| 4.8 | පළතුරු/සියඹලා ආශ්‍රිත නිෂ්පාදන ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය (වෙන් කළ ප්‍රතිපාදන රු. 160,000) | 11 | 397 | - |
| 4.9 | තල තෙල් නිස්සාරණය හඳුන්වා දීමේ ව්‍යාපෘතිය (වෙන් කළ ප්‍රතිපාදන රු. 80,000) | 04 | 86 | 02 |
| 4.10 | දේශීය ආහාර ප්‍රචලිත කිරීම පිළිබඳ ගෘහ විද්‍යා ගුරුවරුන් හා පාසල් සිසුන් දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය (වෙන් කළ ප්‍රතිපාදන රු. 119,000) | 08 | 461 | - |
| 4.11 | සෞඛ්‍ය ආරක්ෂිතව පළතුරු අලෙවි කිරීමේ මධ්‍යස්ථාන ඇති කිරීමේ ව්‍යාපෘතිය (වෙන් කළ ප්‍රතිපාදන රු. 100,000) | 05 | 192 | - |

## 5. *ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව හා ප්‍රදර්ශනය*

2013, 2014 වර්ෂ වල කරන ලද පර්යේෂණ එළි දැක්වීම සඳහා ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවක් සහ ප්‍රදර්ශනයක් පවත්වන ලදී.

## 6. *ආයතනයේ පුහුණු පාඨමාලා*

ආයතනයේ කරගෙන යනු ලබන ව්‍යාපෘති වල ප්‍රතිඵල අපේක්ෂිත පුහුණුලාභීන් සඳහා ලබාදීම මෙම පුහුණු පාඨමාලා පැවැත්වීමේ අරමුණ වේ. තවද, පසු අස්වනු හානිය අවම කිරීමේ ක්‍රියාදාමය පිළිබඳ පුහුණුවක්ද ලබා දේ.

| | නේවාසික | බැහැර | ව්‍යාප්ති |
|---|---|---|---|
| පුහුණු පාඨමාලා ගණන | 53 | 18 | 36 |
| පුහුණුලාභීන් ගණන | 1808 | 1901 | 1400 |

## 7. *උපදේශක සේවා*

1. සහල් මෝල් 14 ක් නවීකරණය කර ඇත. මෙමඟින් වඩා හොඳ යන්ත්‍ර සූත්‍ර භාවිතය නිසා සහල් වල තත්ත්වය අපනයන තත්ත්වයට උසස් කර ඇත. මෙමඟින් වී ගොවියාට වැඩි මිලක් හිමි වේ. හැකි හැම අවස්ථා වලදීම පරිසර දූෂණය අවම කිරීමේ උත්සහයක්ද ගනු ලබයි.

2. සහල් පිටි මෝල් 11 ක් නවීකරණය කර ඇත. මෙමඟින් වඩා හොඳ යන්ත්‍ර සූත්‍ර භාවිතය නිසා සහල් පිටි අංශු කුඩා වීමෙන් වඩා හොඳ නිෂ්පාදනයක් තත්ත්වයෙන් උසස් අන්දමින් ලබාගත හැක.

3. කුළුබඩු නිෂ්පාදන ඒකක 09 ක් ආරම්භ කර ඇත. මෙමඟින් වඩා හොඳ තත්ත්වයෙන් උසස් කුළු බඩු පාරිභෝගිකයාට ලබාගත හැකිය.

4. තල තෙල්, කොහොඹ තෙල්, මී තෙල් නිෂ්පාදන ඒකක 4 ක් පිහිටුවා ඇත. මෙමඟින් ස්වයං රැකියා නිෂ්පාදන අවස්ථා පෑදී ඇත.

## 8. *ආයතනයේ ප්‍රකාශන නිකුත් කිරීම.*

2014 වර්ෂයේ ආයතනයේ ප්‍රකාශන 22,965 ක් නිකුත් කර ඇත. මෙමඟින් ආයතනයේ පර්යේෂණ ප්‍රතිඵල සහ පසු අස්වනු හානිය අවම කිරීමේ ක්‍රියාදාමයන් සහ පසු අස්වනු යන්ත්‍ර පිළිබඳ අවබෝධයක් ලබා දේ.

## 9. *2014 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය*


| | 2014 ඇස්තමේන්තුව (රු.) | 2014 සත්‍ය වියදම (රු.) |
|---|---|---|
| පුනරාවර්තන වියදම | | |
| පුද්ගලික පඩිනඩි | 57,204,250 | 55,868,238 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 20,650,000 | 19,921,683 |
| පුනරාවර්තන වියදම් එකතුව | 77,854,250 | 75,789,921 |
| ප්‍රාග්ධන වියදම් | | |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | 75,000,000 | 70,400,163 |
| ප්‍රාග්ධන වියදම් එකතුව | 75,000,000 | 70,400,163 |
| සම්පූර්ණ එකතුව | 150000,000 | 140,800,326 |

## 7.8 ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

1987 දෙසැම්බර් 22 දින අංක 47 දරණ පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පර්යේෂණ ප්‍රතිපත්ති සැකසීම ප්‍රමුඛතාවයයි. මුදල් ඇතුළු පහසුකම් සැපයීම් ඒවා ඇගයීම් සමාලෝචනය කිරීම සහ පර්යේෂණ මනා ලෙස සම්බන්ධීකරණය සහ කළමනාකරණය කිරීමේ අරමුණ සාක්ෂාත් කරනු පිණිසයි. මීට අමතරව කෘෂි විද්‍යාඥයින් පුහුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම ද මෙම සභාවට පවරණ විධි නියෝග වේ. අද මෙම ආයතනය මඟින් ඉතා සාර්ථකව සකස් කරනු ලබන්නා වූ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙන් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පර්යේෂණ දිරිමත් කිරීමක් සිදු කෙරේ.

2014 වසර සඳහා ප්‍රගති සමාලෝචනය ඇතුළත් මෙම වාර්තාව තුළ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය ආයතනික විධි නියෝග 13 යටතේ පෙළගස්වා ඇත.

2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අංක 1-13 දරණ පර්යේෂණ කළමනාකරණ වැඩසටහන් වල මූල්‍ය ප්‍රගතිය




| වැඩසටහන් අංකය | ප්‍රතිපාදන (රු.මි) | වියදම් (රු.මි) |
|---|---|---|
| 1 | 0.5 | 0.205 |
| 2 | 0.78 | 1.31 |
| 3 | 1.2 | 0.58 |
| 4 | 0.6 | 0.41 |
| 5 | 0.4 | 0.31 |
| 6 | 10.54 | 8.35 |
| 7 | 0.1 | 0.047 |
| 8 | 0.06 | 0.047 |
| 9 | 0.05 | 0.047 |
| 10 | 2.5 | 2.5 |
| 11 | 0.2 | 0.2 |
| 12 | 2.95 | 3.5 |
| 13 | 0.4 | 0.32 |

වැඩසටහන් අංක 1 : ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම 2014 ජාතික සංවර්ධනය උදෙසා තාක්ෂණික විසඳුම් සොයා ගැනීම සඳහා යොමු කරමින් සකස් කර ඇත. ඉන් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ යාන්ත්‍රීකරණය, බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, ස්වාභාවික සම්පත් කළමනාකරණය, විසිතුරු මල් ප්‍රභේද සැකසීම සහ සත්ව පාලනය යන අංශයන් සඳහා අවධානයක් යොමු කර ඇත.එම පර්යේෂණ අප සභාවට අනුයුක්ත ජාතික විද්වත් කමිටු සහ පර්යේෂණ වැඩසටහන් හා ව්‍යාපෘති පිළිබඳ ජාතික කමිටුවල අනුමැතිය ලබා ඇති අතර ඒවා ඇගයීමට භාජනය කෙරේ. 2015 වසර සඳහා නව පර්යේෂණ ව්‍යාපෘති 36ක් ද දීර්ඝ කරන ලද ව්‍යාපෘති 03ක් ද දැනට ක්‍රියාත්මකව පවතින ව්‍යාපෘති 23 ක් ද ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම යටතේ සිදු කෙරෙමින් පවතී.ඉහත ව්‍යාපෘති සඳහා රු. මිලි. 77.7 ක් මඟින් 2015 වසර සඳහා රජය මහා භාණ්ඩාගාරයට නිර්දේශ කර ඇත.විශ්ව විද්‍යාල සඳහා ව්‍යාපෘති වලට තිබූ මූල්‍ය ගැටළු නිරාකරණය කර දැනට පර්යේෂණ ව්‍යාපෘති 70 ක් ක්‍රියාත්මක කර ඇත.

වැඩසටහන් අංක 2 ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතා

2012-2016 කාලය සඳහා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සකස් කර එළි දක්වා ඇත.මෙම ප්‍රතිපත්තිය මඟින් කෘෂි ක්ෂේත්‍රයන්ගේ පවතින අඩු ලුහුඩුකම් මානව සම්පත් සංවර්ධනය සහ සම්පත් කළමනාකරණය හා කෘෂිකාර්මික දැනුම බෙදා හැරීම ආදී සියලු ක්ෂේත්‍ර ආවරණය කර ඇත. කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර පිළිබඳ ජාතික ප්‍රමුඛතා සකස් කර ඇති අතර ස්වාභාවික සම්පත් කළමනාකරණ සහ කාබනික කෘෂිකර්මය පිළිබඳ ප්‍රමුඛතා සකස් කරමින් පවතී.

වැඩසටහන් අංක 3: ජාතික කෘෂිකාර්මික පර්යේෂණ වැඩසටහන් වල ඵලදායීතාව වැඩි කිරීම.

2014 වසර සඳහා ජනවාරි මස සිට ජූනි දක්වා දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ක්ෂේත්‍ර ඇගයීම් අදාළ ජාතික කමිටු මඟින් නිම කර ඇත. 2014 ජූනි මස සිට දෙසැම්බර් මස දක්වා ඇගයීම 2015 ජනවාරි මස නිම කිරීමට නියමිතව ඇත. මෙය නිම කරන ලද ව්‍යාපෘති ඇගයීම් ගණන 26 ක් වේ.

වැඩසටහන් අංක 4: පර්යේෂණ ආයතන පිළිබඳ නිර්දේශයන් සහ ස්ථාපනය කිරීම.

INFORM වැඩසටහන පිළිබඳව ආයතන 03ක් සඳහා පුහුණුවීම් ලබා දී ඇත. ආයතන 11ක් සඳහා දත්ත ගොනු විධිමත් කිරීම අවසන් කර ඇත. ජාතික මට්ටමේ දත්ත ගොනු 02ක් නිම කර අවසන්ව ඇත. ඉන් සකස් වාර්තාව යටතේ මානව සම්පත් පිළිබඳ තොරතුරු මෙන්ම සහ එක් එක් ආයතන වලින් දැනට නිම කරන ලද ව්‍යාපෘති පිළිබඳව තොරතුරු සහ අයවැය ඉදිරිපත් කර ඇත. AGRINET සංග්‍රහය යටතේ දැනට පුස්තක නාමාවලි අප ආයතයේ වෙබ් පිටුව හරහා අන්තර්ජාලයට නිකුත් කිරීමට කටයුතු සලසා ඇත.

වැඩසටහන් අංක 05: පර්යේෂණ ආයතන බාහිර සමාලෝචන වැඩසටහන

සුළු අපනයන බෝග ලේඛකාධිකාරිය පිළිබඳව බාහිර සමාලෝචනය සඳහා කටයුතු සම්පාදනය කරමින් පවතී.

වැඩසටහන් අංක 06

(අ) අන්තර් ජාතික කෘෂිකර්මික පර්යේෂණ සම්මන්ත්‍රණය

අප ආයතනය විසින් ප්‍රථම වරට සංවිධානය කරන ලද අන්තර් ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සම්මන්ත්‍රණය 2014 අගෝස්තු 11-12 දිනයන්හි දී කොළඹ පදනම් ආයතන පරිශ්‍රයේ දී පවත්වන ලදි. මෙම සම්මන්ත්‍රණය මඟින් ආහාර හා පෝෂණ සුරක්ෂිතාවය සහ ස්වාභාවික විපර්යාස පිළිබඳ පර්යේෂණ තොරතුරු හුවමාරු කර ගැනීම විද්‍යාත්මක පසුබිමක් සකස් කිරීම උදෙසා සංවිධානය කර තිබුණි. මෙම වැඩසටහන සඳහා ලොව නන් දෙසින් අයදුම්පත් ලැබුණු අතර ඉන් සාරාංශ පත්‍ර 180 ක් සහා ප්‍රදර්ශනය සඳහා විද්‍යාත්මක පත්‍ර 128 කුත් තෝරා ගනු ලැබිණි. ආචාර්ය ආර්.එස්. පරෝඩා ඇතුළු විද්වතුන් ගේ ප්‍රධානත්වයෙන් ඉහත උත්සවය හෙබවනු අතර ඊට සහභාගී වූවන්ගේ සංඛ්‍යාව 330 කි.

(ආ) 2014 ජාතික සම්මාන උලෙළ

කෘෂිකර්ම පර්යේෂණ ක්ෂත්‍රයේ විශිෂ්ඨත්වය උදෙසා පර්යේෂණ නිලධාරීන් දිරිමත් කිරීම උදෙසා අප ආයතන මඟින් ආරම්භ කරන ලද ජාතික සම්මාන උළෙල 2014 වසර සඳහා පවත්වන ලදි. මෙහිදී ඉතා අනර්ඝ මට්ටමේ පර්යේෂණ ව්‍යාපෘති තෝරා ජාතික සම්මාන පිළිගන්වන ලදි. මෙම අවස්ථාවේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එවකට හිටි අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් සම්මාන ලබා දෙන ලදි. එහිදී ප්‍රධාන සම්මානය හිමි වූයේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහචාර්ය

රංජිත් මාපා ඇතුළු කණ්ඩායම විසින් සිදු කරන ලද වියළි කලාපීය පාංශු වර්ගීකරණය හා සිතියම් ගත කිරීම පිළිබඳ වූ ව්‍යාපෘතිය සඳහාය.

(ඇ) පර්යේෂණ දීමනා වැඩසටහන

කෘෂි ක්ෂේත්‍රයේ පවතින අභියෝගතා ජය ගැනීම සඳහා කෙරෙන විශිෂ්ට මට්ටමේ පර්යේෂණ දිරිමත් කිරීමේ යාන්ත්‍රණයක් ලෙස එම පර්යේෂණ නිලධාරීන් සඳහා දිරි දීමනාවක් ලබා දීමට ශ්‍රී ලංකා රජය කටයුතු සලසා ඇත. මේ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් චක්‍ර ලේඛනය 2/2014 නිකුත් කර ඇත. එම චක්‍ර ලේඛනයට අනුකූලව යමින් අප ආයතනය මඟින් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පර්යේෂණ නිලධාරීන් එම දිරි දීමනාව ලබා දීමට කටයුතු කර ඇත. 2014 වසර සඳහා 63 දෙනෙකුට දිරි දීමනාව ලබා දෙන ලදි. මේ සඳහා අයදුම් කරන ලද අයදුම්කරුවන්ගෙන් 12කට පමණක් එම දිරි දීමනාව හිමි නොවුණි.

(ඇ) ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනත සංශෝධනය කිරීම.

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනත සඳහා නිර්දේශිත සංශෝධන සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

වැඩසටහන් අංක 07

ශ්‍රී ලංකා රජය සහ කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය අතර අන්තර් මුහුණතක් සකස් කිරීම.

වැඩසටහන් අංක 08

පර්යේෂණ ආයතනය අතර පර්යේෂණ වැඩසටහන් සකස් කිරීම.

වැඩසටහන් අංක 09

තොරතුරු ලබා ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 2014 වසර සඳහා අප ආයතනය මඟින් ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම යටතේ ක්‍රියාත්මක වූ වැඩසටහන් වේ.

වැඩසටහන් අංක 10 : දේශීය හා විදේශීය පර්යේෂණ ආයතන සමඟ අන්තර් සම්බන්ධතා ඇති කර ගැනීම.

ආසියානු පැසිපික් කෘෂිකාර්මික පර්යේෂණ සංගමය විසින් සංවිධානය කරනු ලැබූ 2014 වසරේ පෙබරවාරි මස 17-28 යන දින වල සංවිධානය කරනු ලැබූ ඉන්දියාවේ නව දිල්ලි නගරයේ පැවති ශාක ජාන සම්පත් ආරක්ෂණය පිළිබඳව පැවති කෙටි කාලීන පුහුණුව සහ ආහාර සුරක්ෂිතභාවය පිළිබඳව පුහුණුවක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත අප ආයතනය මඟින් ලබා දෙන ලදි.

වැඩසටහන් අංක 11

කාලීනව වැදගත් වන කෘෂිකාර්මික ගැටළු නිරාකරණය, කෘෂිකාර්මික පර්යේෂණ යෝජනා සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක් අප ආයතනය මඟින් සිදු කරන ලදි.

වැඩසටහන් අංක 12 : සේවක පුහුණු කිරීමේ වැඩසටහන්

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය තුළ අන්තර් ජාතික පුහුණු කිරීමේ අවශ්‍යතා හඳුනා ගෙන අන්තර් ජාතික පුහුණුවීම් සඳහා මාර්ග නිර්දේශයක් අප ආයතනය විසින් සකස් කරන ලදි. ශාක ආරක්ෂණය පිළිබඳ කෙටිකාලීන හා පශ්චාත් උපාධි මට්ටමේ පුහුණු වීම්මේ යටතේ කණිෂ්ඨ පර්යේෂකයින් 20 දෙනෙකු ශාක ආරක්ෂණය පිළිබඳව කෙටි කාලීන හා පශ්චාත් උපාධි පුහුණු වීම්

සඳහා කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය වෙත යොමු කරන ලදි. තවද පර්යේෂකයින් දෙදෙනෙකු එම වැඩසටහන යටතේ පසු අස්වනු තාක්ෂණය පිළිබඳ හා රසායනාගාර ආරක්ෂාව පිළිබඳව පුහුණුවීම් නිම කරන ලදි.

### වැඩසටහන් අංක 13: ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ කාර්ය සාධනය

කොන්ත්‍රාත් පර්යේෂණ වැඩසටහන යටතේ ලබා දුන් පර්යේෂණ ව්‍යාපෘති ප්‍රතිඵල පිළිබඳ කාර්ය සාධන වාර්තාව අප සභාවේ අනුමැතියට යොමු කර ඇත.

***2014 වසරේ අප ආයතනය මඟින් කෙරුණු වැඩසටහන් වල ශීර්ෂයන්***



ආචාර්ය ආර්.එස්. පරෝඩා මහතාගේ අන්තර් ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සම්මන්ත්‍රණයේදී විද්වතුන් ඇමතීම. වම ආචාර්ය එස්.කේ.ඩී.එෆ්. නෙරන්ජන් මහතා ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ සහ සම්මන්ත්‍රණ සංවිධායක, ප්‍රභාත් විමල් කුමාර අධ්‍යක්ෂක ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, අචාර්ය ජේ.ඩී. සමරසිංහ සභාපති ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ආර්ථික හා සංවර්ධන අමාත්‍ය, ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා කෘෂිකර්ම අමාත්‍ය , ආචාර්ය ජෙරමි බර්ඩ් අධ්‍යක්ෂක ජනරාල් අන්තර්ජාතික ජල කළමනාකරණ ආයතනය, ආචාර්ය ඩී.එම්.එන්. දිසානායක අතිරේක ලේකම් කෘෂිකර්ම අමාත්‍යාංශය, මහචාර්ය බුද්ධි මාරම්බේ සභාපති සම්මන්ත්‍රණ සංස්කාරක මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය බෝග විද්‍යා අංශය පේරාදෙණිය විශ්ව විද්‍යාලය



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අතින් මහාචාර්ය රංජිත් මාපා ත්‍යාග ප්‍රදාන අවසථාව

















කෘෂිකාර්මික තොරතුරු ජාලය පිළිබඳව පැවති වැඩමුළුවක්



## 7.9 කෘෂිකාර්මික හා .ගොවිජන රක්‍ෂණ මණ්ඩලය

ලංකාවේ කෘෂිකාර්මික ක්‍ෂේත්‍රයට විධිමත් අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් වශයෙන් කෘෂිකාර්මික රක්‍ෂණය හඳුන්වාදෙමින් 1973 අංක 27 දරණ කෘෂිකර්ම රක්‍ෂණ පනත මඟින් පිහිටවනු ලැබූ කෘෂිකර්ම රක්‍ෂණ මණ්ඩලය, 1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ පනත මඟින් අදාළ කර්තව්‍යන් තවදුරටත් පුළුල් කරමින් ඉටු කරනු ලබන සිය මෙහෙවරෙහි 42 වන වසරට පා තබා ඇත.

කෘෂිකාර්මික ක්‍ෂේත්‍රයේ රක්‍ෂණ සේවා සපයන දිවයිනේ එකම රාජ්‍ය ආයතනය වශයෙන් දේශීය කෘෂිකර්මාන්තය නංවාලීමේ හා කෘෂිකාර්මිකයාගේ ආර්ථිකය ස්ථායී කිරීමෙහිලා කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම උපරිම ආකාරයෙන් ඉටුකිරීම අරමුණු කර ගනිමින් 2014 වර්ෂයේදීද යෝජනා ක්‍රම රාශියක් දීපව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය කටයුතු කර ඇත. එමඟින් 2014 වර්ෂයේදී මණ්ඩලය උපයා ඇති රක්‍ෂණ වාරික ආදායම රුපියල් මිලියන 117 ක් විය.

වර්තමානයේදී ලෝකය පුරා පැන නඟිමින් පවතින දේශගුණික හා කාලගුණික විපර්යාසයන් හේතුවෙන් කෘෂිකර්මාන්තය අවදානම් තත්ත්වයක පවතින අතර, පසුගිය වර්ෂවලදී එම තත්ත්වය අඛණ්ඩව ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය කෙරෙහිද ඉතාමත් අහිතකර ලෙස බලපාන ලදී. 2010/2011 මහ කන්නයේ සිට වරින්වර ඇතිවූ නියං සහගත තත්ත්වයන් හා ගංවතුර තත්ත්වයන් හේතුවෙන් යල සහ මහ කන්න කිහිපයකදීම දැඩි ලෙස වගා හානි සිදුවන ලදි. පසුගිය 2014/15 මහ කන්නයේදීද ගංවතුර හේතුවෙන් විශාල වශයෙන් වී වගාබිම් ප්‍රමාණයක් විනාශයට පත් විය.

මේ හේතූන් නිසා මණ්ඩලීය වගා රක්‍ෂණ කටයුතු වලට තරමක බලපෑමක් ඇතිවිය. කෙසේවුවද, හදිසි ආපදා තත්ත්වයන් හමුවේ කෘෂිකර්මාන්තය හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීමෙහිලා අවදානම් කළමනාකරණයට සෘජුවම සම්බන්ධ වන එකම රාජ්‍ය රක්‍ෂණ ආයතනය වශයෙන් වගා හානි වූ ගොවීන් වෙත මණ්ඩලය විසින් සිදු කරන ලද වන්දි මුදල් ගෙවීම බෙහෙවින් ඉවහල්විය. එමෙන්ම මූල්‍ය ආයතන විසින් ලබාදෙන කෘෂිකාර්මික ණයවල සුරක්ෂිතභාවය තහවුරු කරනු වස් ණය නිකුත් කිරීමේදී මෙම මණ්ඩලයේ දැක්ම සහ මෙහෙවරට අනුව යමින් අදාළ වගාවන්ට රක්‍ෂණාවරණය ලබාදීම තුළින් විශාල කාර්යභාරයක් ඉටු කිරීමට මණ්ඩලයට හැකි විය. මෙහිදී විශේෂයෙන්ම වගා හානිවූ දිස්ත්‍රික්ක වලදීම වන්දි ගණනය කර, කන්නය අවසන් වීමටත් පෙර වන්දි මුදල් ගෙවීම නිසා ගොවි ජනතාවගේ හා බැංකු ක්‍ෂේත්‍රයේ විශ්වාසය දිනාගැනීමට මණ්ඩලයට හැකියාව ලැබී ඇත.

කෘෂිකාර්මික ක්‍ෂේත්‍රයට අදාළව ක්‍රියාත්මක කරනු ලබන පශු සම්පත් රක්‍ෂණය, ගබඩා රක්‍ෂණය, ට්‍රැක්ටර් හා කෘෂි උපකරණ රක්‍ෂණය මෙන්ම කෘෂිකාර්මිකයාගේ සුභසාධනය ඉලක්ක කරගනිමින් සුවසෙත සෞඛ්‍ය රක්‍ෂණය හා හදිසි අනතුරු රක්‍ෂණය ඇතුළු රක්‍ෂණ යෝජනා ක්‍රමද මණ්ඩලය විසින් 2014 වර්ෂයේදීද දීපව්‍යාප්තව ක්‍රියාත්මක කරන ලදී.


අප මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පසුගිය වර්ෂ කිහිපය පුරා මුහුණ දුන් දැඩි මූල්‍ය අර්බුදය හේතුවෙන් තාවකාලිකව නවතා දමා තිබූ ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම, විශ්‍රාම වැටුප්ලාභීන් හට පෙරට වඩා වැඩි ප්‍රතිලාභ ලැබෙන පරිදි නව සංශෝධන සහිතව 2014

ජනවාරි මස සිට නැවතත් ආරම්භ කිරීමට පියවර ගනු ලැබිණි. මේ අනුව, පහත සඳහන් පරිදි මින් පෙර උපරිම විශ්‍රාම වැටුප ලෙස රු. 1,000ක් ලබා ගත් ගොවි විශ්‍රාම වැටුප් ලාභීන්ට උපරිම විශ්‍රාම වැටුප රු. 5,000 ක් දක්වා වැඩි කරන ලදි.

| වයස | මාසික විශ්‍රාම වැටුප රු. |
|---|---|
| 60 – 63 | 1,000/- |
| 64 – 70 | 1,250/- |
| 71 – 77 | 2,000/- |
| 78 හෝ ඊට වැඩි | 5,000/- |

වාර්ෂික වාරික ආදායම 2010 සිට 2014 දක්වා (රු.මි.)

| යෝජනා ක්‍රමය | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| වගා රක්ෂණ යෝජනා ක්‍රම | 79.69 | 119.07 | 99.90 | 82.16 | 97.22 |
| පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය | 12.77 | 17.86 | 15.80 | 8.89 | 12.06 |
| ගබඩා හා කෘෂි උපකරණ රක්ෂණ යෝජනා ක්‍රම | 3.40 | 5.88 | 6.50 | 1.53 | 0.25 |
| සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රම | 9.62 | 14.23 | 2.50 | 0.74 | 7.74 |
| එකතුව (රු මිලියන) | 105.48 | 157.04 | 124.70 | 93.32 | 117.26 |




මේ ආකාරයෙන් 2014 වර්ෂය තුළදී දිවයිනේ එකම රාජ්‍ය රක්ෂණ ආයතනය වශයෙන් මණ්ඩලය මින් පෙර වර්ෂ වලට වඩා බොහෝ වැඩසටහන් සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කරනු ලැබූ අතර, මේ තුලින් පසුගිය වර්ෂය තුළදී ලබාගත් භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත පරිදි සාරාංශගත කර ඇත.

| රක්ෂණ යෝජනා ක්‍රමය | ලබා ගත් ප්‍රගතිය | |
|---|---|---|
| වී වගා රක්ෂණය | භෞතික (අක්කර) | 48,924 |
| | මූල්‍ය (රු.) | 62,974,121 |
| අනෙකුත් වගා රක්ෂණ යෝජනා ක්‍රම | භෞතික (අක්කර) | 16,550 |
| | මූල්‍ය (රු.) | 34,241,112 |
| කෘෂි උපකරණ හා ට්‍රැක්ටර් රක්ෂණ යෝජනා ක්‍රමය | භෞතික (උපකරණ) | 55 |
| | මූල්‍ය (රු.) | 245,254 |
| පශු රක්ෂණ යෝජනා ක්‍රමය | භෞතික (සතුන්) | 7,287 |
| | මූල්‍ය (රු.) | 12,056,547 |
| සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රම | භෞතික (ගොවීන්) | 11,289 |
| | මූල්‍ය (රු.) | 7,738,747 |
| එකතුව | | **117,255,781** |

මීට අමතරව සහනාධාර පොහොර ලබා ගන්නා ගොවීන් අනිවාර්ය වගා රක්ෂණයට දායක කරගනු ලබන "කෙතට අරුණ - පොහොර සහනාධාර යෝජනා ක්‍රමය" ක්‍රියාත්මක කිරීම **2014/15** මහ කන්නයේ සිට මණ්ඩලය වෙත පවරන ලදි. ඒ අනුව, දිවයිනේ සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයක්ම ආවරණය වන පරිදි සියලුම ගොවීන් විසින් සහන මිලට ලබා ගන්නා පොහොර කිලෝග්‍රෑම් **01**කින් රුපියල් **3/-** බැගින් අය කරගෙන ඔවුන් අනිවාර්ය වගා රක්ෂණයට දායක කර ගනු ලබයි. මේ යටතේ මණ්ඩලය විසින් මේ වන විට ක්‍රියාත්මක කරගනු ලබන වගා රක්ෂණ යෝජනා ක්‍රමය එලෙසම ක්‍රියාත්මක වන අතර, පොහොර සහනාධාරය යටතේ ද වගා රක්ෂණාවරණය ලබා දෙනු ලබයි.

| වර්ෂය | අනුමත සේවක සංඛ්‍යාව | සේවයේ නියුතු සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| **2013** | **421** | **295** | **126** |
| **2014** | **421** | **296** | **125** |

ඉහත සඳහන් ආකාරයෙන් මණ්ඩලයේ සේවක පුරප්පාඩු සහිතව වුවද, දැනට සිටින සීමිත සේවක පිරිස සමඟ එක්ව **2014** වර්ෂය තුළදී මණ්ඩලය කාර්යක්ෂම අයුරින් දිවයිනේ කෘෂි රක්ෂණය හා ආරක්ෂණය සැලසීම උදෙසා ක්‍රියාකාරී අන්දමින් කටයුතු කරනු ලැබීය. මෙහිදී දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද නොයෙකුත් වැඩසටහන් වලට අදාළ ඡායාරූප වාර්තාවක් ද පහත හැකිවේ.



ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම



වගා රක්ෂණ වන්දි ප්‍රදානය

## 7.10 ශ්‍රී ලංකා කජු සංස්ථාව

| වැඩසටහන | 2014 ප්‍රතිපාදන ( රු.මි) | 2014 ඉලක්කය | 2014.12.31 දිනට | | | |
|---|---|---|---|---|---|---|
| | | | භෞතික ප්‍රගතිය | % | මූල්‍ය ප්‍රගතිය (රු.මි) | % |
| **1.1** කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය යටතේ දිස්ත්‍රික්ක 18 ක අක්කර 4500 ක නව වගාව<br>දිස්ත්‍රික්කය — බද්ධ (අක්කර) — බීජ (අක්කර)<br>1. පුත්තලම 450 -<br>2. කුරුණෑගල 450 -<br>3. හම්බන්තොට 275 -<br>4. අනුරාධපුරය 400 -<br>5. අම්පාර - 400<br>6. බදුල්ල 125 -<br>7. මහනුවර 25 -<br>8. රත්නපුර 25 -<br>9. මාතලේ 175 -<br>10. පොළොන්නරුව 125 -<br>11. මොණරාගල 300 -<br>12. මඩකලපුව 50 450<br>13. ත්‍රිකුණාමලය 50 450<br>14. වවුනියා 25 150<br>15. මන්නාරම - 150<br>16. මුලතිවු 25 200<br>17. කිලිනොච්චි - 150<br>18. යාපනය - 50<br>එකතුව 2500 2000 | 4.5 (ඒකාබද්ධ අරමුදල ) | භෞතික ඉලක්කය<br><br>වගාව සඳහා මුලික ඉඩම් සැකසීම හා ගොවි ඉඩම්වල පැළ සිටුවීම | භෞතික ප්‍රගතිය<br>බද්ධ කජු වගාව සඳහා අක්. 2230 ක් හා ගොවි පවුල් 2554 ක් තෝරා ගෙන ඇත. බීජ කජු වගාව සඳහා අක්. 1554 ක් හා ගොවි පවුල් 1843 ක් තෝරාගෙන ඇත.<br><br>අක්. 2200 ක බද්ධ කජු සහ අක්. 2000 ක බීජ කජු වගාකර ඇත. | 95 | මූ.ඉ. - 4.5<br>ප්‍රගතිය<br>- - | - |
| **1.2** සහනාධාර කජු වගා යෝජනා ක්‍රමය සඳහා පැළ නිෂ්පාදනය කිරීම<br>පැළ තවාන — දිස්ත්‍රික්කය<br>1. කමන්දළුව — පුත්තලම<br>2. දඹුල්ල — මාතලේ<br>3. මිහින්තලේ — අනුරාධපුර<br>4. හාඩි — මඩකලපුව<br>5. මහියංගණය — බදුල්ල<br>6. කුඹුක්කන — මොණරාගල<br>7. චන්ද්‍රිකාවැව — රත්නපුර | 20.5 (ඒකාබද්ධ අරමුදල ) | බද්ධ කජු අක්. 2500 ක් හා බීජ කජු අක්. 2000 ක් වගා කිරීම සඳහා අවශ්‍ය බද්ධ පැළ 200000 ක් සහ බීජ පැළ 80000 ක් නිෂ්පාදනය. | 1.බද්ධ පැළ 398152 ක් හා බීජ පැළ 80000 ක් නිෂ්පාදනය.<br>2.සහනාධාර යෝජනා ක්‍රමය සඳහා බද්ධ පැළ 176040 ක් හා බීජ පැළ 87358 ක් නිකුත් කිරීම. | 90 | මූ.ඉ - 20.5<br>ප්‍රගතිය- 22.75 | 111 |

| වැඩසටහන | 2014 ප්‍රතිපාදන (රු.මි) | ඉලක්කය | 2014.12.31 දිනට | | | |
|---|---|---|---|---|---|---|
| | | | භෞතික ප්‍රගතිය | % | මූල්‍ය ප්‍රගතිය රු. මි. | % |
| 2 සංස්ථාවේ ශාක අභිජනන මධ්‍යස්ථාන සංවර්ධනය<br>ශා.අ.ම<br>1. මහඔය ( අක්කර 75) අම්පාර දිස්ත්‍රික්කය<br>2. සුදුවතුරආර (අක්කර 50) මොණරාගල දිස්ත්‍රික්කය<br>3. නාලන්ද( අක්කර 75) මාතලේ දිස්ත්‍රික්කය<br>4. විලච්චිය( අක්කර 25) අනුරාධපුරය දිස්ත්‍රික්කය<br>5. මාණ්කර්නි (අක්කර 200) මඩකලපුව දිස්ත්‍රික්කය<br>6. ඔයාමඩුව (අක්කර 200) අනුරාධපුරය දිස්ත්‍රික්කය | 10.0 (ඒකාබද්ධ අරමුදල ) | භෞතික ඉලක්කය<br>වල් මර්ධනය හා කජු අස්වැන්න ලබාගැනීම පැළ නිෂ්පාදනය සඳහා අවශ්‍ය මව්බීජ හා රිකිලි ලබාගැනීම | ශාක අභිජනන මධ්‍යස්ථාන වලින් මවුබීජ මිලියන 1.3 ක් ලබාගන්නා ලදී බද්ධ කිරීම සඳහා රිකිලි 200000 ක් ලබාගෙන ඇත. | 80 | මූ.ඉ - 10.0<br>ප්‍රගතිය- 5.8 | 58 |
| 3 සංස්ථා වතුයායන්වල අළුතින් කජු වගාකිරීම<br>වතුයාය අක්කර<br>1. කොණ්ඩච්චි 200 (සිවිල් ආරක්‍ෂක දෙපාර්තමේන්තුව)<br>2. මාන්කර්ණි 100 (සිවිල් ආරක්‍ෂක දෙපාර්තමේන්තුව)<br>3. කොණ්ඩච්චි 100<br>400 | 3.5 (ඒකාබද්ධ අරමුදල ) | භෞතික ඉලක්කය<br>නව කජු වගාව අක්කර 400 ක් වගා කිරීම | • කොණ්ඩච්චි වතුයායේ සිවිල් ආරක්ෂක දෙපා. විසින් අක්. 200 ක නව වගාව.<br>• මාන්කර්ණි වතුයායේ අක්. 100 ක ඉඩම වගාවට සුදානම් කිරීම/ පැළ සිටුවීම ආරම්භ කර ඇත.<br>• කොණ්ඩච්චි වතුයායේ සංස්ථාව විසින් අක්. 80 ක කැළය එලිකර දැනට අක්.30 ක කජු වගාව. | | මූ.ඉ - 3.5<br>ප්‍රගතිය - 3.5 | 100 |
| 4.අලෙවි ප්‍රවර්ධනය<br>i) දේශීය වෙළඳපොල ප්‍රසාරණය කිරීම<br>II) වෙළඳ පොලට නව නිෂ්පාදන හඳුන්වාදීම<br>III) ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන වලට සහභාගීවීම හා ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>IV) ' දැයට කිරුළ ' ජාතික ප්‍රදර්ශනයට සහභාගී වීම. | 1.5 (ඒකාබද්ධ අරමුදල ) | ★ වරලත් අලෙවි ජාලය පුළුල් කිරීම<br>★ වෙළඳපොලට නව නිෂ්පාදන 04 ක් හඳුන්වාදීම<br>★ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගීවීම<br>★ ප්‍රදර්ශන කුටියක් නිර්මාණය කිරීම හා ප්‍රදර්ශනයට සහභාගිවීම. | • නව නිෂ්පාදන 04 ක් වෙළඳපොලට හඳුන්වාදී ඇත.<br>• නව වරලත් අලෙවිසල් 09 ක් ආරම්භකර ඇත.<br>• කුලියාපිටියේ පැවති දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සහභාගී විය. | 100 | මූ.ඉ - 1.5<br>ප්‍රගතිය - 0.5 | 33 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **5.**පසු අස්වනු තාක්ෂණය වැඩිදියුණු කිරීම | **1.5** (ඒකාබද්ධ අරමුදල ) | <u>භෞතික ඉලක්කය</u><br>i) කජු පිරිසැකසුම් කර්මාන්තය සඳහා ප්‍රමිති තත්ත්වයන් හඳුන්වා දීම<br>ii) පෞද්ගලික පිරිසැකසුම් කරුවන් හා ව්‍යවසායකයන් හට පිරිසැකසුම් කරණය, අගය එකතුකිරීම සහ ඇසුරුම්කරණය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම<br>iii) යන්ත්‍ර සූත්‍ර සංවර්ධනය<br>iV) තත්ත්ව පාලන කටයුතු කිරීම සඳහා පර්යේෂණාගාරයක් ස්ථාපිත කිරීම | i) පුත්තලම හා නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයන් හි යන්ත්‍ර හා පිරියත අළුත්වැඩියා කරන ලදී.<br>ii) තත්ත්ව පාලන අංශයක් ස්ථාපිත කරන ලදී .<br>iii) ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේදයන් (GMP) භාවිතා කරනු ලබයි. | **100** | <u>**මු.ඉ - 1.5**</u><br>**ප්‍රගතිය - 0.038** | 2.5 |
| **6.**පර්යේෂණ හා සංවර්ධනය නව ප්‍රභේද හඳුන්වාදීම, පොහොර භාවිතය, පළිබෝධ මර්ධනය, පැළ සනත්වය, බද්ධ හා බීජ වගාවන්, අස්වැන්න, අතුරු බෝග පිළිබඳ පර්යේෂණ සිදුකිරීම | **3.0** (ඒකාබද්ධ අරමුදල ) | <u>භෞතික ඉලක්කය</u><br>පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම | වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිළි කලමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ වැඩසටහන් අඛණ්ඩව සිදුකෙරේ. | **100** | <u>**මු.ඉ - 3.0**</u><br>**ප්‍රගතිය- 2.42** | 81 |

| වැඩසටහන | 2014 ප්‍රතිපාදන මුදල (රු.මි) | ඉලක්කය | 2014.12.31 දිනට | | | |
|---|---|---|---|---|---|---|
| | | | භෞතික ප්‍රගතිය | % | මූල්‍ය ප්‍රගතිය රු. මි. | % |
| **7.** කජු වගාවේ පළිබෝධ මර්ධනය හා ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතය **( GAP)** පිළිබඳ වැඩසටහන් | **0.5** (ඒකාබද්ධ අරමුදල ) | <u>භෞතික ඉලක්කය</u> ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතයෙන් ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් පැවැත්වීම | ★ දිස්ත්‍රික්ක 18 ක් ආවරණය වන පරිදි පළිබෝධ මර්ධනය පිළිබඳව පෝස්ටර් මඟින් ගොවීන් දැනුවත් කිරීම සඳහා වැඩසටහනක් පවත්වන ලදී.<br>★ ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අනුග්‍රහය මත ඵලදායිතාවය ඉහළ නැංවීමේ ගොවි වැඩමුළු 10 ක් දිස්ත්‍රික්ක 10 ක පවත්වන ලදී. මේ සඳහා කුඩා කජු ඉඩම් හිමියන් 350 ක් සහභාගී විය. | **100** | <u>**මු.ඉ - 0.5**</u><br>ප්‍රගතිය - **0.2** | 40 |
| **8.**මානව සම්පත් සංවර්ධනය | **1.0** (ඒකාබද්ධ අරමුදල ) | <u>භෞතික ඉලක්කය</u> සේවාස්ථ පුහුණු වැඩසටහන්, කුසලතා සංවර්ධන වැඩසටහන්, වැඩමුළු තුළින් වෘත්තිය හැකියාවන් ඉහල නැංවීම | ● කජු පැළ බද්ධකිරීමේ තාක්ෂණ ක්‍රමවේද හඳුන්වාදීම හා පුහුණු කිරීමේ වැඩසටහනක් මහියංගණය මධ්‍යම පැළ තවානේ පැවැත්වීම. දිස්ත්‍රික්ක 06 ක පුහුණුලාභීන් 14 ක් මේ සඳහා සහභාගි විය.<br>● කාර්යය මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන්ගේ වෘත්තිය කුසලතාවයන් සංවර්ධනය කිරීම පිණිස පුහුණු වැඩසටහන්වලට සහභාගී කරවන ලදී. | 100 | <u>**මු.ඉ - 1.0**</u><br>ප්‍රගතිය- **0.55** | 55 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **9.**ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම<br><br>**I.** වාහනවල අළුත්වැඩියාවන් සිදුකිරීම<br>**II.** ගොඩනැගිලිවල අළුත්වැඩියාවන් කිරීම | **4.0**<br>(ඒකාබද්ධ අරමුදල ) | <u>භෞතික ඉලක්කය</u><br>**I .** වාහන සංචිතයේ අවශ්‍ය අළුත්වැඩියාවන් සිදුකිරීම<br><br>**II.** පුත්තලම ප්‍රාදේශීය කාර්යාලයේ නිල නිවස අළුත්වැඩියා සිදුකිරීම | වාහන සංචිතයේ අවශ්‍ය අළුත් වැඩියාවන් සිදුකර ඇත.<br><br>පුත්තලම ප්‍රාදේශීය කාර්යාලය හා නිල නිවස අළුත්වැඩියා කිරීම වයඹ පළාත් සභාවේ ඉංජිනේරු සේවා දෙපාර්ත මේන්තුව මඟින් සිදුකර ඇත. | **100** | <u>මු.ඉ -</u><br><u>**4.0**</u><br>ප්‍රගතිය-<br>**4.317** | 108 |

## **7.10.2** <u>විශේෂ සංවර්ධන වැඩසටහන්</u>

| වැඩසටහන | **2014** වර්ෂයේ ප්‍රතිපාදන මුදල (රු.මි) | ඉලක්කය | **2014.12.31** දිනට | | | |
|---|---|---|---|---|---|---|
| | | | භෞතික ප්‍රගතිය | % | මූල්‍ය ප්‍රගතිය රු. මි. | % |
| **1.**' දිවි නැගුම' ජාතික සංවර්ධන වැඩසටහන යටතේ බීජ පැළ සහ බද්ධ පැළ නිෂ්පාදනය කිරීම | 49.0<br>' දිවි නැගුම' අරමුදල | <u>භෞතික ඉලක්කය</u><br>බද්ධ පැළ **183,093** ක් නිෂ්පාදනය කිරීම බීජ පැළ **118,236** ක් නිෂ්පාදනය කිරීම | දිස්ත්‍රික්ක **13** ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස **41** ක් සඳහා බද්ධ පැළ **164,521** ක් හා බීජ පැළ **95,111** ක් නිකුත්කර ඇත. | **90** | <u>මු.ඉ -</u><br>**49.0**<br>ප්‍රගතිය-<br>**38.0** | **78** |

## 7.10.3වාණිජ වැඩසටහන්

| වැඩසටහන | 2014 ප්‍රතිපාදන රු. මි | ඉලක්කය | 2014.12.31 දිනට භෞතික ප්‍රගතිය | % | මූල්‍ය ප්‍රගතිය රු.මි. | % |
|---|---|---|---|---|---|---|
| 1.1 ගොවින්ගෙන් ලෙලි කජු මිලට ගැනිම | 55.0 උපයාගත් අරමුදල් | භෞතික ඉලක්කය ගොවින්ගෙන් ලෙලි කජු මෙට්‍රික් ටොන් 100 ක් මිලට ගැනිම | ගොවින්ගෙන් ලෙලි කජු මෙ.ටො. 81.0 ක් මිලට ගෙන ඇත කජු මද මෙ.ටො.3.5 ක් මිලට ගෙන ඇත. | 81 | මූ.ඉ - 55.0 ප්‍රගතිය - 37.0 | 67 |
| 1.2 පිරිසැකසුම් ක්‍රියාවලිය, ප්‍රමිතිකරණය, අගය එකතුකිරීම, ඇසුරුම් කිරීම හා අලෙවිය<br>i) පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානය<br>ii) නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය | 19.8 උපයාග ත් අරමුදල් | භෞතික ඉලක්කය කජු මද නිෂ්පාදනය හා අලෙවිය | පිරිසැකසුම් කල, අගය එකතු කල කජු මද මෙට්‍රික් ටොන් 26.32ක් දෙසැම්බර් මස අවසානය වනවිට අලෙවිකර ඇත. උපයාගත් ආදායම රු.මි 64.0 කි | 80 | මූ.ඉ - 19.8 ප්‍රගතිය - 15.8 | 80 |
| 1.3 පුත්තලම කජු වයින් නිෂ්පාදනාගාරයේ කජු වයින් නිෂ්පාදනය සහ උපකරණ මිලදී ගැනීම | 3.5 උපයාග ත් අරමුදල් | භෞතික ඉලක්කය නිෂ්පාදිත වයින්වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරිම | වයින් බෝතල් 1500 ක ගුණාත්මකභාවය වැඩිදියුණු කර ඇත. | 80 | මූ.ඉ - 3.5 ප්‍රගතිය - 0.086 | 2.4 |
| 2. ඵලදායිතා ප්‍රවර්ධනය සංස්ථා වතුයායන්වල වගා පුනරුත්ථාපනය හා සංවර්ධන කටයුතු සිදුකිරීම<br><br>වතුයාය — අක්කර<br>1. හාඩි — 365<br>2. පුත්තලම — 955<br>3. කමන්දළුව — 550<br>4. එළුවන්කුලම — 200<br>එකතුව — 2070 | 30.25 උපයාග ත් අරමුදල් | භෞතික ඉලක්කය අස්වැන්න ලබාගැනීම සහ ඵලදායිතාවය වැඩිදියුණු කිරිම | කමන්දළුව, එළුවන්කුලම, පුත්තලම හා හාඩි වතු යායන්වල මෙ. ටො. 105 ක කජු අස්වැන්නක් අගෝස්තු මස අවසානයේදි ලබාගෙන ඇත. වතුයායන්වල අක්කර 2300 ක වල් මර්ධනය කර ඇත. | 70 | මූ.ඉ - 30.25 ප්‍රගතිය - 20.3 | 67 |

| වැඩසටහන | 2014 ප්‍රතිපාදන රු. මි | ඉලක්කය | 2014.12.31 දිනට | | | |
|---|---|---|---|---|---|---|
| | | | භෞතික ප්‍රගතිය | % | මූල්‍ය ප්‍රගතිය රු.මි. | % |
| **3.**ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම<br>★ වාහන මිලදී ගැනිම | **27.0**<br>උපයාගත් අරමුදල් | <u>භෞතික ඉලක්කය</u><br>මෝටර් බයිසිකල් **30,** ජීප් රථයක්, ලොරියක් මිලදී ගැනීම | මෝටර් බයිසිකල් **30,** ජීප් රථයක්, ලොරියක් මිලදී ගෙන ඇත. | **100** | <u>මු.ඉ - 27.0</u><br>ප්‍රගතිය - 22.5 | **83** |
| **4.**ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම<br>★ ගොඩනැගිලි ඉදිකිරීම<br>★ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම<br>★ යන්ත්‍ර හා පිරියත | **7.0**<br>උපයාගත් අරමුදල් | <u>භෞතික ඉලක්කය</u><br>★ ප්‍රධාන කාර්යාලයට සහ ප්‍රාදේශීය කාර්යාලවලට ගෘහභාණ්ඩ සහ උපකරණ මිලදී ගැනීම<br>★ වතුයායන් සඳහා කෘෂි උපකරණ ලබාදීම | කමන්දළුව වතුයාය සඳහා වතුර මෝටරයක් මිලදීගෙන ඇත.<br><br>පුත්තලම වතුයායේ නිලධාරි නිවාස **02** ක වහල අළුත්වැඩියාකර ඇත.<br><br>මිහින්තලේ පැළ තවානේ වැට හා සනීපාරක්ෂක පහසුකම් ඉදිකිරීම නිමකර ඇත.<br><br>චන්ද්‍රිකාවැව තවානේ ළිඳ බැඳීම සිදුකර ඇත. | **80** | <u>මු.ඉ - 7.0</u><br>ප්‍රගතිය - 0.5 | **7** |

## 7.11 ජාතික පොහොර ලේකම් කාර්යාලය

**1988** අංක **68** දරන පොහොර විධිමත් කිරීමේ පනත යටතේ නෛතික බලතල ජාතික පොහොර ලේකම් කාර්යාලයට පැවරී ඇති අතර, ශ්‍රී ලංකාවේ වගා කරන සියලුම බෝග සඳහා විද්‍යානුකූලව නිර්දේශ කර ඇති රසායනික හා කාබනික පොහොර නියමිත ප්‍රමිතියෙන් යුක්තව සම්පාදනය හා භාවිතය තහවුරු වී තිබීම ජාතික පොහොර ලේකම් කාර්යාලයේ ඉදිරි දැක්ම ලෙස හඳුනාගෙන තිබේ.

පොහොර විධිමත් කිරීමේ පනතේ විධිවිධාන අනුව ජාතික පොහොර ප්‍රතිපත්ති සම්පාදනය සඳහා තොරතුරු හා නිර්දේශ ලබා දීම, පොහොර වල ප්‍රමිති තත්ත්වයන් හා භාවිතය නිර්දේශ ප්‍රකාශයට පත් කිරීම, පොහොර ඇසිරීමේ කාර්යයන් නියමානුකූල කිරීම, පොහොර ආනයනයන්, සැකසීම්, බෙදාහැරීම් හා තොග තත්ත්වයන් නියාමනය කිරීම, පොහොර අවශ්‍යතාවය හඳුනාගැනීම හා බෙදාහැරීම විධිමත් කිරීම, රජයේ පොහොර සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයන් සැකසීම, පොහොර භාවිතය පිළබඳ ක්ෂේත්‍රයේ අක්‍රමිකතාවයන් වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගැනීම හා පොහොර භාවිතයේ දත්ත පද්ධතියක් යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යාම වැනි පුළුල් ජාතික මෙහෙවරක ජාතික පොහොර ලේකම් කාර්යාලය යෙදී සිටී.

**1988** අංක **68** දරන පොහොර විධිමත් කිරීමේ පනත විධිමත්ව ක්‍රියාත්මක කිරීම, විද්‍යානුකූල පොහොර නිර්දේශයන් පදනම් කරගනිමින් පොහොර අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගැනීම, පොහොර අවශ්‍යතාවය නිවැරදි වේලාවට සපුරා දීම තහවුරු කිරීම, පොහොර වල ප්‍රමිතිය හා ගුණාත්මකභාවය තහවුරු කිරීම, ඒ ඒ බෝග සඳහා නිර්දේශිත පොහොර භාවිතය විධිමත් කිරීම, රජයේ පොහොර සහනාධාර වැඩසටහන විධිමත්ව ක්‍රියාත්මක කිරීම, පොහොර සම්බන්ධ කාර්යයන්හි නියුතු ආයතනවල කාර්යයන් විධිමත් කිරීම සඳහා ආයතන ශක්තිමත් කිරීම, පොහොර භාවිතයේ අක්‍රමිකතාවයන් අවම කිරීම හා පොහොර පිළිබඳ නිල තොරතුරු ප්‍රකාශයට පත් කිරීම අරමුණු කර ගනිමින් ජාතික පොහොර ලේකම් කාර්යාලය සිය කාර්යභාරය මෙහෙයවනු ලැබේ.

ජාතික පොහොර ලේකම් කාර්යාලයේ ඒ ඒ අංශ හා දිස්ත්‍රික් කාර්යාල විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා **2014. 12. 31** දිනට ලබා ඇති ප්‍රගතිය පහත දක්වා ඇත.

### 1. තාක්ෂණික හා සංවර්ධන අංශය

**2014. 12. 31 දිනට තත්ත්ව විශ්ලේෂණය කරන ලද පොහොර ප්‍රමාණය (මෙ.ටො)**

| පොහොර වර්ගය | එකතුව | පොහොර වර්ගය | එකතුව |
|---|---|---|---|
| යූරියා | **417,796.98** | දියර පොහොර (ලීටර්) | **8,854.00** |
| මියුරියෙට් ඔෆ් පොටෑෂ් | **150,147.27** | කැල්සියම් නයිට්‍රේට් | **609.00** |
| ත්‍රිත්ව සුපිරි පොස්පේට් | **95,886.25** | ඇන්හයිඩ්‍රස් මැග්නීසියම් සල්පේට් | **20.00** |
| ඇමෝනියම් සල්පේට් | **81,265.92** | බෝරේට් | **240.00** |
| කීසරයිට් | **9,417.95** | සල්පර් බෙන්ටොනයිට් | **373.00** |
| සින්ක් සල්පේට් | **1,034.00** | මැග්නීසියම් නයිට්‍රේට් | **12.53** |
| ඩයි ඇමෝනියම් පොස්පේට් | **2,119.40** | මැග්නීසියම් සල්පේට් මොනොහයිඩ්රේට් | **138.00** |
| කැල්සියම් ඇමෝනියම් නයිට්‍රේට් | **50.00** | මුහුදු පැළෑටි නිස්සාරකය (Seaweed) | **20.60** |
| එප්සම් සෝල්ට් | **534.00** | මිශ්‍ර පොහොර | **287,352.00** |

## 2. ආර්ථික විශ්ලේෂණ හා බෙදා හැරීමේ අංශය

- **2014 යල කන්නය සඳහා වී වගා කරන භූමි ප්‍රමාණය හා පොහොර නිර්දේශ පදනම් කර ගනිමින් පොහොර අවශ්‍යතාවය බෙදාහැරීම මේ වන විට අවසන් කර ඇත. 2014/2015 යල කන්නය සඳහා වී වගා කරන භූමි ප්‍රමාණය හා පොහොර නිර්දේශ පදනම් කර ගනිමින් පොහොර අවශ්‍යතාවය තක්සේරු කර බෙදා හැරීම අවසන් කර තිබේ.**

**2014 යල කන්නය**

| කාරණය | මහා වාරි මාර්ග | සුළු වාරි මාර්ග | වර්ෂාපෝෂිත | එකතුව |
|---|---|---|---|---|
| වගා ඉලක්ක (හෙක්) | **304,562** | **146,420** | **90,529** | **541,511** |

| කාරණය | යූරියා (මෙ.ටො) | ටී.එස්.පී (මෙ.ටො) | එම්.ඕ.පී (මෙ.ටො) | එකතුව (මෙ.ටො) |
|---|---|---|---|---|
| පොහොර අවශ්‍යතාවය | **103,805** | **26087** | **32292** | **162184** |
| පොහොර බෙදා හැරීම | **58897** | **14449** | **17349** | **90695** |

**2014/15 මහ කන්නය**

| කාරණය | මහා වාරි මාර්ග | සුළු වාරි මාර්ග | වර්ෂාපෝෂිත | එකතුව |
|---|---|---|---|---|
| වගා ඉලක්ක (හෙක්) | **347048** | **200549** | **214258** | **761856** |

| කාරණය | යූරියා (මෙ.ටො) | ටී.එස්.පී (මෙ.ටො) | එම්.ඕ.පී (මෙ.ටො) | එකතුව (මෙ.ටො) |
|---|---|---|---|---|
| පොහොර අවශ්‍යතාවය | **142700** | **35510** | **44000** | **222216** |
| පොහොර බෙදා හැරීම | **117340** | **28467** | **34567** | **180374** |

- පැවති අයහපත් කාලගුණය නිසා 2014 යල කන්නයේ අපේක්ෂිත වගා භූමි ප්‍රමාණය වගා කිරීමට නොහැකි වූ හෙයින් අපේක්ෂිත පොහොර බෙදාහැරීමේ ඉලක්ක සපුරාලීමට නොහැකි විය.

- **2014 ජූලි 30 දිනට රජයේ ගොවිපළ හා රාජ්‍ය ආයතන සතු කුඹුරු ඉඩම් වල වී වගාව සඳහා ද සහනාධාර මත පොහොර සැපයීම පහත පරිදි වේ. (මෙම පොහොර ඇමඳුම් පොහොර වලින් ලබා දී ඇත.)**

**2014 යල කන්නය**

| වගා ඉලක්කය (හෙක්) | යූරියා (මෙ.ටො) | ටී.එස්.පී (මෙ.ටො) | එම්.ඕ.පී (මෙ.ටො) | එකතුව (මෙ.ටො) |
|---|---|---|---|---|
| **3688.9** | **-** | **-** | **-** | **2058.18** |

**2014/ 2015 මහ කන්නය**

| වගා ඉලක්කය (හෙක්) | යූරියා (මෙ.ටො) | ටී.එස්.පී (මෙ.ටො) | එම්.ඕ.පී (මෙ.ටො) | එකතුව (මෙ.ටො) |
|---|---|---|---|---|
| **1,340.05** | **790,064.00** | **52,647.00** | **59,234.00** | **901,945.00** |

## 3. පොහොර ආනයනය හා තොග පාලන අංශය

- **1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනත සංශෝධනයට පොහොර උපදේශන සභාවට යොමු කර ඇත.**
- **පොහොර ව්‍යවසායකත්ව කාර්යයන් සඳහා නව බලපත්‍ර නිකුත් කිරීම හා පැරණි බලපත්‍ර අලුත් කිරීම මනා පසු විපරමක් යටතේ ක්‍රියාත්මකව ඇත.**

| ආනයනය | | | | සකස් කිරීම | | | |
|---|---|---|---|---|---|---|---|
| නව බලපත්‍ර | | අලුත් කිරීම් | | නව බලපත්‍ර | | අලුත් කිරීම් | |
| ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
| **23** | **20** | **56** | **52** | **05** | **-** | **24** | **20** |

| නිෂ්පාදන | | | | බෙදාහැරීම සහ අලෙවි කිරීම | | | |
|---|---|---|---|---|---|---|---|
| නව බලපත්‍ර | | අලුත් කිරීම් | | නව බලපත්‍ර | | අලුත් කිරීම් | |
| ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
| **01** | **01** | **05** | **03** | **100** | **88** | **195** | **47** |

- **නව බලපත්‍ර නිකුත් කිරීම මඟින් රුපියල් 500,000ක් සහ පැවති බලපත්‍ර අලුත්කිරීම මඟින් 1,470,000 ලෙස අයකර රජයේ ගිණුමට බැර කර තිබේ.**
- **පොහොර උපදේශන කමිටු රැස්වීම ජනවාරි, අප්‍රේල් සහ ජූලි මාස වල පවත්වා ඇත.**
- **රාජ්‍ය පොහොර සමාගම් සතු වී පොහොර තොග තත්ත්වය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| කාරණය | යූරියා (මෙ.ටො) | ටී.එස්.පී (මෙ.ටො) | එම්.ඕ.පී (මෙ.ටො) |
|---|---|---|---|
| **2014. 01. 01 දිනට පැවති තොග තත්ත්වය** | **19,413.24** | **6,242.65** | **12,214.79** |
| **2014 වසරේ දෙසැම්බර් දක්වා ආනයනය හා අනෙකුත් ලැබීම්** | **214,652.06** | **49,913.25** | **52,047.75** |
| **2014. 12. 31 දක්වා බෙදාහැරීම් (වී හා අනෙකුත් බෝග)** | **201,982.49** | **48,419.67** | **58,515.93** |
| **2014. 12. 31 දිනට තොග තත්ත්වය** | **32,082.81** | **7,736.23** | **5,746.61** |

- පෞද්ගලික පොහොර සමාගම් සතු තොග තත්ත්වය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| කාරණය | යූරියා (මෙ.ටො) | ටී.එස්.පී (මෙ.ටො) | එම්.ඕ.පී (මෙ.ටො) |
|---|---|---|---|
| **2014. 01. 01** දිනට පැවති තොග තත්ත්වය | **11,885** | **3,431** | **17,431** |
| **2014** වසරේ දෙසැම්බර් දක්වා ආනයනය හා අනෙකුත් ලැබීම් | **100,315.0** | **23,575.0** | **76,755.0** |
| **2014. 12. 31** දක්වා බෙදාහැරීම් (වී හා අනෙකුත් බෝග) | **98,965.6** | **26,900.0** | **89,910.0** |
| **2014. 12. 31** දිනට තොග තත්ත්වය | **13,234.4** | **106.0** | **4,276.0** |

- පොහොර සහනාධාර වැඩසටහන යටතේ ගෙවීම් විස්තර පහත දක්වා ඇත.

| කාරණය | ගෙවන ලද මුදල **2014.12. 31** දිනට (රු.මි.) |
|---|---|
| වී පොහොර සහනාධාරය සඳහා | **15,170.75** |
| වෙනත් කෘෂි හා වැවිලි බෝග සඳහා | **17,739.79** |
| එකතුව | **32,910.54** |

- පොහොර ප්‍රසම්පාදනයට අදාළව පහත සඳහන් කමිටු රැස්වීම පවත්වා සිය කාර්යභාරය ඉටු කර ඇත.

| කමිටුව | රැස්වීම් ගණන |
|---|---|
| අමාත්‍ය මණ්ඩලය පත් කල ස්ථාවර ප්‍රසම්පාදන සැලසුම් කමිටුව | **03** |
| එක් එක් කාර්තුව සඳහා පොහොර වාණිජ මිල තීරණය කිරීමේ කමිටුව | **03** |

- **2014. 12. 31** දින වන විට ආනයනය කිරීමට සැලසුම් කරන ලද පොහොර පාංශු **(Quota)** පහත දැක්වේ.

| පොහොර වර්ගය | වාර්ෂික පොහොර අවශ්‍යතාවය (මෙ.ටො) |
|---|---|
| යූරියා | **269,610** |
| ටී.එස්.පී | **51,800** |
| එම්.ඕ.පී | **108,624** |

- **2014** වර්ෂය සඳහා පොහොර සහනාධාරය වෙනුවෙන් ඇස්තමේන්තු කරන ලද මුදල රු.බිලියන **38**කි.

# ජාතික පොහොර ලේකම් කාර්යාලයේ මෙහෙයවීමෙන් 2014.01.01 සිට 2014.12.31 දක්වා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන් වල ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | ක්ෂේත්‍ර දින | සායන | ගබඩා පරීක්ෂාව හා තොග සත්‍යාපනය | පාංශු පරීක්ෂාව | වියදම් (රු.) |
|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 09 | 435 | 765 | 420 | - | |
| 1. කොළඹ | - | 300 | - | - | 20 | 93,486 |
| 2. ගම්පහ | 05 | 250 | 05 | 22 | 86 | 132,524 |
| 3. කළුතර | 12 | 345 | 14 | 48 | 86 | 142,755 |
| 4. ගාල්ල | 08 | 506 | 25 | 90 | 12 | 153,097 |
| 5. මාතර | 09 | 400 | 25 | 26 | 19 | 110,507 |
| 6.හම්බන්තොට | 05 | - | 24 | - | 12 | 68,441 |
| 7. රත්නපුර | 17 | 1050 | 16 | 72 | 09 | 126,206 |
| 8.කෑගල්ල | 08 | 449 | 01 | 58 | 25 | 128,594 |
| 9. මහනුවර | 10 | 1030 | 26 | 74 | 06 | 187,435 |
| 10. නුවර එළිය | 09 | 500 | 36 | 96 | 16 | 98,965 |
| 11. මාතලේ | 06 | 350 | 02 | 34 | - | 152,305 |
| 12.කුරුණෑගල | 32 | 265 | 69 | 36 | 16 | 115,930 |
| 13.පුත්තලම | 04 | 240 | 4 | 20 | 03 | 159,555 |
| 14. අනුරාධපුර | 06 | 371 | 16 | 39 | 25 | 146,185 |
| 15. පොළොන්නරුව | 08 | 756 | 06 | 18 | 03 | |
| 16. අම්පාර | 04 | 239 | 20 | 32 | - | 94,342 |
| 17. ත්‍රිකුණාමලය | 13 | - | - | - | 20 | 137,661 |
| 18. මඩකළපුව | - | - | - | - | - | - |
| 19. බදුල්ල | 05 | 250 | 20 | 35 | 30 | 184,000 |
| 20. මොණරාගල | 03 | 2000 | 10 | 48 | - | 101,743 |
| 21. වව්නියාව | 03 | 150 | - | 02 | - | |
| මුළු එකතුව | 156 | 6245 | 313 | 730 | 364 | 2,333,731 |

## 7.12 සී/ස ලංකා පොහොර සමාගම

| ව්‍යාපෘතිය/ වැඩසටහන | ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක ප්‍රදේශය | 2014 වෙන්කල ප්‍රතිපාදන රු.මි. | ඉලක්කය (T) / ප්‍රගතිය (P) | කාර්තුමය මූල්‍ය ඉලක්කය (රු.මි.) හා ප්‍රගතිය (සමුච්චිත අගය) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 1 කාර්තුව | 2 කාර්තුව | 3 කාර්තුව | 4 කාර්තුව |
| පොහොර ආනයනය හා බෙදාහැරීම | සහනාධාර වී පොහොර බෙදාහැරීම | මුළු දිවයින පුරා | 16,063.22 | (T) | 1,177.01 | 5,768.02 | 503.60 | 8,614.59 |
| | | | | (P) | 687.63 | 3453.14 | 421.07 | 7425.84 |
| පොහොර ආනයනය, මෙරටින් මිලදිගැනිම හා මිශ්‍ර/ අමිශ්‍ර ලෙස පොහොර බෙදාහැරීම | අනෙකුත් බෝග සඳහා සහනාධාර පොහොර බෙදාහැරීම | | 6,949.54 | (T) | 1,413.31 | 1,419.80 | 1,266.28 | 2,850.15 |
| | | | | (P) | 1,019.26 | 1,861.46 | 1,644.19 | 2,176.71 |

| ව්‍යාපෘතිය/ වැඩසටහන | ක්‍රියාකාරකම් | ක්‍රියාත්මක ප්‍රදේශය | 2014 වෙන්කල ප්‍රතිපාදන රු.මි. | ඉලක්කය (T) / ප්‍රගතිය (P) | කාර්තුමය භෞතික ඉලක්කය හා ප්‍රගතිය (සමුච්චිත අගය) | | | | සමස්ත භෞතික ඉලක්කය මෙ.ටො. |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 1 කාර්තුව | 2 කාර්තුව | 3 කාර්තුව | 4 කාර්තුව | |
| පොහොර ආනයනය හා බෙදාහැරීම. | සහනාධාර වී පොහොර බෙදාහැරීම | මුළු දිවයින පුරා | 16,063.22 | (T) | 18,595.00 | 90,495.00 | 7,878.00 | 136,323.00 | 253,291 |
| | | | | (P) | 10,829.30 | 54,391.34 | 6,635.25 | 116,908.60 | 188,764 |
| පොහොර ආනයනය, මෙරටින් මිලදිගැනිම හා මිශ්‍ර/ අමිශ්‍ර ලෙස පොහොර බෙදාහැරීම. | අනෙකුත් බෝග සඳහා සහනාධාර පොහොර බෙදාහැරීම | | 6,949.54 | (T) | 25,238.00 | 24,182.00 | 22,504.00 | 47,364.00 | 119,288 |
| | | | | (P) | 17,782.14 | 30,000.77 | 26,453.11 | 36,825.91 | 111,062 |

## 2014 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති වැඩසටහන් වල ප්‍රගතිය

- නුවරඑළිය ප්‍රාදේශීය පොහොර ගබඩා පරිශ්‍රය තුළ නිවාඩු නිකේතනයක් ඉදිකිරීම 2014 මැයි මස දී ආරම්භ කරන ලද අතර, එහි වැඩකටයුතු සිදුකරමින් පවති .





- කතරගම ප්‍රදේශයේද සේවකමහතුන්ගේ හා බාහිර පාර්ශවයන්ගේ පරිහරණය උදෙසා නිවාඩු නිකේතනයක් ඉදිකිරිම සඳහා ඉඩමක් මිලදී ගැනිම සහ ඉදිකිරිම් කටයුතු කිරිම සඳහා සැළසුම් කර තිබිම.

- ජාත්‍යන්තර මට්ටමේ සහතික ලත් රසායනාගාරයක් විවෘත කිරිම.



- ප්‍රාදේශිය පොහොර ගබඩා ප්‍රතිසංස්කරණය කර, ගබඩා ශ්‍රේණිගත කිරිම.



- කාබනික පොහොර වෙළඳපොළට හඳුන්වාදිම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති.

- අප ආයතනය ආරම්භ කර වසර 50 ස්වර්ණ ජයන්තිය සැමරිම වෙනුවෙන් නව බස් නැවතුම්පොළක් ඉදිකිරිම සහ හුණුපිටිය පාර “ලක් පොහොර ස්වර්ණ ජයන්ති මාවත” නමින් නම් කිරිම.

## 7.13 සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

**2014 වර්ෂයේ පොහොර සහනාධාර වැඩසටහන යටතේ ගොවිජනතාව වෙත පොහොර බෙදා හැරීම 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

**කිලෝ.50 පොහොර බෑගයක් රු.350/- සහනාධාර මිල යටතේ වී වගාව සඳහාද රු.1,200/- මිල යටතේ අනෙකුත් බෝග සඳහාද අදාළ වර්ෂය තුළ පහත දැක්වෙන පරිදි බෙදා හරින ලදි.**

| 2014 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වී වගාව සඳහා නිකුත් කරන ලද පොහොර ප්‍රමාණයන් | | | | |
|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | යූරියා (මෙ.ටො.) | ටී.එස්.පී. (මෙ.ටො.) | එම්.ඕ.පී (මෙ.ටො.) | එකතුව (මෙ.ටො.) |
| කොළඹ | 191 | 93 | 199 | 483 |
| ගම්පහ | 842 | 331 | 730 | 1,903 |
| කළුතර | 770 | 409 | 852 | 2,032 |
| ගාල්ල | 514 | 273 | 582 | 1,368 |
| මාතර | 771 | 315 | 690 | 1,777 |
| හම්බන්තොට | 2,711 | 648 | 695 | 4,053 |
| රත්නපුර | 1,129 | 293 | 367 | 1,789 |
| කෑගල්ල | 272 | 145 | 305 | 722 |
| මහනුවර | 393 | 127 | 236 | 756 |
| නුවරඑළිය | 356 | 97 | 134 | 587 |
| මාතලේ | 1,381 | 345 | 387 | 2,113 |
| කුරුණෑගල | 8,889 | 2,142 | 2,435 | 13,466 |
| පුත්තලම | 2,093 | 492 | 519 | 3,104 |
| අනුරාධපුර | 8,304 | 1,956 | 2,134 | 12,394 |
| පොළොන්නරුව | 5,038 | 1,167 | 1,266 | 7,472 |
| අම්පාර | 9,677 | 2,197 | 2,407 | 14,281 |
| ත්‍රිකුණාමලය | 3,718 | 852 | 948 | 5,518 |
| මඩකලපුව | 2,425 | 581 | 627 | 3,633 |
| බදුල්ල | 2,487 | 623 | 718 | 3,828 |
| මොනරාගල | 2,965 | 738 | 806 | 4,509 |
| වව්නියාව | 1,236 | 262 | 290 | 1,788 |
| කිලිනොච්චිය | 1,237 | 238 | 325 | 1,799 |
| මන්නාරම | 812 | 195 | 282 | 1,289 |
| මුලතිව් | 645 | 141 | 169 | 956 |
| එකතුව | 58,854 | 14,660 | 18,103 | 91,617 |

| 2014 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා අනෙකුත් බෝග සඳහා නිකුත් කරන ලද පොහොර ප්‍රමාණයන් | | | | | |
|---|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | යූරියා (මෙ.ටොන්) | ටී.එස්.පී. (මෙ.ටොන්) | එම්.ඕ.පී (මෙ.ටොන්) | අනෙකුත් බෝග (මෙ.ටොන්) | එකතුව (මෙ.ටොන්) |
| කොළඹ | 3,393 | 516 | 472 | 87 | 4,468 |
| ගම්පහ | 1,778 | 338 | 1,005 | 111 | 3,232 |
| කළුතර | 136 | 36 | 55 | 14 | 241 |
| ගාල්ල | 455 | 103 | 167 | 92 | 817 |
| මාතර | 1,091 | 205 | 147 | 24 | 1,467 |
| හම්බන්තොට | 1,490 | 449 | 562 | - | 2,501 |
| රත්නපුරය | 2,067 | 343 | 342 | 120 | 2,872 |
| කෑගල්ල | 1 | 1 | 1 | 0 | 3 |
| මහනුවර | 493 | 68 | 142 | 15 | 718 |
| නුවරඑළිය | 338 | 60 | 28 | 23 | 449 |
| මාතලේ | 1,840 | 844 | 378 | 1 | 3,063 |
| කුරුණෑගල | 1,348 | 295 | 548 | 16 | 2,207 |
| පුත්තලම | 867 | 173 | 323 | 50 | 1,413 |
| අනුරාධපුරය | 6,422 | 1,586 | 829 | 14 | 8,851 |
| පොළොන්නරුව | 405 | 52 | 10 | - | 467 |
| අම්පාර | 2,736 | 162 | 170 | 5 | 3,073 |
| ත්‍රිකුණාමලය | 91 | 1 | 3 | - | 95 |
| මඩකලපුව | 700 | 51 | 1 | 4 | 756 |
| බදුල්ල | 2,253 | 281 | 1,275 | 70 | 3,879 |
| මොනරාගල | 1,383 | 170 | 127 | 1 | 1,681 |
| වව්නියාව | 219 | 40 | 3 | - | 262 |
| කිලිනොච්චිය | 33 | 8 | - | - | 41 |
| මන්නාරම | - | - | - | - | - |
| මුලතිව් | 13 | 19 | 5 | - | 37 |
| යාපනය | 1,203 | 26 | 30 | 37 | 1,296 |
| එකතුව | 30,753 | 5,826 | 6,622 | 683 | 43,889 |

**2014 වර්ෂයට අදාළ මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

**විකුණුම් ආදායම - රු.මිලියන 1,042**

**වෙනත් ආදායම - රු.මිලියන 55**

**පොහොර ආනයනය - රු.මිලියන 5,987**

**බදු පෙර ශුද්ධ ලාභය - රු.මිලියන 209**

## *7.14 සි/ස ලංකා පෝස්පේට් සමාගම.*

පූර්ණ රාජ්‍ය සමාගමක් වන සි/ස ලංකා පෝස්පේට් සමාගම ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සමාගමේ නිෂ්පාදන ඉපයීම් මගින් උපයාගන්නා ආයතනයකි. 2014 වර්ෂය තුලදී භෞතික සම්පත් සංවර්ධනය ඇතුළු සංවර්ධනය ව්‍යාපෘතින් කිහිපයක් ක්‍රියාත්මක කල අතර, ඒ යටතේ ප්‍රධාන ව්‍යාපෘතින් 05 ක් ක්‍රියාවට නංවන ලදි.

**01. ආයතනයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය, කාණු පද්ධතිය හා ජලාප්‍රවාහන පද්ධතිය සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය.**

සමාගමේ නිෂ්පාදන කටයුතු වඩාත් කාර්යක්‍ෂම හා ඵලදායිව ඉහල මට්ටමකින් පවත්වා ගැනිමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි. එහිදි මාර්ග පද්ධතිය නවීකරණය කරමින් අභ්‍යන්තර ප්‍රවාහන කටයුතු කාර්යක්‍ෂම කිරිම, රථ ගාල් ඉදිකිරිම හා ඛණිජ සම්පත සුරක්‍ෂිත වන පරිදි අභ්‍යන්තර ජලාප්‍රවාහන කාණු පද්ධතිය සැකසිම හා පරිසර හිතකාමී පසුබිමක් ගොඩනැගිම මෙම ව්‍යාපෘතිය මගින් ක්‍රියාවට නංවන ලද අතර ඒ සඳහා ආයෝජනය කල මුදල රුපියල් මිලියන 61 කි.

**02. ගබඩා පහසුකම් සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය.**

රුපියල් මිලියන 43 ක ආයෝජනයක් මගින් ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය යටතේ වර්ග අඩි 11,000 ක ගබඩා සංකිර්ණයක් ඉදිකරන ලදි.

**03. නිෂ්පාදන කටයුතු සඳහා නව ක්‍රෂර් යන්ත්‍රයක් සවිකිරිම හා නව යන්ත්‍රාගාරයක් ඉදිකිරිම.**

මෙම ව්‍යාපාතිය සඳහා ආයෝජනය කල මුදල රුපියල් මිලියන 38 ක් වන අතර මේ යටතේ නිෂ්පාදන කාර්යක්‍ෂම වර්ධනය කිරිම ප්‍රධාන අරමුණ විය.

**04. වාර්ෂික නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා නව මිල් යන්ත්‍රයක් සවි කිරීම.**

දැනට ආයතනය සතු නිෂ්පාදනය සඳහා උපයෝගි කර ගන්නා මිල් යන්ත්‍ර 03ක් ඇත. එනම්,

**Raymond Roller Mill 05 යන්ත්‍ර 02ක්**
**TGM 160 Roller Mill 06 යන්ත්‍ර 01ක්**

වශයෙනි. එම Roller Mill වලින් 01ක් වසර 20කට වඩා පැරණි වන අතර අනෙක් Roller Mill යන්ත්‍රය අවුරුදු 14කට වඩා පැරණිය. එබැවින් මෙම මිල් යන්ත්‍ර නිරන්තරයෙන් අළුත්වැඩියා කිරීමට සිදුවී ඇත. නිරන්තරයෙන් අළුත්වැඩියා කටයුතු සිදු කෙරෙන හෙයින් මිල් යන්ත්‍රවල ක්‍රියාකාරීත්වය නැවැත්වීමට සිදු වීමෙන් දෛනික නිෂ්පාදන කටයුතු සිදු කිරීමට නොහැකි වීමෙන් බලාපොරොත්තු වන නිෂ්පාදනය සපුරා ගැනීමට හැකියාවක් නොමැත. අප ආයතනය නිපදවන එප්පාවල රොක් පොස්පේට් ERP ප්‍රධාන වශයෙන්ම වැවිලි ක්ෂේත්‍රයේ තේ, පොල්, රබර් සහ පොල් වගාවන්ගේ පෝෂණයට අවශ්‍ය පොස්පේට් ලබා දීම සිදු කරයි. ලංකාවට අවශ්‍ය රොක් පොස්පේට් අවශ්‍යතාවය සපුරාලීම සඳහා රොක් පොස්පේට් නිෂ්පාදනය කිරීමේ භාරදූර වගකීම අප ආයතනය සතුව ඇති හෙයින් නව මිල් යන්ත්‍රයක් සවි කර නිෂ්පාදනය අඛණ්ඩව සිදු කිරීමට කළමනාකාරීත්වය තිරණය කර ඇත. ඒ අනුව නිෂ්පාදන කාර්යක්‍ෂමතාව හා ගුණාත්මකතාව වර්ධනය කරමින් නිෂ්පාදන ධාරිතාව

ඉහල නැංවීමේ අරමුණින් ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 20ක් ආයෝජනය කර ඇත.

## 05. නිෂ්පාදන අංශයේ පොදු පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය

අප ආයතනය වසර 40 කට ආසන්න ඉතිහාසයක් ඇති ආයතනයකි. එම කාලය තුල නිෂ්පාදනාගාරයෙහි අළුත්වැඩියා කටයුතු සුළු පරිමාණයෙන් සිදු වු නමුත් එලදියී ලෙස සංවර්ධනයක් හෝ අළුත්වැඩියාවන් සිදු නොකරන ලදි. නිෂ්පාදනාගාරයේ වහලය හා ගොඩනැගිල්ල දිරාපත් වී සේවකයින්ගේ ජීවිත ආරක්‍ෂාව සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයකට මුහුණ පැමට සිදු වීම නිසා ආයතනයේ ප්‍රධානතම කාර්ය වන නිෂ්පාදනය සඳහා සේවකයින් යෙදවීමේදී ඔවුනට අනතුරු සිදු වීමේ ප්‍රවණතාව වැලැක්වීමටත්, සේවකයින්ගේ ජීවිත ආරක්‍ෂාව සම්බන්ධයෙන් වගකීමෙන් කටයුතු කල යුතු නිසාත් මේ සඳහා ප්‍රමුඛත්වය දී කටයුතු කරන ලදි. තවද නිෂ්පාදන කටයුතු කරගෙන යාමේදී අත්‍යවශ්‍ය පොදු පහසුකම් ප්‍රමාණවත් මට්ටමකට නොමැති වීම නිසා නිෂ්පාදන කටයුතු කාර්යක්‍ෂමව පවත්වා ගෙන යාමේ ගැටළුකාරී තත්ත්වය දිගු කලක සිට පැවතීම හේතුවෙන් ඊට විසඳුමක් වශයෙන් රු.මි. 36 ක ආයෝජනය කොට නිෂ්පාදන කටයුතු වලට අත්‍යවශ්‍ය පොදු පහසුකම් සංවර්ධනයට පියවර ගන්නා ලදි.

# ස්තූතියි